# සිංහල

# 3

## මූලික පිරිවෙන

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

ප්‍රථම මුද්‍රණය - 2013
දෙවන මුද්‍රණය - 2014
තෙවන මුද්‍රණය - 2016
සිව්වන මුද්‍රණය - 2017
පස්වන මුද්‍රණය - 2018
හයවන මුද්‍රණය - 2019
සත්වන මුද්‍රණය - 2020

සියලු හිමිකම් ඇවිරිණි.

ISBN 978-955-25-0441-9

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
නුගේගොඩ, ගංගොඩවිල, උඩහමුල්ල දුම්රියපළ පාර, නො. 44 දරන
ස්ථානයෙහි පිහිටි නියෝ ග්‍රැෆික්ස් (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.

Published by: Educational Publications Department
Printed by: Neo Graphics (Pvt) Ltd

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා - ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති - අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ - අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ - අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

ආනන්ද සමරකෝන්

# පෙරවදන

සියවස් ගණනාවක කීර්තිමත් ඉතිහාසයකට උරුමකම් කියන්නා වූ පිරිවෙන් අධ්‍යාපන සම්ප්‍රදාය වූ කලී සිරිලක අධ්‍යාපනයේ ස්වර්ණමය සලකුණකි. මහින්දාගමනයත් සමඟින් වඩාත් ශිෂ්ට සම්පන්න සංස්කෘතියක් වෙත අප ගමන් කළේ සුවිශේෂ වූ ශාස්ත්‍රීය දියුණුවක් ද අත්පත් කරගනිමිනි. එහිදී භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වණක් පිරිස වෙතම ප්‍රභාෂ්වර ශාස්ත්‍රාලෝකය දායාද කළ ප්‍රදීපස්තම්භය වූයේ පිරිවෙනයි.

අපේ සම්භාව්‍ය පිරිවෙන් අධ්‍යාපනය, ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය වෙනුවෙන් කැපවන සුපසන් යතිපරපුරක් නිර්මාණය කරන අතර සම්භාව්‍ය භාෂා මෙන්ම අනේක ශිල්ප ශාස්ත්‍ර පිරිසිඳ දත් වියතුන් ලොවට දායාද කිරීමෙහිලා මූලික වූ බැව් සිහිපත් කළ යුතු ය. එසේම මෙරට විවිධ උවදුරු පිරි අඳුරු සමයන්හි පිරිහී ගිය පිරිවෙන් අධ්‍යාපනය යළි නඟා සිටුවීමට දිවිහිමියෙන් ඇප කැප වූ, වැලිවිට අසරණ සරණ සරණංකර සඟරජ මාහිමිපාණන්ගේ අපරිමිත සේවාව ද කෘතවේදීත්වයෙන් යුතුව මේ මොහොතේ  සිහිපත් කළ යුතු ය.

අතීත සම්භාවනීය අධ්‍යාපන උරුමය ද එකලෙසින් සුරකිමින් නව ලොවට අනුගත වූ පිරිවෙන් විද්‍යස්ථාන නිර්මාණය කිරීමේ කාර්යය වෙත අපි සැම අවතීර්ණ වී සිටින්නෙමු. විශ්ව ගම්මානයෙහි හුදකලා නොවී වර්තමාන පිරිවෙන් ශිෂ්‍ය ගණයා දැනුම,  කුසලතා හා ආකල්ප වර්ධනය කරගනිමින් අධ්‍යාපන සයුරෙහි කිමිදෙමින් සිටිනු දැකීම සන්තුෂ්ටිය උපදවන්නකි. විවිධ ගැටලු හේතුවෙන් විධිමත් පාසල් පද්ධතියෙන් බැහැර වූ ඇතැම් සිසුන් ද යළි පිරිවෙන් විදුබිම් වෙත පැමිණ ස්වකීය දිවිමඟ යළි එළිය කරගත් අවස්ථා සඳහා නිදසුන් අපමණ බව සඳහන් කළ යුතු ය. සැමට අධ්‍යාපනය ලබාදීමේ උත්කෘෂ්ට කර්තව්‍යය වෙනුවෙන් පිරිවෙන් විද්‍යස්ථාන ද ඇප කැප වී සිටින බවට එය කදිම සාක්ෂ්‍යයකි.

මෙම පොත් මැනවින් පරිශීලනය කරමින් ඒ ඔස්සේ නව තවත් පුළුල් දැනුම් අවකාශ පිරි ඉසව් වෙත පිවිසෙන්නට ද ඔබ සැමට ඇරයුම් කරමි. මනා ඉගෙනුමක් ලැබූ හා ආධ්‍යාත්මික සුවපත් භාවයෙන් පිරිපුන් සුපසන් සිසු පරපුරක් බිහිවනු දැකීම රජයේ ඒකායන අරමුණයි. ඒ සඳහා ඇප කැපවන්නට හැකිවේවායි සියලු දෙනා වෙත ආශීර්වාද කරමි. මේ සත්කාර්යය වෙනුවෙන් නොමසුරු දායකත්වයක් සැපයූ සියලු පිරිවර වෙත ද මාගේ ප්‍රණාමය පුද කර සිටිමි.

**පී. එන්. අයිලප්පෙරුම**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල

නියාමනය හා අධීක්ෂණය :-

පී. එන්. අයිලප්පෙරුම - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

මෙහෙයවීම :-

පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි - අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

ඩබ්ලිව්. ඒ. නිර්මලා පියසීලි - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

සම්බන්ධීකරණය :-

පූජ්‍ය රංවල පඤ්ඤාවාස හිමි - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
(පිරිවෙන් සම්බන්ධීකරණ)
අධ්‍යාපන අමාත්‍යාංශය

ඩී. එම්. ජේ. පුෂ්පකුමාර - නියෝජ්‍ය කොමසාරිස් (පාලන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

උපදේශක මණ්ඩලය :-

මහාචාර්ය විමල් ජී. බලගල්ලේ - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
නුගේගොඩ

මහාචාර්ය රත්න විජේතුංග - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
නුගේගොඩ

මහාචාර්ය ආනන්ද අබේසිරිවර්ධන - සිංහල අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

**ලේඛක මණ්ඩලය :-**

| | | |
|---|---|---|
| ආර්. කේ. හීන්බණ්ඩා (සභාපති) | - | ගුරු උපදේශක - (පිරිවෙන්) (විශ්‍රාමික)<br>කළු / නාලන්දා විද්‍යායතන පිරිවෙන<br>කුඩා උඩුව<br>හොරණ |
| පූජ්‍ය කුඩගම සුමංගල හිමි | - | ගුරු උපදේශක (පිරිවෙන්)<br>ගම් / ත්‍රිපිටකෝදය මහ පිරිවෙන<br>නාපාගොඩ<br>නිවිටඹුව |
| එච්. එල්. එස්. අභයසිංහ | - | කථිකාචාර්ය (විශ්‍රාමික)<br>පිරිවෙන් ගුරු අභ්‍යාස විද්‍යාලය<br>සීතාවකපුර<br>අවිස්සාවේල්ල |
| කේ. එම්. අබේවර්ධන | - | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>අධ්‍යාපන අමාත්‍යංශය |

**සංස්කරණය :-**

| | | |
|---|---|---|
| එන්. එන්. ප්‍රේමසිරි | - | ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය<br>සිංහල භාෂා අධ්‍යයන අංශය<br>කොළඹ විශ්වවිද්‍යාලය |

**සෝදුපත් කියවීම :-**

| | | |
|---|---|---|
| චන්ද්‍රලතා ලියනගේ | - | විදුහල්පතිනි (විශ්‍රාමික)<br>ගුරු විද්‍යාලය<br>මහරගම |

**පිට කවරය :-**

| | | |
|---|---|---|
| කේ. පී. ජනිත් හර්ෂාන් සිල්වා | - | පරිගණක අංශය<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**පරිගණක තාක්ෂණය :-**

| | | |
|---|---|---|
| කේ. පී. ජනිත් හර්ෂාන් සිල්වා | - | පරිගණක අංශය<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

# පටුන


| | | |
|---|---|---|
| 01 | අක්ෂර මාලාව | 01 |
| 02 | ලිංග, සමාස, සන්ධි, තද්ධිත, කෘදන්ත | 19 |
| 03 | අඛ්‍යාත විභක්ති ප්‍රත්‍ය හා නාම විභක්ති ප්‍රත්‍යය | 55 |
| 04 | ආඛ්‍යාත පද | 71 |
| 05 | නෛපාතික කෘදන්ත | 83 |
| 06 | අව්‍යය පද | 87 |
| 07 | වාක්‍ය නිර්මාණය | 95 |
| 08 | සාම්ප්‍රදායික යෙදුම් | 106 |
| 09 | රචනය | 112 |
| 10 | අර්ථාවබෝධය | 120 |
| 11 | සාරාංශය | 129 |
| 12 | ප්‍රායෝගික ලේඛන | 134 |
| 13 | විරාම ලක්ෂණ | 148 |
| 14 | රසාස්වාදය | 153 |

# 01. අක්ෂර මාලාව

## අක්ෂර ප්‍රභේද

**වර්ගාන්තාක්ෂර, ඝෝෂ, අඝෝෂ,**
**අන්තඃස්ථාක්ෂර, ඌෂ්මාක්ෂර,**
**සඤ්ඤකාක්ෂර, අක්ෂර උත්පත්ති ස්ථාන**

## අක්ෂර වින්‍යාසය

**න, ණ, ල, ළ**

### සිංහල අක්ෂර මාලාව

මිනිසාගේ විශිෂ්ටතම නිර්මාණය භාෂාව යි. අදහස් හා හැඟීම් සන්නිවේදනය සඳහා බිහි වූ භාෂාව පශ්චාත් කාලීනව භාෂණය හා ලේඛනය වශයෙන් විභේදනය විය. භාෂණයේදී ශ්‍රැතිගෝචර ශබ්ද ලේඛනයේදී දෘෂ්ටිගෝචර සංකේත බවට පෙරළේ. සිංහල ජන කොට්ඨාසය නගන ශබ්ද සිංහල වර්ණ මාලාවෙන් සංකේතවත් වේ. එහෙත් සිංහලයා වහරන සියලු ම ශබ්ද වර්ණමාලාවෙන් සංකේතවත් වෙති යි එයින් අදහස් නොකෙරේ. භාෂාවේ අරපිරිමැස්ම සඳහා (Economy of the Language) ඇතැම් ශබ්දවලට සංකේත භාවිත නොවේ.

සිංහල ලේඛනයේදී භාවිත කෙරෙන සංකේත සමුදාය සිංහල අක්ෂර මාලාව ලෙසින් හැඳින්වේ. දැනට විද්‍යමාන ලේඛනගත සාක්ෂ්‍ය අනුව සිංහල වර්ණ මාලාවේ ප්‍රභවය ක්‍රිස්තු පූර්ව තෙවැනි සියවස දක්වා දිවයයි.

''මහරජ ගමිණි උති''

ක්‍රි:පූ: තුන්වන සියවසට අයත් දැනට ඉපැරණි ම ලේඛනය ලෙස සැලකෙන මෙම ලිපිය දේවානම්පියතිස්ස රජුගේ සොහොයුරු උත්තිය රජුගේ පාලන කාලයට අයත් යැ යි පුරාවිද්‍යාඥයෝත් ඉතිහාසඥයෝත් අනුමාන කරති. සිංහලයේ භාෂණ සම්ප්‍රදායට මෙන් ම ලේඛන සම්ප්‍රදායට ද දීර්ඝ ඉතිහාසයක් ඇති බව මෙයින් ස්ඵුට වෙයි.

දැනට විද්‍යමාන ඉපැරණි ම සිංහල ව්‍යාකරණ මූලාශ්‍රය දහතුන් වන සියවසේ ලියැවුණු සිදත් සඟරාවයි. එහි වර්ණ මාලාව ශබ්ද 30කින් පරිමිත වේ.

''පණකුරු පසෙක් එද - ලුහුගුරු බෙයින් දස වේ
ගතකුරු ද වේ විස්සෙක් - වහරට යුහු සියබසැ''
අ ආ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ මේ දස පණකුරු නම්
ක ග ජ ට ඩ ණ ත ද න ප බ ම ය ර ල ව
ස හ ළ (අ)ං මේ විසි ගතකුරු නම්''

(සිදත් සඟරාව)

එහෙත් මේ වර්ණමාලාව සම්භාව්‍ය ගද්‍ය කාව්‍ය රැසක් ලියැවුණු දඹදෙණි යුගයෙහි ගද්‍ය කාව්‍ය ලේඛකයාගේ වර්ණමාලාව නොවූ බව පැහැදිලි වේ. ගද්‍ය කාව්‍යයන්හි උපයුක්ත වර්ණ මාලාව සිදත් සඟරාව දැක්වූ වර්ණ මාලාවට වඩා විස්තෘත එකකැ යි පිළිගැනීමට අදාළ සාක්ෂ්‍ය ක්‍රි:ව: නව වන සියවස පමණේදී ලියවුණු දම්පියා අටුවා ගැටපදයෙහි පවා විද්‍යමාන වේ. පශ්චාත් කාලීන සිංහල ගද්‍ය කාව්‍ය ලේඛකයාගේ භාෂාව වූයේ ද දම්පියා අටුවා ගැටපදයෙහි උපයුක්ත භාෂාවෙහි ම ක්‍රම විකාශයකි. එහෙයින් දඹදෙණි යුගයේ පූජාවලිය, සද්ධර්මරත්නාවලිය වැනි සාහිත්‍ය නිර්මාණයන්හි උපයුක්ත භාෂාව ඈත යුගයක සිට විධිමත් ව සංවර්ධනය වෙමින් ආ ගද්‍ය කාව්‍ය භාෂාව මැ යි. ඒ අනුව සිදත් සඟරාවේ දැක්වෙන වර්ණමාලාව හා සමකාලීන ගද්‍ය කාව්‍යන්හි උපයුක්ත වර්ණමාලාව අතර පුළුල් දුරස්ථ බවක් පෙන්නුම් කෙරේ.

අදහස් ප්‍රකාශනයෙහි ලා සිදත් සඟරාවේ වර්ණ මාලාව ප්‍රමාණවත් නොවූ හෙයින් ගද්‍ය කාව්‍ය ලේඛකයාගේ භාෂාව ඈත අවධියක සිට ම වෙනස් ආකාරයකින් සංවර්ධනය විය. එහි අක්ෂර සංඛ්‍යාව පනස් හතර (54)කි. සිදත් සඟරා වර්ණ මාලාවට වඩා සංකේත විසි හතර (24)කින් වර්ධනය වී ඇත.

## මිශ්‍ර සිංහල වර්ණ මාලාව

**ස්වර :**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ | උ | ඌ |
| ඍ | ඎ | ඏ | ඐ | එ | ඒ | ඓ | |
| ඔ | ඕ | ඖ | | | | | |

**ව්‍යඤ්ජන :**

| | | | | |
|---|---|---|---|---|
| ක | ඛ | ග | ඝ | ඞ |
| ච | ඡ | ජ | ඣ | ඤ |
| ට | ඨ | ඩ | ඪ | ණ |
| ත | ථ | ද | ධ | න |
| ප | ඵ | බ | භ | ම |
| ය | ර | ල | ව | |
| ශ | ෂ | ස | හ | |
| ළ | | | | |
| (අ)ං | (අ)ඃ | | | |

භාෂාව ප්‍රවාහයක් වැන්න. කාලයාගේ අන්තරයට ඔරොත්තු දෙන ලෙස, භාෂාව සංවර්ධනය වීමේ පශ්චාත් ප්‍රතිඵලයක් ලෙස, නූතන භාෂාවේදීන්ගේ සම්මුතීන් අනුව සංකේත හැට (60)කින් යුක්ත අක්ෂර මාලාවක් හඳුන්වා දී ඇත. ජාතික අධ්‍යාපන ආයතනය මගින් නිකුත් කරන ලද ''සිංහල ලේඛන රීතියෙහි'' අකුරු 60කින් සමන්විත මෙම හෝඩිය දැක්වේ. මිශ්‍ර සිංහල හෝඩියට තවත් අක්ෂර 6ක් ඇතුළු කොට මෙම අක්ෂර මාලාව සකස් කොට ඇත. භාෂාවේ භාවිතයේ තිබූ සඤ්ඤකාක්ෂර වශයෙන් ගැනෙන ඟ, ඦ, ඬ, ඳ, ඹ යන අකුරු පහ ද ෆ අක්ෂරය ද මීට ඇතුළත් ව ඇත.

## නූතන සිංහල අක්ෂර මාලාව

**ස්වර :**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ | උ | ඌ |
| ඍ | ඎ | ඏ | ඐ | එ | ඒ | ඓ | |
| ඔ | ඕ | ඖ | | | | | |

**ව්‍යඤ්ජන :**

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ)ං | (අ)ඃ | | | | |
| ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| ච | ඡ | ජ | ඣ | ඤ | ඦ |
| ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| ත | ථ | ද | ධ | න | ඳ |
| ප | ඵ | බ | භ | ම | ඹ |
| ය | ර | ල | ව | | |
| ශ | ෂ | ස | හ | ළ | ෆ |

මෙම වර්ණ මාලාවෙහි ප්‍රාණාක්ෂර 18කි.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ | උ | ඌ |
| ඍ | ඎ | ඏ | ඐ | එ | ඒ | ඓ | ඔ |
| ඕ | ඖ | | | | | | |

ගාත්‍රාක්ෂර 42 කි.

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ)ං | (අ)ඃ | | | | |
| ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| ච | ඡ | ජ | ඣ | ඤ | ඦ |
| ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| ත | ථ | ද | ධ | න | ඳ |
| ප | ඵ | බ | භ | ම | ඹ |
| ය | ර | ල | ව | | |
| ශ | ෂ | ස | හ | ළ | ෆ |

ස්වර, ව්‍යඤ්ජන වශයෙන් අක්ෂර ප්‍රභේද දෙකක් දක්වා ඇත. ස්වර අක්ෂර ප්‍රාණාක්ෂර, නිශ්‍රයාක්ෂර යන නම්වලින් ද හැඳින්වේ. ගාත්‍රාක්ෂර, ව්‍යඤ්ජනාක්ෂර, නිශ්‍රිතාක්ෂර යන නම්වලින් හැඳින්වෙන්නේ හල් අක්ෂරයෝ ය.

ස්වර ව්‍යඤ්ජන වශයෙන් අක්ෂර වර්ග කිරීමට විද්‍යාත්මක සාධකයක් බලපා ඇත. ස්වර අක්ෂර උච්චාරණය කිරීමේ දී බාධාවකින් තොර ව පහසුවෙන් උච්චාරණය කළ හැකි ය. එහෙත් ව්‍යඤ්ජන අක්ෂර උච්චාරණය කිරීමේදී එම ශබ්දය පිටවෙනුයේ බාධා සහිතව ය. ව්‍යඤ්ජනාක්ෂර උච්චාරණය කළ යුත්තේ ක්, ග්, ච් ආදී වශයෙන් ස්වර රහිත ව ය. උච්චාරණ පහසුව සලකා හෝඩියෙහි දක්වා ඇත්තේ ''අ'' ස්වරය එක් කිරීමෙනි.

## අඝෝෂාක්ෂර හා ඝෝෂාක්ෂර

මේ වර්ග කිරීමට හේතු වන්නේ ශබ්ද උච්චාරණය කිරීමේදී උගුරෙහි පිහිටා ඇති ''ස්වර තන්තුවල'' ක්‍රියාකාරිත්වයයි. අප ආශ්වාස ප්‍රශ්වාස කිරීමේදී හා ශබ්ද නිකුත් කරන විට මේවා ක්‍රියාත්මක වේ. එකිනෙකට සමීප ව පිහිටි මෙම ස්වර තන්තු සමහර ශබ්ද උත්පාදනයේදී එකිනෙකින් ඈත් ව පවතී. එවිට එම විවරය තුළින් පිටවන හඬෙහි විශේෂත්වයක් නිකුත් නොවේ. එසේ නැතහොත් ඝෝෂයක් නූපදී. එම ශබ්ද අඝෝෂ වේ.

එහෙත් සමහර ශබ්ද උත්පාදනයේදී මෙම ස්වර තන්තු එකිනෙකට ළංව ස්පන්දනය වීමෙන් කිසියම් ඝෝෂයක් හෙවත් නින්නාදයක් උපදී. එම ශබ්ද ඝෝෂාක්ෂර වේ. සියලු ස්වර ශබ්ද හා අනිකුත් ව්‍යඤ්ජනාක්ෂර ඝෝෂාක්ෂර වේ.

| අඝෝෂාක්ෂර | | | | ඝෝෂාක්ෂර | | | |
|---|---|---|---|---|---|---|---|
| ක | ඛ | | | අ | → | ඖ තෙක් | |
| ච | ඡ | | | | | | |
| ට | ඨ | | | ග | ඝ | ඞ | ඟ |
| ත | ථ | | | ජ | ඣ | ඤ | ඦ |
| ප | ඵ | | | ඩ | ඪ | ණ | ඬ |
| ශ | ෂ | ස | ෆ | ද | ධ | න | ඳ |
| | | | | බ | භ | ම | ඹ |
| අඃ | | | | ය | ර | ල | ව |
| | | | | හ | ළ | අං | |

## වර්ගාක්ෂර

'ක' අක්ෂරයේ සිට 'ම' අක්ෂරය තෙක් ඇති අක්ෂර විසිපහ (25) වර්ගාක්ෂර ලෙස හැඳින්වේ. ඒ ඒ වර්ගය එම වර්ගයට අයත් මුල් අක්ෂරයේ නාමයෙන් හැඳින්වේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක වර්ගය | - | ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| ච වර්ගය | - | ච | ඡ | ජ | ඣ | ඤ | ඦ |
| ට වර්ගය | - | ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| ත වර්ගය | - | ත | ථ | ද | ධ | න | ඳ |
| ප වර්ගය | - | ප | ඵ | බ | භ | ම | ඹ |

## අන්තඃස්ථාක්ෂර

ස්වර ස්වභාවය හා ව්‍යඤ්ජන ස්වභාවය අතර පිහිටි අකුරු අන්තඃස්ථාක්ෂර නමින් හැඳින්වේ. ය ර ල ව ළ යන අක්ෂර පහ මීට අයත් ය.

| | | |
|---|---|---|
| ඉ | > | ය් |
| ඍ | > | ර් |
| ඏ | > | ල් / ළ් |
| උ | > | ව් |

ඉහත සඳහන් අයුරින් ඉ, ඍ, ඏ, උ යන ස්වර ශබ්ද සමහර ශබ්ද පරිසරයකදී **ය, ර, ල, ළ, ව,** යන ව්‍යඤ්ජනාක්ෂර බවට පෙරළෙන බැවින් ද ඒවා සමහර ශබ්ද පරිසරයකදී පිළිවෙළින් **ඉ, ඍ, ඏ, උ,** බවට පෙරළෙන බැවින් ද අන්තඃස්ථාක්ෂර නමින් හැඳින්වේ.

උදාහරණ :-

ඉ > ය් - නීති + අනුකූල = නීත්‍යනුකූල
ඍ > ර් - කර්තෘ + අර්ථ = කර්ත්‍රර්ථ
ඏ > ල් - ඏ + ආකෘති = ලාකෘති
උ > ව් - අනු + අය = අන්වය

## ඌෂ්මාක්ෂර

ඌෂ්ම යනු උණුසුම යන අරුත පළ කරන වදනකි. අක්ෂර උච්චාරණය කිරීමේ දී උච්චාරණ ඉන්ද්‍රියන් ඒ ඒ අක්ෂරවල ශබ්ද අනුව වෙනස්වීම්වලට බඳුන් වේ. ඌෂ්මාක්ෂර උච්චාරණයේදී පිට වන වායු ධාරාව නිකුත් වනුයේ ඉතා කුඩා ඉඩ ප්‍රමාණයකිනි. එවිට එම වායුව උණුසුම් බවට පත්වීම සාමාන්‍ය ස්වභාවයයි.

(අ)ඃ,ශ, ෂ, ස, හ, ෆ යන අක්ෂර පහ (6) ඌෂ්මාක්ෂර ලෙසින් හැඳින්වේ. එම අක්ෂර පහ උත්පත්ති ස්ථාන පහකට අයත් වේ.

(අ)ඃ = කණ්ඨජාක්ෂරයකි.
ශ = තාලුජාක්ෂරයකි.
ෂ = මූර්ධජාක්ෂරයකි.
ස = දන්තජාක්ෂරයකි.
හ = කණ්ඨජාක්ෂරයකි.
ෆ = දන්තෞෂ්ඨජාක්ෂරයකි.

## සඤ්ඤක අක්ෂර

සඤ්ඤකය ඇති අක්ෂර සඤ්ඤක අක්ෂර නම් වේ. සඤ්ඤකය නම් කුමක් ද යි හඳුනා ගනිමු.

ඟ, ඦ, ඬ, ඳ, ඹ


ඉහත අකුරු පහ සඤ්ඤක අක්ෂර නමින් හැඳින්වේ.









| | | |
|---|---|---|
| ගඞගා | > | ගඟ |
| සඤජය | > | සඦ |
| දණඩ | > | දඬු |
| අනධ | > | අඳ |
| අමබ | > | අඹ |

ඉහත වචන සෑදී ඇති සැටි බලන්න. වර්ගාක්ෂරවල අවසන් අක්ෂරය බැඳි අක්ෂරය වශයෙන් භාවිතව ඇත. එම වචන සිංහල භාෂාවට බිඳී ඒ වෙනුවට සඤ්ඤකය එක්ව ඇත. ඒ අනුව සඤ්ඤකය යනු ඉහත සඳහන් වර්ගාන්තාක්ෂරයන්ගේ නාසික්‍ය අක්ෂර අර්ධයකි.

## අකුරු උපදින ස්ථාන

අකුරු වර්ග කිරීම සඳහා භාවිත කරන එක් සාධකයකි, ඒවා උපදින ස්ථාන. එම ස්ථාන මෙසේ හඳුනා ගනිමු.



| අක්ෂර | උත්පත්ති ස්ථානය | උත්පත්ති ස්ථානයේ පින්තූර | හඳුන්වන නම |
|---|---|---|---|
| අ ආ ක ඛ<br>ග ඝ ඞ ඟ හ<br>(අ)ං (අ)ඃ | උගුර |  | කණ්ඨජ |
| ඉ ඊ ච ඡ ජ ඣ<br>ඤ ඦ ය ශ | තල්ල |  | තාලුජ |
| ඍ ඎ ට ඨ ඩ ඪ<br>ණ ඬ ර ෂ ළ | මුදුන |  | මූර්ධජ |
| ඏ ඐ ත ථ ද ධ<br>න ඳ ල ස | දත් |  | දන්තජ |
| උ ඌ ප ඵ බ භ<br>ම ඹ | තොල් |  | ඕෂ්ඨජ |
| ඇ ඈ<br>එ ඒ ඓ | උගුර<br>සහ<br>යටි තල්ල |  | කණ්ඨතාලුජ |
| ඔ ඕ ඖ | උගුර<br>සහ<br>තොල් |  | කණ්ඨෝෂ්ඨජ |
| ව ෆ | දත් සහ<br>තොල් |  | දන්තෝෂ්ඨජ |

මෙම ඉන්ද්‍රියයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් අක්ෂර උච්චාරණය කර බලන්න.

කණ්ඨජ සහ අහ කවගය වදනින්
තාලුජ සහ ඉය චවගය වදනින්
මූර්ධජ සහ රළ ටවගය වදනින්
දන්තජ සහ ල ස තවගය වදනින්

ඕෂ්ඨජ සහ උඌ පවගය වදනින්
තාලුජ කණ්ඨජ ඒකුරු වදනින්
කණ්ඨජ ඕෂ්ඨජ ඕකුරු වදනින්
දන්තජ ඕෂ්ඨජ වෝකුරු වදනින්

(වදන් කවි පොත)

(ඉහත කවි දෙක වනපොත් කරන්න)

## ක්‍රියාකාරකම 1.1

පහත අකුරු යොදා ගනිමින් වගුව සම්පූර්ණ කරන්න.

හ, ග, ඨ, අ, ශ, ඉ, ඌ, බ, ම, ච, භ, ධ, ඝ, ය, ක, ඓ, ල, ඖ, ච, ඇ, ධ, ෂ, ඊ, ඤ, ආ

| ස්වර | ව්‍යඤ්ජන | ඝෝෂ | අඝෝෂ |
|---|---|---|---|
| | | | |

### ක්‍රියාකාරකම 1.2

මෙම අකුරු අදාළ තැන ස්ථාන ගත කරන්න.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අ | ඉ | ට | ය | ඌ | ණ | ව |
| ය | ඩ | ප | ම | හ | | |
| ල | ර | ශ | ස | ළ | ඇ | |
| බ | ජ | ඍ | ෂ | ය | න | ඝ |

කණ්ඨජ ➤ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _

ඔෂ්ඨජ ➤ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _

දන්තජ ➤ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _

තාලුජ ➤ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _

මූර්ධජ ➤ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _

නාසික්‍ය ➤ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _

**පැවරුම**

01. සිංහල අක්ෂර මාලාව අනුපිළිවෙළට ලියන්න.
02. ස්වර, ඝෝෂ, අඝෝෂ, මහාප්‍රාණ, නාසික්‍ය හා අල්පප්‍රාණ යන ප්‍රභේදවලට අයත් අකුරු ලියා බිත්ති පුවත්පතක ප්‍රදර්ශනය කරන්න.

## අක්ෂර වින්‍යාසය

යම් ජන සමූහයක් සෙසු මිනිස් සංහතියෙන් වෙන් කොට ජාතියක් හැටියට හැඳින්වීමේදී සැලකිල්ලට ගැනෙන ප්‍රධාන ලක්ෂණයකි, ඔවුන්ගේ භාෂාව. අප සිංහලයන් වශයෙන් හැඳින්වීමේදී අපේ භාෂාව මුල් තැන ගනී. කවර ජාතියක වුවත්, ප්‍රධාන සංකේතය ඒ ජාතියට උරුම බසයි. සන්නිවේදනයේ ප්‍රධාන මාධ්‍යය භාෂාවයි. භාෂාවේ ශබ්ද හා ව්‍යාකරණ රීති අර්ථ නිවැරදිව

අවබෝධ වන පරිදි යොදා ගැනීම මෙහිදී අවශ්‍ය වන්නකි. විශේෂයෙන් ම මුද්‍රිත මාධ්‍යයේදී ලේඛන ව්‍යවහාරය සඳහා පිළිගත් සම්මත ක්‍රම නොඉක්මවිය යුතු ය. පද බෙදීම, විරාම ලක්ෂණ භාවිතය ආදිය මෙන් ම අක්ෂර වින්‍යාසය ද අපගේ අවධානයට යොමු විය යුතු ය.

අපේ පරිසරයේ ඇති පහත දැන්වීම් සලකා බලමු.

ලය රෝහල පාර

වණ සංරක්‍ෂණ කාර්‍යාලය

බුද්ද ප්‍රථිමා වහන්සේ
නිරාවරනය කිරීම

දුෂ්ඨි විශේෂඥයෝ

අනදෙන නිළධාරි

වශන්ත උළෙල

ප්‍රශ්ණ පත්‍ර

විමර්ෂණ අංශය

තාක්‍ෂනික කටයුතු

උසස් ප්‍රථිඵල ලබා දෙමි

අපේ ඇසට නිතර ලක්වන දැන්වීම් කීපයකි මේ. මේවා නිවේදන වේ. එම කාර්ය මෙබඳු දැන්වීමකින් ඉටුවෙතත් නැතත් භාෂාමය වශයෙන් එවැනි ප්‍රයෝග සදොස් බව පෙනේ. මේ නිසා සිදු විය හැකි අයහපත් ප්‍රතිඵල දෙකකි. එකක් භාෂා අධ්‍යයනයේ නිරත සිසු දරුවන් එවැනි සදොස් භාෂා ප්‍රයෝග භාවිතයට නැඹුරු වීම ය. අනෙක එවැනි සාවද්‍ය භාෂා ප්‍රයෝග භාෂාවේ සම්මත රීතීන්ට පටහැනි වීම යි.

විද්‍යුත් හා මුද්‍රිත සන්නිවේදන මාධ්‍යයන්හි මෙබඳු සාවද්‍ය භාෂා ප්‍රයෝග සුලභ ව දක්නට ලැබේ. භාෂා භාවිතයේදී විශේෂයෙන් ම ලේඛනයේ භාෂා රීතීන්ට අනුව අක්ෂර වින්‍යාසය හසුරුවාලීම කාගේත් වගකීම විය යුතුය. පරිත්‍රාණ ධර්ම දේශනයකදී එහි ගුණ නොඅඩුව ලැබෙන්නට නම් නිවැරදි හා නිරවුල් උච්චාරණය පැවතිය යුතු බව පිළිගත් සම්මතයකි.

මෙහිදී අපි ණ, න, ළ, ල වින්‍යාසය පිළිබඳ අවධානය යොමු කරමු.

## ණ, න, භාවිතය

❖ මෙම වාක්‍ය බලන්න

ඇස කණ මිනිසා බත් කන සැටි බලන්න.

මෙහිදී ''කණ'' යන පදයෙන් ඇස් නොපෙනන යන අරුත දේ. ''කන'' යන පදයෙන් බුදින යන අර්ථය දෙයි. මින් පැහැදිලි වන්නේ, අකුරු ගැළපෙන ආකාරය අනුව අර්ථය වෙනස් විය හැකි බවයි.

- වචන ආරම්භයේ ''ණ'' යෙදෙන පද වත්මන් වහරෙහි දක්නට ඇත්තේ එකක් පමණි.

  උදා:- ණය- සමූපකාර ණය දෙන බැංකුව
  අනුන්ට ණය ගැති නොවී.

- වචනයක අවසානයෙහි ''ණ'' (හල් ''ණ'' කාරය) යෙදෙන්නේ ද නැත.

  උදා:- දර්ශනීය වෙසක් තොරන්
  රන් රිදී මුතු මැණික්

- ''ට'', ''ඩ'', ''ඨ'' යන අකුරුවලට මුලින් යෙදෙන්නේ ''ණ'' කාරයයි.

  උදා:- ඝණ්ටා නාදය
  කණ්ටක චෛත්‍යය
  සාහිත්‍ය මණ්ඩලය
  චණ්ඩාල ස්ත්‍රිය
  අය්යණ්ඩි බිය නොවන්න
  පාණ්ඩු රෝගය
  ඒදණ්ඩෙන් එගොඩ වී
  කණ්ඨජ අක්ෂර

- "ර" ශබ්දයට පසුවද යෙදෙන්නේ "ණ" කාරයයි.

    උදා:- ස්වර්ණ ජයන්තිය
    ව්‍යාකරණ විවරණය
    පරිණත බුද්ධිය
    කරුණාවන්ත තරුණයෙක්
    භක්ති ප්‍රණාමය
    සාහිත්‍ය සම්මන්ත්‍රණය
    මුද්‍රණ ශිල්පය

ඉහත සඳහන් රටාවලට අනුකූල නොවන අවස්ථා කීපයක් ද ලේඛනයෙහි දක්නට ලැබේ. පහත උදාහරණ විමසා බලන්න.

- හඳට බුරන බල්ලෝ
- කුලියට කරන වැඩ
- පුෂ්ප මකරන්දය

- "ණ" යෙදෙන තවත් රටාවක් බලමු. මූර්ධජ "ෂ" අක්ෂරයට පසුව යෙදෙන්නේ මූර්ධජ "ණ" කාරය වේ.

    උදා:- භව තෘෂ්ණාව
    දූෂණ ගවේෂණ
    මධුභාෂිණිය
    පාෂාණ යුගය

- ගෞරවාර්ථය දීම පිණිස යොදනු ලබන ආණ, අණු, අණි, ණ්ඩ, ණ්ඩි යන තද්ධිත ප්‍රත්‍යවල "ණ" කාරය යෙදේ.

    උදා:- පියාණෝ සතුටු කඳුළු හෙළති.
    පුතණුවන් කැඳවන්න.
    පෙම්බර මෑණියනි,
    දයාබර මලණ්ඩ,
    මාමණ්ඩි සමීපයට,
    මාගේ පුතණ්ඩ,

❍ අතීත ක්‍රියා පදවල යොදන්නේ "ණ" කාරය වේ.

උදා:- සඳ නැගිණ./ නැගිණි. /නැගුණේ ය.

ඇත්තු මඩේ එරුණහ/ එරුණෝ ය.

පිරුණු හදක්

නිවුණු පහන

**ක්‍රියාකාරකම 1.3**

නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.

1. කට දන/ දණ සම්බෝලයක්
2. දණ/ දන ගාන ළමයා
3. වැඩ කරන/කරණ ජනතාව
4. පින් දෙණ/දෙන ගාථාව
5. බුදුන් සරණ/සරන ගිය අය
6. මහණ/මහන දම් පිරුවෙක්
7. උෂ්ණ/උෂ්න කාලය
8. ඇඟ නිවන/නිවණ කසායක්
9. මරන/මරණ ගෙදරක්
10. රජය දරණ/දරන වියදම්
11. ප්‍රශ්ණ/ප්‍රශ්න පත්‍රය
12. කුවේණි යක්ෂනිය/යක්ෂණිය
13. විෂ්නු/විෂ්ණු දෙවියෝ
14. නම් දරණ/දරන ලේඛකයෙක්
15. තරුණ/තරුන පරපුර
16. දරුණු/දරුනු නියඟය
17. ප්‍රණීත/ප්‍රනීත ආහාර පාන
18. නාරන්/නාරණ් ගෙඩිය
19. විෂ උරණ/උරන බෙහෙතක්
20. ගුරුතුමාණන්ගේ/ගුරුතුමානන්ගේ උපදෙස්
21. නැණ නුවන/නුවණ
22. පෙර පර වනන්/වණන්
23. වතුර කල/කළ උකුළට ගත් කළ/කල
24. පොර කණ/කන බල්ලෝ
25. කණ/කන කොක් සුද

## ''ළ'' යෙදීම

''ළ'' කාර යෝගය පිළිබඳව ඉදිරිපත් කළ හැකි රටා කීපයක් පහත දැක්වේ.

- වචනයක ආරම්භයේ ''ළ'' යෙදෙන වචන කීපයක් පහත දැක්වේ.

උදා:- ළපටි අදහස්
ළදරු පාසල
ළාබාල දැරියක්
ළබැඳි මිතුරෙක්
සැලෙන ළපලු
ළමා සාරිය
ළඟපාත ගෙයක්
බසට ළැදි අය
කනට ළං කොට
ළිඳ ළඟදී

- ''ර'' කාරයෙන් අවසන් වන ධාතු ප්‍රකෘතීන්හි අතීත කෘදන්ත රූප සඳහා ද ''ළ'' යෙදේ.

| ක්‍රියා ප්‍රකෘතිය | ක්‍රියාව I | ක්‍රියාව II |
|---|---|---|
| කර | ඔහු වැඩ කළේය. | ඔහු කළ වැඩ |
| වපුර | ගොවියා වී වපුළේය. | ගොවියා වපුළ වී |
| හදාර | මම පොත් හදාළෙමි. | මා හදාළ පොත් |
| මර | ඔහු දුකින් මළේය. | දුකින් මළ ඔහු |
| වදාර | බුදුහු දහම් වදාළහ. | බුදුන් වදළ දහම් |

- බොහෝවිට ''පිළි'' යන්න මුලට යොදන පදවල ''ළි'' යෙදෙයි.

උදා:- පිළිබිඹු - දහමින් පිළිබිඹු වන සමාජය
පිළිවෙත් - පිළිවෙත් රකින භික්ෂූන්
පිළිබඳ - දහම පිළිබඳ පොතක්
පිළිමය - සමාධි බුදු පිළිමය
පිළිසිඳ - මව් කුස පිළිසිඳ ගත් වේලෙහි

පිළිකා - පිළිකා රෝහල
පිළිපැදිය - පිළිපැදිය යුතු සිරිත් විරිත්
පිළිගැනීම - නාහිමි සාදරයෙන් පිළිගැනීම
පිළිකුල් - පිළිකුල් භාවනාව
පිළිස්සුණු - පිළිස්සුණු අතු

- සිංහලයේ වත්මන් ව්‍යවහාරයෙහි කිසිදු වචනයක "ළ්" අකුර නොයෙදේ.

- "ළ" අක්ෂර දෙකක් එක ළඟ නොයෙදේ.

- ල, ළ එක්ව ළඟ යෙදෙන තැන්වල බොහෝ විට පළමුවෙන් යෙදෙන්නේ "ළ" කාරයයි.
  උදා:- සළෙලු, උළෙල, වළලු, පළල, කෙළිලි, බිළාල, පිළිල, නළල

## ක්‍රියාකාරකම 1.4

පහත දැක්වෙන වචනවලින් නිවැරදි වචනය තෝරා ලියන්න.

1. රුධිර - (සංසරණය/සංශරණය/සංෂරණය)
2. බුද්ධ - (සාසනය/ශාසනය/සාශනය)
3. (උට්ටාන/උට්ඨාන/උට්ඨාණ) - වීර්යය
4. (සංගයා/ශංඝයා/සංඝයා) - වහන්සේ
5. චතුර - (කතිකයා/කථිකයා/ඛතිකයා)
6. පිරිත් - (සජ්ඣායනාව/සජ්ජායනාව/සඣ්ජායනාව)
7. (බෝධීන්/බෝදිං/භෝදීන්) - වහන්සේ
8. (විශිෂ්ට/විශිෂ්ඨ/විෂිශ්ට) - සම්මාන
9. (දෘෂ්ඨි/දෘශ්ටි/දෘෂ්ටි) - කෝණය
10. (පුස්තකාල/පුස්ථකාල/පුශ්තකාල) - පොත්

## ක්‍රියාකාරකම 1.5

වරහන් තුළ ඇති නිසි අකුර තෝරා පහත වචන සම්පූර්ණ කරන්න.

1. ය___ර්ථය (තා/ථා)
2. පරි___ණකය (ඝ/ග)
3. අනාථ පි___ඩික (ණ්/න්)
4. පරි___ත බුද්ධිය (ණ/න)
5. මධුහා___ණිය (ශි/ෂි)
6. ___මක ගති (ලා/ළා)
7. ___න්ගතු බව (ලෙ/ළෙ)
8. තීක්___ණ බුද්ධිය (ෂ/ශ)
9. බෞද්ධ ශිෂ්___චාරය (ටා/ඨා)
10. කා___ගුණ (ළ/ල)

# 02. ලිංග, සමාස, සන්ධි, තද්ධිත, කෘදන්ත

## ලිංග භේදය

දැනට විද්‍යාමාන ඉපැරණි ම සිංහල ව්‍යාකරණ ග්‍රන්ථය 13 වැනි සියවසයේ දී ලියැවුණු සිදත් සඟරාව ලෙස පිළිගැනේ. නාම පදයන්ගේ ලිංගභේදය පිළිබඳව දක්වන සිදත් සඟරාව, සජාතීය භාෂාවන්හි එනම් සංස්කෘත, පාලි භාෂාවන්හි නාම පදයන්ගේ ලිංග භේදය තෙවැදෑරුම් වුවත්, සිංහලයේ ඇත්තේ ලිංග භේදය පිළිබඳ ප්‍රභේද දෙකක් පමණ කැ යි අවධාරණය කරයි.

''මෙය මෝය යන වහරට කරුණු වූයේ ලිඟු නම්''

යනුවෙන් ''මේ'' යනු පුරුෂ ලිංග නාමපදයක් ලෙසත් ''මෝ'' යනු ස්ත්‍රී ලිංග නාමපදයක් ලෙසත් හැඳින්වේ. සර්වනාම ශබ්දයක් නාම පදයන්ගේ ලිංග භේදය තහවුරු කරන්නට වර නගා දැක්වීම මෙහි දී සිදු වී ඇත. සාමාන්‍ය නාම ප්‍රකෘතියක් වරනගා බැලී නම්, සිංහලයේ ලිංග භේදය තෙවැදෑරුම් බවක් පැහැදිලි වනු ඇත. මෙහිදී ඇත් (පුරුෂ ලිංග) කත් (ස්ත්‍රී ලිංග) අත් (නපුංසක ලිංග) ශබ්ද වරනගා බැලීමේ දී සිංහලයේ නාම පදයන්ගේ ලිංග භේදය පිළිබඳ ප්‍රභේදය ඔබට පැහැදිලි වනු ඇත.

ඇත් ශබ්දය

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථමා විභක්ති | ඇතා | ඇත්තු |
| කර්ම විභක්ති | ඇතා | ඇතුන් |
| ආලපන | ඇතා | ඇතුනි |

## කත් ශබ්දය

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථමා විභක්ති | කත | කත්තු |
| කර්ම විභක්ති | කත | කතුන් |
| ආලපන | කත | කතුනි |

## අත් ශබ්දය

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථමා විභක්ති | අත | අත් |
| කර්ම විභක්ති | අත | අත් |
| කරණ විභක්ති<br>අවධි විභක්ති } | අතින් | අත්වලින් |
| සම්බන්ධ විභක්ති<br>ආධාර විභක්ති } | අතේ | අත්වල |

මෙයින් පැහැදිලි වන්නේ එක් ශබ්ද ගණයක් වැඩි විභක්ති සංඛ්‍යාවක වර නැගෙන බවත්, අනික් ශබ්ද ගණ දෙක විභක්ති තුනක පමණක් වරනැගෙන බවත් ය. ඒවායේ කර්තෘ විභක්තියේ සිට ආධාර විභක්තිය දක්වා වූ විභක්ති රූප සාදා ගනු ලබන්නේ විසින්, කරණකොටගෙන, ට, ගෙන්, ගේ, කෙරෙහි යන විභක්ත්‍යර්ථ සූචක නිපාත ප්‍රයෝග යොදා ගැනීමෙනි.

එහෙත් අනෙක් ශබ්ද ගණය පැහැදිලිව ම වැඩි විභක්ති සංඛ්‍යාවක වර නැගෙයි. එම ශබ්ද ගණයේ නාම පද

ප්‍රථමා
කර්ම
කරණ - අවධි
සම්බන්ධ - ආධාර

යන අර්ථ හයක් අඟවයි.

මෙයින් තහවුරු වන්නේ නාම වරනගා බැලීමේදී සිංහලයේ නාම පදයන්ට, පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග, නපුංසක ලිංග යනුවෙන් ප්‍රභේද තුනක් විද්‍යමාන බව ය.

නාම වරනැගීමේදී සචේතන ශබ්ද එක් අයුරකිනුත්, අචේතන ශබ්ද තවත් අයුරකිනුත්, වරනැගේ. අචේතන ගණයේ ශබ්දයන්ගේ බහු වචන රූපය බොහෝ විට ප්‍රකෘතියෙන් දැක්වේ. එහෙත් මේ වෙනස සිදුවන්නට පෙර සංඛ්‍යා ශබ්දයක් පෙරටුව යෙදීමෙන් ද අචේතන ශබ්ද ගණයේ බහු අර්ථය හඟවනු ලැබේ.

ඒක වචන - දොරින්
බහු වචන - නව දොරින්
ඒක වචන - නෙතින්
බහු වචන - දෙනෙතින්

පසුකාලීන ව මේ ශබ්ද ගණය වරනැගීමේදී තවත් වෙනසක් සිදු විය. එනම් බහු අර්ථය අඟවනු සඳහා ''වල්'' ප්‍රත්‍යය යොදා ගැනීම යි.

ඒක වචන :- ගේ  බහු වචන :- ගෙවල්
ඒක වචන :- අතින්  බහු වචන :- අත්වලින්

මේ අනුව නාම වරනැගීමේ දී සිංහලයේ නාම පද පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග හා නපුංසක ලිංග යනුවෙන් තෙවැදෑරුම් වන බව ගම්‍ය වේ.

## ස්ත්‍රී ලිංග නාම පද නිපදවෙන ආකාරය

**01. අනම්‍ය කරණය**

බමුණු-බැමිණි
බලු-බැලි
උකුසු-ඉකිසි
කුකුළු-කිකිළි
බකුසු-බැකිසි
සොරා-සෙර
කොරා-කෙර

අනම්‍ය යනු,
අ, උ, ඔ යන ස්වර ඇ, ඉ, එ, ස්වර බවට පෙරළීමයි.

**02. ස්ත්‍රී ප්‍රත්‍යය යෝගය**

පුරුෂලිංග නාම පදයේ අගට ආ, ඊ, ඉනි ප්‍රත්‍ය එකතු කිරීමෙන් ස්ත්‍රීලිංග නාම පද නිපදවා ගැනීම.

කෝකිල - කෝකිලා
කුමර - කුමරි
ඇත් - ඇතිනි

**03. ස්ත්‍රී වාචී නාම පදයක් එකතු කිරීම**

කොටියා - කොටිදෙන
සිංහයා - සිංහධේනුව

**04. අමුතුම පදයක් භාවිත කිරීම**

මොනරා - සෙබඩ
අශ්වයා - වෙළඹ
රජ - බිසව

**ක්‍රියාකාරකම 2.1**

පහත වගුව සම්පූර්ණ කරන්න.

| මූලය | පුරුෂලිංග නාමය | ස්ත්‍රීලිංග නාමය |
|---|---|---|
| කවුඩු | | |
| සිංහ | | |
| කොක් | | |
| කොටි | | |
| ඇමති | | |
| උකුසු | | |
| බකුසු | | |
| කුරුලු | | |
| කොවුලු | | |
| කොලු | | |
| ගොවි | | |

ගුණ නාම ලිංගත්‍රයට ම පොදුවේ යෙදේ.

| | | |
|---|---|---|
| රතු මිනිසා | රතු ගැහැනිය | රතු මල |
| කළු ගොනා | කළු දෙන | කළු කබාය |
| උස මිනිසා | උස ගැහැනිය | උස ගස |

## ක්‍රියාකාරකම 2.2

පහත සඳහන් පද්‍යයන්හි ඉරි ඇඳි නාම පදවල ලිංගභේදය දක්වන්න.

සඳලුවල පන්දු
කෙළනා සොඳුරු ළන්දු
රුසිරි නෙත ඇන්දු
සලෙළු සිත් තම වෙතට කැන්දු

තෙමා වැටේ මගෙ සළුපිළි නෙත් පුරවා
අමා රසක් වැනි හිමි සඳ සිහිවෙනවා
දමා කුමරු වැඩියා මට සිහිවෙනවා
මෙමා ඇර ලියෝ ලෙව් තුළ ඇත්ද තවා


පිනිබර යාමේ සැවුළන් හඬලන වා
අම්මා වටකර ළිප ගිනි නැළවෙන වා
කොළඹ රේල්ලුව රජ ගමනක යන වා
නැගිටින් පුතුනේ බිම් මල් හිනැහෙන වා

# සන්ධි

වෙන් ව ඇති පද දෙකක් තනි පදයක් සේ නිසි පරිදි ගළපා ගැනීම ''සන්ධි'' නම් වේ. සන්ධි යනු ශබ්ද සංධානයකි. භාෂාව අලංකාර කර ගැනීම, පද කෙටි කර ගැනීම ආදි ප්‍රයෝජන සන්ධිවලින් අපට ලැබේ.


''පෙර පර වණන් නිසි විදිනි ගළපනු සඳනම්'' යනුවෙන් පූර්ව අපර වර්ණයන් නිසි පරිදි ගැළපීම සන්ධි නම් වේ යැයි සිදත් සඟරාවේ හඳුන්වා දී තිබේ.

පහත සඳහන් රූප සටහන අධ්‍යයනය කරමු.




මෙහිදී සන්ධි වන්නේ අකුරු දෙකක් අතරය. මුලින් ඇති පදය පෙර පදය වශයෙන් හැඳින්වේ.

දෙවැනි පදය පර පදය වශයෙන් හැඳින්වේ. පෙර පදයේ අග ඇති අක්ෂරය පූර්ව වර්ණය (පෙරකුර) නමින් හැඳින්වේ. පර පදයේ මුලින්ම ඇති අකුර පර වර්ණය (පරකුර) නමින් හැඳින්වේ. පෙරකුරත් පරකුරත් ලෝප ආදේශ ආදී සන්ධි කාර්යයන් මගින් නිසි ලෙස ගළපා ගැනීම සන්ධි නම් වේ.
ඉහත රූප සටහනට උදාහරණයක් ගළපමු.




නෙත් සහ අගින් යන පද දෙක නෙතගින් ලෙස තනි පදයක් බවට පත් විය. එහිදී පෙරකුර වූ ''ත්'' යන්නට පරකුර වූ 'අ' එකතු වී නෙතගින් යනුවෙන් සන්ධි විය. මේ ආකාරයට සන්ධි කිරීමේදී සන්ධි කාර්යයේ විවිධත්වයක් දක්නට ඇත.



## ලෝපය




අකුරක් මකා දමයි.

## ආදේශය




අකුරක් වෙනුවට වෙනත් අකුරක් පමුණුවයි.

## ආගම





අමුතුවෙන් ම අකුරක් පමුණුවයි.

## ද්විත්ව රූපය




තනි ශබ්දයක් ශබ්ද දෙකක් බවට පත් කරයි.

කාර්යයන් අනුව සන්ධි දහය වර්ග කරමු.




## 1. ස්වර සන්ධිය

සන්ධි කාර්යයේ ස්වභාවය අනුව ඉතා ම පහසු ම සන්ධිය ස්වර සන්ධිය යි. ලෝප ආදේශාදිය මෙම සන්ධියේ දක්නට නැත. පෙර පදයේ අග අකුර හල් අකුරක් විය යුතු අතර පර පදයේ මුලකුර (පරකුර) ස්වරයක් විය යුතු ය. එහිදී පෙර වර්ණය හා පර වර්ණය එකතු වී මෙම සන්ධිය සෑදේ.

උදා :- I

නිල් + අඹර

ල් + අ = ල

නිලඹර

උදා :- II

මුල් + අසුන

ල් + අ = ල

මුලසුන

## ක්‍රියාකාරකම 2.3

සන්ධි පදය ලියන්න

| | | | | |
|---|---|---|---|---|
| 1. | වම් | + | අත | = |
| 2. | රුවන් | + | ආර | = |
| 3. | දුක් | + | අඳුර | = |
| 4. | අතින් | + | අතට | = |
| 5. | මත් | + | ඇතෙක් | = |
| 6. | පින් | + | ඇති | = |
| 7. | උස් | + | අසුන් | = |
| 8. | සහස් | + | ඇස් | = |
| 9. | නිල් | + | උපුල් | = |
| 10. | සිලිල් | + | ආර | = |

## ක්‍රියාකාරකම 2.4

මේ පද විසන්ධි කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| 1. | ලකඹර | = | | + |
| 2. | මොකැඳුරු | = | | + |

| | | | | |
|---|---|---|---|---|
| 3. ඉනික්බිති | = | | + | |
| 4. සිහිනිඟ | = | | + | |
| 5. උරෙනුර | = | | + | |
| 6. පෙමැති | = | | + | |
| 7. මඟුලැතා | = | | + | |
| 8. පසිඳුරන් | = | | + | |
| 9. පසඟ | = | | + | |
| 10. පසැස් | = | | + | |

## 2. පූර්වස්වර ලෝප සන්ධිය (පෙර සර ලොප් සඳ)

පහත සඳහන් උදාහරණ දෙස විමසුමෙන් බලමු.

| | | | | |
|---|---|---|---|---|
| දකුණු | + | අත | - | විසන්ධිය |
| දකුණ් + උ | + | අත | - | පෙරකුර කුමක් දැ යි සෙවීම |
| දකුණ් + ~~උ~~ | + | අත | - | පෙරකුර (උ ස්වරය) ලොප් කිරීම |
| දකුණ් + අත | | | - | ණ් සහ අ එකතුව ණ වීම |
| දකුණත | | | = | සන්ධි පදය |

පෙරකුර යනු පෙර පදයේ අග ඇති අකුරයි. ඉහත උදාහරණයෙහි පෙර පදය දකුණු යන්නයි. එහි අග ඇති අකුර (ණ්+උ) 'උ' ස්වරයයි.

එය ස්වරයක් නිසා පෙරසර යනුවෙන් හැඳින්වේ. පූර්ව ස්වරය යනු ද කිව හැකිය. අපි ඉහත උදාහරණයේ දී පෙරසර / පූර්වස්වරය ලොප් කෙළෙමු. ඒ නිසා එම සන්ධිය පූර්වස්වර ලෝප සන්ධිය (පෙර පර ලොප් සඳ) නමින් හඳුන්වමු.

## ක්‍රියාකාරකම 2.5

හිස් කොටුවලට අදාළ පදය ලියන්න.

| පෙර පදය | පර පදය | සන්ධි පදය | සන්ධි වීමේදී ලොප් වන පූර්ව ස්වරය |
|---|---|---|---|
| නුවණ | ඇස | ______ | ______ |
| ______ | ______ | නෙදැති | ______ |
| සිය | ඇසින් | ______ | ______ |
| ______ | ______ | පොරණැදුරන් | ______ |
| ______ | ______ | දිවැස් | ______ |
| ______ | ______ | රියැදුරු | ______ |
| ______ | ______ | මැදගිල්ල | ______ |
| යන | එන | ______ | ______ |
| ______ | ______ | විදුරසුන් | ______ |
| සුරු | අත | ______ | ______ |

## 3. පරස්වර ලෝප සන්ධිය (පරසර ලොප් සඳ)

පරපදයේ මුල අකුර පරකුර යි. පර වර්ණය යි. එය ස්වරයක් නම් පරස්වරය නමින් හැඳින්විය හැකි ය. පරස්වරය ලොප් වීමෙන් ගැළපෙන සන්ධිය පරස්වර ලෝප සන්ධියයි.

උදා:-
පුද් + අසුන = විසන්ධිය
පුද් + (අ) සුන = පරස්වරය සෙවීම
පුද් + ~~අ~~ සුන = පරස්වරය ලොප් කිරීම
පුදසුන = සන්ධි පදය

මෙම සන්ධියේදී පරපදයේ මුල අකුර ස්වරයක් විය යුතු ම ය. එය ලොප් වීම මෙහි රීතිය යි.

## ක්‍රියාකාරකම 2.6

හිස් කොටු පුරවන්න.

| පෙර පදය | පර පදය | සන්ධි පදය | ලොප් වූ ස්වරය |
|---|---|---|---|
| | | සුරඟන | |
| | | දොරගුළු | |
| සිය | අතින් | | |
| | | දසතින් | |
| ගන | අඳුර | | |
| | | වහරනුසරෙන් | |
| සදා | ආදරණීය | | |
| | | මැනිතුමා | |
| ගෙන | අවුත් | | |
| | | අනුරුත් | |

## 4. ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය (ගතකුරු ලොප් සඳ)

ලෝප සන්ධි තුනකි. මින් දෙකක් අපි ඉගෙන ගතිමු. තුන් වන ලෝප සන්ධිය ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය යි. සන්ධි වන පද දෙකෙන් පෙර පදයේ අග ඇති පෙරකුර වන ගාත්‍රාක්ෂරය ස්වරයත් සමග ලොප් වී ඉතිරි වන අර්ධ අනුනාසිකායය වෘද්ධි වීමෙන් ගැළපෙන සන්ධිය ගාත්‍රාක්ෂර ලෝප සන්ධියයි.

උදා:- ගඟ + වෙරළ = විසන්ධිය

ග + ( + ග් + අ + වෙරළ = සංයුක්ත ගාත්‍රාක්ෂරයේ ස්වර ව්‍යංජන වෙන් කිරීම

ග + ( + ~~ග්~~ + ~~අ~~ + වෙරළ = ස්වරය සහ ගාත්‍රාක්ෂරය ලොප් කිරීම

ගං + වෙරළ = අර්ධානුනාසිකායය සම්පූර්ණ කිරීම

ගංවෙරළ = සන්ධි පදය

## ක්‍රියාකාරකම 2.7

පහත සඳහන් පද විසන්ධි කොට සන්ධි වන අයුරු පැහැදිලි කරන්න.

1. මංමුළා
2. සුළංපහර
3. ගංවතුර
4. නෙළුම්මල්
5. මුංඇට
6. තම්පලා
7. කොලොම්තොට
8. මිහින්තලය

## 5. ස්වරාදේශ සන්ධිය (සරදෙස් සඳ)

ශබ්ද සංවිධානයේදී එක් ශබ්දයක් හෝ ශබ්ද දෙකක් වෙනුවට වෙනත් ශබ්දයක් පැමිණ වීම ආදේශය බව අපි උගතිමු. එනම් ආදේශ වන්නා වූ ශබ්දය ස්වරයක් නම් එය ස්වරාදේශ වේ. ගාත්‍රාක්ෂරයක් නම් ගාත්‍රාදේශ වේ.

මෙහිදී අපි ස්වරාදේශ සන්ධිය සලකා බලමු.

උදා:- මහ + ඉසුරු = විසන්ධිය

මහ් + අ + ඉසුරු = පූර්වස්වරය වෙන් කිරීම

මහ් + එ + සුරු = ස්වර දෙකක් වෙනුවට වෙනත් ස්වරයක් පැමිණවීම

මහෙසුරු = සන්ධි පදය

මෙහෙසුරු = ස්වර සමරූපත වීම.

## ක්‍රියාකාරකම 2.8

දී ඇති උදාහරණ අනුව පහත වගුව සම්පූර්ණ කරන්න

| විසන්ධිය | සන්ධිය | සන්ධි කාර්යයට බඳුන්වන අක්ෂර දෙක | ආදේශ අක්ෂරය |
|---|---|---|---|
| වට + උර | ______ | ______ | ______ |
| ______ | මොහොර | ______ | ______ |
| මහ ඉඳු | ______ | ______ | ______ |
| ______ | ගජේඳු | ______ | ______ |
| ______ | නරේඳු | ______ | ______ |

## 6. ගාත්‍රාක්ෂරාදේශ සන්ධිය (ගතදෙස් සඳ)

සන්ධි වන පද දෙකින් පර පදයේ මුල අකුරට (පරකුරට) වෙනත් ගතකුරක් ආදේශ වීම ගාත්‍රාක්ෂරාදේශ සන්ධිය යි.

උදා:-

| | | |
|---|---|---|
| කිවි + වර | = | විසන්ධිය |
| කිවි + ව් + අර | = | පරකුර සොයා ගැනීම |
| කිවි + ය් + අර | = | (ව් වෙනුවට ය් ආදේශය) |
| කිවි යර | = | ව්‍යංජනය හා ස්වරය එක්වීම |
| කිවියර | = | සන්ධිය |

## ක්‍රියාකාරකම 2.9

වගුව සම්පූර්ණ කරන්න.

| විසන්ධිය | සන්ධිය | සන්ධි කාර්යයට බඳුන්වන අක්ෂර දෙක | ආදේශ අක්ෂරය |
|---|---|---|---|
| ______ | අඬුවම් | ______ | ______ |
| ගිනි + කම් | ______ | ______ | ______ |
| ______ | පිළියම් | ______ | ______ |
| අඬ + කම් | ______ | ______ | ______ |
| ______ | බිලියම් | ______ | ______ |

## 7. පූර්වරූප සන්ධිය (පෙර රූ සඳ)

පර වර්ණයට පෙර වර්ණයේ රූපය ගැන්වීමෙන් ගැළපෙන සන්ධිය පූර්ව රූප සන්ධියයි.

උදා:- වත් + කම් = විසන්ධිය
වත් + ක් + අම් = පර වර්ණය වෙන් කිරීම
වත් + ත් + අම් = පර වර්ණයට පෙර වර්ණය පැමිණවීම
වත්තම් = සන්ධිය

## 8. පරරූප සන්ධිය (පර රූ සඳ)

පර වර්ණයේ රූපය පෙර වර්ණයට ඇති කිරීමෙන් ගැළපීම මෙම සන්ධියේ රීතියයි.

උදා:- ඇත් + දළ = විසන්ධිය
ඇත් + ද් + අ ළ = පර රූපය වෙන් කිරීම
ඇද් + ද් + දළ = පෙර රූපයට පර රූපය පැමිණවීම
ඇද්දළ = සන්ධි වීම

### ක්‍රියාකාරකම 2.10

වගුව සම්පූර්ණ කරන්න.

| සන්ධි පදය | විසන්ධි පදය | මුලින් තිබූ අකුර | පැමිණ වූ අකුර | සන්ධි නාමය |
|---|---|---|---|---|
| අස්සන | ______ | ______ | ______ | ______ |
| වප්පිහිය | ______ | ______ | ______ | ______ |
| අල්ලස් | ______ | ______ | ______ | ______ |
| සද්දිනක් | ______ | ______ | ______ | ______ |
| දූප්පත් | ______ | ______ | ______ | ______ |
| ගොක්කොළ | ______ | ______ | ______ | ______ |
| ලිග්ගල | ______ | ______ | ______ | ______ |
| වක්කඩ | ______ | ______ | ______ | ______ |

## 9. ආගම සන්ධිය (අගම් සඳ)

පූර්ව වර්ණයටත්, පර වර්ණයටත් අතරට මිත්‍රයෙකු මෙන් අලුතින් ම අකුරක් එක්වීම ආගම සන්ධිය වේ. ය, ව, ර යන අකුරු බෙහෙවින් ආගමය වේ.

උදා:- සිවු + අඟ = විසන්ධිය
සිවු + ර් + අඟ = ර් ආගමය
සිවුරඟ = සන්ධිය

## 10. ද්විත්ව රූප සන්ධිය (දෙරූ සඳ)

සන්ධි වන පද දෙකෙන් පෙරකුර ද්විත්ව වීම ද්විත්ව රූප සන්ධිය නම් වේ.

උදා:- පත් + ඉරු = විසන්ධිය
පත් + ත් + ඉරු = පෙරකුර ද්විත්ව කිරීම
පත්තිරු = සන්ධි වීම


### ක්‍රියාකාරකම 2.11

වගුව සම්පූර්ණ කරන්න.

| සන්ධිය | විසන්ධිය | ආගම / ද්විත්ව වූ අකුර | සන්ධි නාමය |
|---|---|---|---|
| බත්තුළ | | | |
| නිරතුරු | | | |
| දෙයාකාර | | | |
| නිරෝද | | | |
| පොල්ලත්ත | | | |
| දුවඟ | | | |
| වල්ලම්බලම | | | |
| රුවාරු | | | |
| වියවුල් | | | |

## ක්‍රියාකාරකම 2.12

වටේට ඇති වෘත්තවල අදාළ සන්ධි නාම දක්වන්න.




## ක්‍රියාකාරකම 2.13


සන්ධි දැනුම තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා සරල ඉගෙනුම් උපකාරකයක් නිර්මාණය කරමු. මේ සඳහා ඝන කඩදාසියක් භාවිත කළ හැකි ය. ප්‍රමාණයෙන් ක්‍රමයෙන් විශාල වන පරිදි වෘත්ත තුනක් ඝන කඩදාසියක කපා ගන්න.

පළමු වන වෘත්තය තුළ සන්ධි යන වචනය ලියන්න.

දෙවන වෘත්තය කොටස් දහයකට වෙන්කොට එහි සන්ධිවල නම් සඳහන් කරන්න.

තුන්වන වෘත්තය කොටස් දහයකට වෙන්කොට ඒ තුළ සන්ධියකට උදහරණ දෙකක් හෝ තුනක් හෝ බැගින් ලියන්න. (සන්ධි පිළිවෙළින් නොවේ)

ඉන් පසු රවුම් සියල්ල එකමත තබා පහත රූප සටහනේ දැක්වෙන පරිදි පුවරුවක සවිකර ගන්න. දැන් වෘත්ත කරකවා අදාළ සන්ධියට ගැළපෙන උදාහරන තෝරා ගැනීමෙන් ඔබේ දැනුම තවදුරටත් සනාථ කරගත හැකි ය.



## ක්‍රියාකාරකම 2.14

දෙයස්නක ඉදත් හිමි දෙනමක් ළදරු
පසැස් දහම් දෙසති'යි දත් සුර ඉසුරු
තිදස් පුරෙන් එව්ම'යි හඟවන අයුරු
සියැස් ඇර බලන් සකිමෙම තොරණ සරු

ඉහත පද්‍යයේ ඇති සන්ධි පද සොයා ලියන්න.

## සමාස නාම

භාෂා ව්‍යවහාරයේදී එහි යෝග්‍යතාවට බලපාන අංගයකි, සමාස නාම. වෙන් වෙන් ව තිබූ නාම පද කීපයක් එක්කොට දක්වා තනි නාම පදයක් ලෙස විබත් ගැන්වීම සමාස ලක්‍ෂණය යි. භාෂණයෙහිදීත්, ලේඛනයෙහිදීත්, සමාස නාමවල අවශ්‍යතාව කැපී පෙනෙන්නකි.

''නේ සදන් සියොවැ එක සඳ අයුරක් වන සේ ගළපනු සමස් නම්''

යනුවෙන් සිදත් සඟරාවේ සමාස නාම අර්ථ කථනය කෙරෙයි.

### සමාස ප්‍රභේද

පහත වගුවේ වචන ගැන අවධානය යොමු කරමු.

| | |
|---|---|
| පුන්සඳ | පිරුණු සඳ |
| රැදාවල් | රැ ද දාවල් ද |
| වත්පිළිවෙත් | වත් ද පිළිවෙත් ද |
| රසකිරි | රසින් යුත් කිරි |
| සදෙව්ලොව | දෙව් ලෝ සය |
| දසමස | මාස දහයක් |
| මව්කුස | මවගේ කුස |

ඉහත පළමු කොටුවේ තනි පදයක් ලෙස ලියවී ඇති වචන සඳහා දෙවන කොටුවේ එම අදහස ම පද කීපයකින් සපයන බව පෙනේ. ඉන් පැහැදිලි වන්නේ පද කීපයක් හකුළුවා තනි පදයක් සේ සකස් කර ගත හැකි බවයි. එවැනි පද සමාස නාම ලෙස හැඳින් වේ. මේ ආකාරයෙන් සමාස වර්ග පහක් දක්නට ලැබේ.

1. ද්වන්ද්ව සමාසය

2. විශේෂණ සමාසය

3. විභක්ති සමාසය

4. අව්‍යය සමාසය

5. අන්‍යයාර්ථ සමාසය

## ද්වන්ද්ව සමාසය (ද අරුත් සමස්)

| | |
|---|---|
| පා ද සිවුරු ද | පාසිවුරු |
| දිවි ද වග ද වලස් ද | දිවිවගවලස් |

* සමුච්චයාර්ථවාචී

"ද" නිපාතයෙන් සම්බන්ධ ව සිටි වෙන් වෙන් අර්ථ ඇති පද එම නිපාත පදය ඉවත් වීමෙන් එකට එක් වීම "ද්වන්ද්ව" සමාසය යි. විභක්ති පද සියල්ලෙහි විභක්ති ලොප් වී සමාස වීමෙන් පසු එක පදයක් ලෙස විභක්ති ගනී.

## විශේෂණ සමාසය (වෙසෙසුන් වෙසෙස් සමස්)

| | |
|---|---|
| කළු පාටින් යුත් තද ගල | කළුගල |
| අඳුරු ස්වභාවය ඇති කුටිය | අඳුරුකුටිය |
| විෂ ඇති දළ | විෂදළ |
| ගල් වැනි හිත | ගල්හිත |
| රුවන් තුන | තෙරුවන |

කිසියම් නාම පදයකට තවත් පදයක් හෝ පද කීපයක් හෝ විශේෂණ වී සමාස වන්නේ විශේෂණ සමාසය යි.

## ක්‍රියාකාරකම 2.15

පහත දැක්වෙන පද්‍යයෙහි සමාස පද තෝරන්න. ඒවා කිනම් සමාසයකට අයත් දැ යි සඳහන් කරන්න.

''පුංචි රුවන් පුංචි රුවන් පුංචි කලේ
වතුර අරන් ළිඳ උඩ තැබුවාය කලේ
අටපහ නොදන්නා ජඩයෙකි, මේක කලේ
ගෙදර යන්න දෙනවද මගෙ පුංචි කලේ''

### විභක්ති සමාසය (විබත් සමස්)

| | |
|---|---|
| හෙරණුන් පිණිස පැනවුණ සික | හෙරණසික |
| බුදුන් දෙසූ බණ | බුදුබණ |
| රනින් කළ කොත | රන්කොත |
| ගිරවාගේ හොට | ගිරාහොට |

ඉහත උදහරණ පිළිබඳ සලකන කල පෙර පදය පර පදය හා සමාස වන කල්හි පෙර පදයේ විබත් ලොප් වී ඇති බව පෙනී යයි. එසේ වන්නේ විභක්ති සමාසයේ ය. පෙර පදය ගත් විබත අනුව සමාසය ද නම් කෙරේ. ප්‍රථමා, ආලපන විභක්ති හැර ඉතිරි විභක්ති හතෙන් විභක්ති සමාස පද සෑදේ.

### අව්‍යය සමාසය (අවිය සමස්)

| | |
|---|---|
| මනාව පිරුණු | සුපුන් |
| ස්ථිර නැති | අස්ථිර |
| දොසක් නොවන | නිදොස් |
| අයහපත් සිරිත් | දුසිරිත් |
| මිනිස් නොවන | නොමිනිස් |

ඉහත උදාහරණයන්හි සමාස පදයේ මුලින් අව්‍යය පදයක් දක්නට ලැබේ. නාම පදවල මුලට අව්‍යය පදයක් යෙදී මෙසේ තැනෙන නාම පද අව්‍යය සමාස නාම ලෙස හැඳින්වේ.

### අන්‍යාර්ථ සමාසය (අන් අරුත් සමස්)

| සමාස වීමට පෙර | සමාස පදය | හැඟවෙන අරුත |
|---|---|---|
| ඇස් පහක් ඇත්තේ | පසැස් | බුදු රජ |
| මත් සයක් ඇත්තේ | සමත් | කඳ කුමරු |
| සහසක් කර ඇත්තේ යමෙකුට ද හේ | සහසකර | සූර්යයා |
| බල දහයක් ඇත්තේ යමෙකුට ද හේ | දසබල | බුදුන් වහන්සේ |
| නෙත් තුනක් ඇත්තේ යමෙකුට ද හේ | තිනෙත් | ඊශ්වරයා |
| මල් අවියක් ඇත්තේ යමෙකුට ද හේ | මලවි | අනංගයා |

සමාස වූ පසු මුලින් යෙදුණු පදවලින් හෝ නොලැබෙන වෙනත් අර්ථයක් ප්‍රකාශ වන සමාසය අන්‍යාර්ථ සමාසය නමින් හැඳින්වේ.

**ක්‍රියාකාරකම 2.16**

1. ''ගෙවන සසර දුක් බුදුබණ නාද''
2. ''ලෙව්තුරු සුසැදි යස මිණිමුතු මල්පතර''
3. ''හෙරණසික කියති හෙරණෝ තැනිත් තැන''
4. ''බොන කල පොකුරු මී ඉඳ පිපි පියුම්හිස''
5. ''දියනෙත උදවෙන සියකිරණින් මහරු''
6. ''හීන කර මලවි උදහස් තැබුව සත''
7. ''දසදෙස පතළ යස මුතු සුරිඳුට දිමුතු''
8. ''මින්දද හීසර වැදී සැලෙන හද
   නංවන දුක්ගී ඔබට ඇසෙනව ද
   වඳන මල් අතුරා ඇති යහනට
   කන්ද කපා පායන් රන්පුන්සඳ''

ඉහත පද්‍ය බණ්ඩයන්හි ඇති සමාස නාම තෝරා පහත වගුව සම්පූර්ණ කරන්න.

| සමාස පදය | සමාස වීමට පෙර පද සමූහය | සමාස නාමය |
|---|---|---|
| | | |

**ක්‍රියාකාරකම 2.17**

තර සර ගිවි මහල් මෙහි පහ පෙළ තිතොර
සුර සිදු විදුදරන් සැදි සඳලු මනහර

විදා සිනිඳු සුදුරැස් දිගු පිය පතර
නදා සුපුන් හිමකර පියකර තිසර
සදා සිනඹ සියපත් නුඹ තඹර කර
උදා දෙසෙන් වැද එන රග බල මිතුර

ඉහත ගේය පද්‍යය ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| එහි ඇතුළත් සමාස පද | සමාස නාමය |
|---|---|
| | |

## ප්‍රත්‍යයාර්ථ නාම

නාම පදයක් යනු කුමක් දැ යි ඔබ මීට ඉහත ඉගෙන ගෙන ඇත. නාම පදයක අවයව වෙන් කළ විට ඔබට දකින්නට ලැබෙන්නේ ශබ්ද මූලයත් විභක්ති ප්‍රත්‍යයත් පමණි.

නිදසුනක් ලෙස :

ගම් + අ = ගම

ගස් + අ = ගස

යනු ශබ්ද ප්‍රකෘතියකත් විභක්ති ප්‍රත්‍යයකත් එකතු වීමකි.

එහෙත් ප්‍රත්‍යයාර්ථ නාම පදයක අවයව විග්‍රහ කළ විට ඔබට දකින්නට ලැබෙන්නේ නාම පදයක් හා ප්‍රත්‍යයකි. ඉනුත් නාම පදයේ අර්ථය ඉක්මවා ප්‍රත්‍යයේ අර්ථය මතු වී සිටී. නිදසුනක් ලෙස ගැමි යන තද්ධිත නාම පදය විග්‍රහ කළොත්, පැහැදිලි ලෙසම නාමයක් හා තද්ධිත ප්‍රත්‍යයක් දක්නට ලැබේ.

ගම + ඉ = ගැමි

ගැමි + ආ = ගැමියා

මෙහි තද්ධිත ඉ ප්‍රත්‍යය එකතු වී ඇත්තේ ගම යන නාම පදයට යි.

ප්‍රත්‍යයාර්ථ නාම පද වර්ග දෙකකි.

1. තද්ධිත
2. කෘදන්ත

තද්ධිත නාමයක් යනු නාම පදයක හා තද්ධිත ප්‍රත්‍යයක එකතුවකි. එහෙත් කෘදන්ත නාම යනු ධාතුවකට ප්‍රත්‍යයක් එකතුවීමෙන් නිපදවෙන නාම පදයි.

කෘදන්ත නාම ප්‍රභේද දෙකකි.

1. අර්ථ ක්‍රියා නාම
2. භාව ක්‍රියා නාම

## තද්ධිත

සිංහල භාෂාවේ තද්ධිත නාම නිපදවෙන ප්‍රත්‍යය සමුදයක් ඇත. එසේ ම තත්සම තද්ධිත නාමපද සමුදයක් ද පවතී.

''ඇත'' යන අර්ථය දෙනු සඳහා නාමයක්, වත් හා මත් ප්‍රත්‍යය ගනී.

| | | | |
|---|---|---|---|
| වත් - | පින් + වත් | - | පින්වත් |
| | සිල් + වත් | - | සිල්වත් |
| | ශ්‍රියා + වත් | - | ශ්‍රියාවත් |
| | ආලෝක + වත් | - | ආලෝකවත් |

| | | | |
|---|---|---|---|
| මත් - | ඉසුරු + මත් | - | ඉසුරුමත් |
| | රූ + මත් | - | රූමත් |
| | කීර්ති + මත් | - | කීර්තිමත් |
| | නීරෝගි + මත් | - | නීරෝගිමත් |

අකාරාන්ත නාමයෙන් පසුව වත් ප්‍රත්‍යය ද, සෙසු ස්වරාන්ත නාමයන්ගෙන් පරව මත් ප්‍රත්‍යය ද යෙදේ.

මුවා } යන ප්‍රත්‍යය, එයින් කරන ලද්දේ ය යන අර්ථයේ යෙදේ.
මය }

මුවා :- සෙල්මුවා, දැවමුවා, රන්මුවා, රිදීමුවා
මය :- දැවමය, සෛලමය, ස්වර්ණමය, කනකමය, රජතමය, මනෝමය

තර } යන ප්‍රත්‍යය, අධිකාර්ථයෙහි යෙදේ.
තම }

තර :- මිහිරිතර, ගරුතර, මධුරතර, ප්‍රියතර
තම :- මිහිරිතම, මධුරතම, ප්‍රියතම

## ගෞරවාර්ථ ප්‍රත්‍යය

| | | |
|---|---|---|
| ආණ | - පිය + ආණ | - පියාණ |
| අණු | - පුත් + අණු | - පුතණු |
| අණි | - මා + අණි | - මැණි |
| | - නග + අණි | - නැගණි |
| ණ්ඩ | - පුත + ණ්ඩ | - පුතණ්ඩ |
| ණ්ඩි | - අම්ම + ණ්ඩි | - අම්මණ්ඩි > අමැඩි |

## ස්වාර්ථය (ස්ව) යන අර්ථය

| | | |
|---|---|---|
| අස් | - වරල් + අස් | - වරලස් |
| | උස් + අස් | - උසස් |
| | යස + අස් | - යසස් |
| අත් | - මුදුන් + අත් | - මුදුනත් |
| | සවන් + අත් | - සවනත් |
| | කන + අත් | - කනත් |

## ස්වල්පාර්ථය

| | | |
|---|---|---|
| ඉති | - පැන් + ඉති | - පැනිති |
| | කැන් + ඉති | - කැනිති |
| | සුඟ + ඉති | - සිඟිති |
| | කැබලි + ඉති | - කැබිලිති |

## ප්‍රදේශාර්ථය

| | | |
|---|---|---|
| අටි | - ඉඟ + අටි | - ඉඟටි |
| | කර + අටි | - කරටි |

ර්ථ හුරු යන අර්ථය

| | | |
|---|---|---|
| | - දිග + අටි | - දිගටි |
| | කළු + අටි | - කළටි |

බහුලාර්ථය

අටු - වක + අටු - වකුටු
අලු - ගැට + ලු - ගැටලු

භාවාර්ථය

මුදු + තා - මුදුතා
සුහද + තා - සුහදතා
දක්ෂ + තා - දක්ෂතා

භූතාර්ථය

එහි වූයේ ය යන අර්ථය
ගම් + ඉ ගැමි

නියුක්තාර්ථය

එහි නියුක්ත වූයේ ය යන අර්ථය
තොට + ඉ තොටි

ජානනාර්ථය

එය දනී යන අර්ථය
නකත් + ඉ නැකති

සම්බන්ධාර්ථය

ලොව + ඉ ලොවි

සුදුසු යන අර්ථය
සබ + ඉ සැබි

ඉක ප්‍රත්‍ය ය

ඊට අයත් යන අර්ථය
මෙහි දී මුල් ස්වරය වෘද්ධි වේ.

නගර + ඉක - නාගරික
ශරීර + ඉක - ශාරීරික
කය + ඉක - කායික
ඉතිහාස + ඉක - ඓතිහාසික
දින + ඉක - දෛනික
පුද්ගල + ඉක - පෞද්ගලික
භූත + ඉක - භෞතික
රසායන + ඉක - රසායනික

''ඉ'' අන්ත නාම පදයකින් පරව ඇත යන අර්ථයේ ''ක'' ප්‍රත්‍යයයෝග යේදී ආදි ස්වරය වෘද්ධි නොවේ.

භක්ති + ක - භක්තික
ලබ්ධි + ක - ලබ්ධික
සංස්කෘති + ක - සංස්කෘතික

ඊය ප්‍රත්‍යය එකතුවීමේදී ද මුල් ස්වරය වෘද්ධි නොවේ.

ස්වදේශ + ඊය - ස්වදේශීය
විදේශ + ඊය - විදේශීය
ප්‍රාන්ත + ඊය - ප්‍රාන්තීය

එහෙත් තත්සම ඒය ප්‍රත්‍යය එකතුවීමේ දී වෘද්ධිය අනිවාර්ය වෙයි.

ගංගා + ඒය - ගාංගේය
ලංකා + ඒය - ලාංකේය

භාවාර්ථයේ ''ය'' ප්‍රත්‍යය
මෙහිදී ද මුල් ස්වරය වෘද්ධි වේ.

තරුණ + ය - තාරුණ්‍යය
සමර්ථ + ය - සාමර්ථ්‍යය
සුන්දර + ය - සෞන්දර්යය

කාලාර්ථයේ ''තන'' ප්‍රත්‍යය යෙදේ.

පුරා + තන - පුරාතන
සද + තන - සදතන
නව + තන - නූතන

**ක්‍රියාකාරකම 2.18**

තද්ධිත නාම වෙන් කොට දක්වන්න.

1. ගැමියා හා නාගරිකයා පහසුවෙන් හඳුනාගත හැකි ය.
2. කායික රෝග මෙන් ම මානසික රෝග සඳහා ද ප්‍රතිකාර ඇත.
3. වාර්ෂික ත්‍යාග ප්‍රදානය උත්කර්ෂවත් ලෙස පැවැත්වේ.
4. බලවත් හා ධනවත් අය ස්වදේශීය ද්‍රව්‍ය පරිහරණයට මැලිවෙති.
5. වෙසක් දින විදුලිය බුබුළින් ආලෝකවත් වූ නගරය සෞන්දර්යයෙන් අනූන විය.

**ක්‍රියාකාරකම 2.19**

'අ' කොටසේ එන තද්ධිත නාමයන්ගේ නාම ප්‍රත්‍යය ගැළපෙන අයුරින් 'ආ' කොටසින් තෝරන්න.

| අ කොටස | ආ කොටස | |
|---|---|---|
| | නාම | ප්‍රත්‍යය |
| 1. ගැමලු | මුදු | රිය |
| 2. ග්‍රාමීය | මිහිරි | අටු |
| 3. ඉසුරුමත් | දිය | අස් |
| 4. වරලස | ගැම | තා |
| 5. මුදුනා | හර (අර) | අටි |
| 6. දියතා | වරල | වත් |
| 7. අරටු | ග්‍රාම | මත් |
| 8. කරටි | පින් | තර |
| 9. පින්වත් | කර | ලු |
| 10. මිහිරිතර | ඉසුරු | ඉති |

## ක්‍රියාකාරකම 2.20

පහත දැක්වෙන අරුත් දෙන තද්ධිත පද ලියන්න.

1. දැවයෙන් නිමවන ලද
2. ජන සමූහය
3. හිස පෙදෙස
4. අඳුර ම
5. වඩා ගරු කළ යුතු
6. ලංකාවට අයත්
7. කෘශ බහුල වූයේ
8. දිගට හුරු
9. රනින් කරන ලද
10. ඉතාම කුඩා

## කෘදන්ත නාම

ධාතුවකට කෘදන්ත ප්‍රත්‍යයක් එක් වීමෙන් කෘදන්ත නාම නිපදවෙයි.

කෘදන්ත නාම ප්‍රභේද දෙකක් වෙයි.

1. අර්ථ ක්‍රියා
2. භාව ක්‍රියා

අර්ථ ක්‍රියා කෘදන්ත

නැවත කොටස් දෙකකට බෙදේ.

1. වර්තමාන කෘදන්ත
2. අතීත කෘදන්ත

යනුවෙන් වර්ගීකරණය කෙරේ.

## වර්තමාන කෘදන්ත

ධාතු මූලයකට ''න'' ප්‍රත්‍යය එක්කාසු කිරීමෙන් වර්තමාන කෘදන්ත නාමපද නිපදවේ.

| | | |
|---|---|---|
| බල + න | | |
| කර + න | } | කර්තෘකාරක |
| ලිය + න | | |

| | | | |
|---|---|---|---|
| බල + ඒ + න | බැලෙන | | |
| කර + ඒ + න | කෙරෙන | } | කර්මකාරක |
| රක් + ඒ + න | රැකෙන | | |

## අතීත කෘදන්ත

| | |
|---|---|
| බල + ඌ | බැලූ |
| රක් + ඉ | රැකි |
| වට + උණු | වැටුණු |
| කර + උණු | කෙරුණු |

රකාරාන්ත ධාතු මූල අතීත කෘදන්ත පද නිපදවීමේ දී ''ළ'' වලින් අවසන් වේ.

| | | |
|---|---|---|
| √කර | අතීත කෘදන්ත | කළ |
| √මර | අතීත කෘදන්ත | මළ |
| √හදාර | අතීත කෘදන්ත | හදාළ |
| √පහර | අතීත කෘදන්ත | පහළ |

''ඳ'' යන්නෙන් අවසන් වන ධාතු මූල ''න්'' වලින් අවසන් වේ.

√පලඳ පලන්

√බඳ බන්

√හඳ හන්

''ස්'' අන්ත ධාතු මූල අතීත කෘදන්ත ''ට'' යන්නෙන් අවසන් වේ.

√බස් බට

√වස් වට

දැනට භාෂාවේ සුලභ වශයෙන් අතීත කාල ආඛ්‍යාත අර්ථය දැක්වීම සඳහා යෙදෙන්නේ කෘදන්ත ආඛ්‍යාත පදයි. ශුද්ධ ආඛ්‍යාත පද යෙදෙන්නේ විරල වශයෙනි. √පිස මූලයේ පිසුවේ ය, පිසුවා ය යනු අතීත කෘදන්ත ආඛ්‍යාත රූපයි. පිසූ + ඒ = පිසුවේ යනු අතීත කාල පුරුෂ ලිංග කෘදන්ත ආඛ්‍යාත පදය යි. පිසු + ආ යනු අතීත කාල ස්ත්‍රී ලිංග ආඛ්‍යාත රූපය යි. පිසුවේ ය, පිසුවා ය යන දෙතැන එන 'ය' ප්‍රත්‍යය වාක්‍යය අවසන් බව දැක්වීමට යෙදෙන නිපාත පදයකි.

යෙදෙන ආකාරය අනුව කෘදන්ත නාම තෙවැදෑරුම් වේ.

1. කෘදන්ත නාම - ගයන්නා, නටන්නා
2. නාම විශේෂණ - රඟන නිළිය
3. අතීත කාල ක්‍රියා - පිසුවේ ය, පිසුවා ය, කීවේ ය, කීවා ය

ෂට් කාරකයන්හි - එනම් ක්‍රියා නිපදවීමට හේතු වන හෙයින් කාරක නමින් හැඳින්වෙන පහත සඳහන් අර්ථයන්හි අර්ථ ක්‍රියාපද නිපදවේ.

1. කර්ම අර්ථය
2. කර්තෘ අර්ථය
3. කරණ අර්ථය
4. සම්ප්‍රදාන අර්ථය
5. අවධි අර්ථය
6. ආධාර අර්ථය

### භාව කෘදන්ත

ක්‍රියා මාත්‍ර අර්ථය පමණක් පවසන ප්‍රත්‍යයක් ධාතු මූලයකට එක්කාසු වීමෙන් භාව කෘදන්ත නිපද වේ.

ධාතු මූලයකට ''නු'' ප්‍රත්‍ය එකතු වී නිපදවෙන්නේ භාව කෘදන්ත නාමය යි.

| | | | |
|---|---|---|---|
| √බල | + | නු | බලනු |
| √ය | + | නු | යනු |
| √කර | + | නු | කරනු |
| √නට | + | නු | නටනු |

භාව නාමයකට පසුව පුරුෂ ලිංග නාම පද ප්‍රත්‍යය හෝ ස්ත්‍රීලිංග නාමපද ප්‍රත්‍යය එකතුවීමෙන් අනතීත කෘදන්ත පද නිපද වෙයි.

| | | |
|---|---|---|
| බලනු | ඒ | බලන්නේ |
| බලනු | ඊ | බලන්නී |
| නටනු | ඒ | නටන්නේ |
| නටනු | ඊ | නටන්නී |

## භාවකාරක කෘදන්ත පද

භාවකාරක කෘදන්ත ප්‍රත්‍යය කීපයකි.

1. උම්
2. ඉලි
3. ඊම්
4. මන්

### උම් ප්‍රත්‍යය

√රඟ + උම් - රැඟුම්

√නට + උම් - නැටුම්

√කා + උම් - කැවුම්

### ඉලි ප්‍රත්‍යය

√නට + ඉලි - නැටිලි

√බල + ඉලි - බැලිලි

√කා + ඉලි - කැවිලි

### ඊම් ප්‍රත්‍යය

√ගය + ඊම් - ගැයීම්

√නට + ඊම් - නැටීම්

√බල + ඊම් - බැලීම්

## මන් ප්‍රත්‍යය

√ලිය + මන් - ලියමන්

√පිස + මන් - පිසමන්

√කිය + මන් - කියමන්

### ක්‍රියාකාරකම 2.21

විදෙන ලෙළෙන නරුබර පුළුලුකුළැ රැඳී
හෙළන නඟන අත නුවනග බැලුම් දිදී
රුවින දිලෙන අබරණ කැලුම ගත යෙදී
සැලෙන පහන සිළ වැනි රඟන ලිය සැදී

ඉහත කවිය ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ධාතුව | ප්‍රත්‍යය | කෘදන්ත පදය | කෘදන්ත නාමය |
|---|---|---|---|
| | | | |

### ක්‍රියාකාරකම 2.22

ඉහත වගුවේ දැක්වූ කෘදන්ත නාම පහක් තෝරා ගෙන අර්ථවත් වැකි පහක් ගොඩ නගන්න.

# 03. ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය හා නාම විභක්ති ප්‍රත්‍යය

## ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය

කිසියම් ක්‍රියා පදයක හෙවත් ආඛ්‍යාත පදයක මුල් ස්වරූපය ලෙස සැලකෙන ධාතු ප්‍රකෘතියකට පසුව යෙදී, අර්ථවත් ආඛ්‍යාත පදයක් නිර්මාණය කරන්නේ "ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය" මගිනි.

උදා:- ළමයා පොත බලයි.

මෙහි "බලයි" යන ක්‍රියා පදයේ ධාතු ප්‍රකෘතිය වන "බල" ධාතුවට "යි" ප්‍රත්‍යය එක් කිරීමෙන් එම ක්‍රියා පදය සෑදී ඇත. ඒ අනුව ධාතුවකට ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය එක් කිරීමෙන් ආඛ්‍යාත පද සෑදෙන බව පැහැදිලි වෙයි.

ආඛ්‍යාත පද

(i) කාල භේදය

(ii) වචන භේදය

(iii) පුරුෂ භේදය

(iv) කාරක භේදය

භජනය කරයි. කාල, වචන, පුරුෂ, කාරකාදියට ක්‍රියා පද වර නැගෙයි. පුරුෂ භේදය, කාරක භේදය සහ වචන භේදය අනුව විවිධ අර්ථ ප්‍රකාශ වන්නේ ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය මගිනි.

## කාල භේදය

කාල භේදය

(i) අතීත කාලය

(ii) වර්තමාන කාලය

(iii) අනාගත කාලය යැයි තෙවැදෑරුම් වේ. යම් ක්‍රියාවක් සිදු වී හෝ සිදු කොට ඇත්නම් එය අතීත කාලය වේ. එමෙන් ම යම් ක්‍රියාවක් කෙරෙමින් හෝ සිදුවෙමින් පවතින්නේ නම්, එය වර්තමාන කාලය වේ. යම් ක්‍රියාවක් ඉදිරියේදී සිදුකිරීමට බලාපොරොත්තු වන්නේ නම්, එය අනාගත කාලය ලෙස හැඳින්වේ.

උදා:- අතීත කාලය

| ධාතුව | | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය |
|---|---|---|---|
| බල | + | ඊ | බැලී |
| බල | + | ඌ | බැලූ |

වර්තමාන කාලය

| ධාතුව | | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය |
|---|---|---|---|
| බල | + | යි | බලයි |
| බල | + | ති | බලති |

අනාගත කාලය

| ධාතුව | | ප්‍රත්‍යය | ආඛ්‍යාත පදය |
|---|---|---|---|
| බල | + | අන්නේ | බලන්නේ(ය) |
| බල | + | අන්නෝ | බලන්නෝ(ය) |

## වචන භේදය

ඒක වචන, බහු වචන ලෙස වචන භේදය දෙආකාර වේ.

ඒක වචන

බල + යි - බලයි

බල + ඒ - බැලේ

බල + ඊ - බැලී(ය)

බල + අන්නේ - බැලෙන්නේ

බල + අන්නේ - බලන්නේ

බහුවචන

බල + ති - බලති
බල + එති - බැලෙති
බල + ඌ - බැලූ
බල + අන්නෝ - බලන්නෝ
බල + අන්නෝ - බැලෙන්නෝ

## පුරුෂ භේදය

පුරුෂ භේදය තුන් ආකාර වේ.

(i) ප්‍රථම පුරුෂ
(ii) මධ්‍යම පුරුෂ
(iii) උත්තම පුරුෂ

ධාතු ප්‍රකෘතියේ අගට එක්වන "යි" "ති" යන ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යයවලින් ප්‍රථම පුරුෂය ද, "හි", "හු" යන ප්‍රත්‍යයවලින් මධ්‍යම පුරුෂය ද, "මි", "මු" යන ප්‍රත්‍යයවලින් උත්තම පුරුෂය ද දැක්වෙයි. මේවා "පුරුෂ ප්‍රත්‍යය" ලෙස ද හැඳින්වේ.

උදා:-

| | ඒක වචන | | | බහු වචන | | |
|---|---|---|---|---|---|---|
| පුරුෂය | ධාතුව | ප්‍රත්‍යය | පදය | ධාතුව | ප්‍රත්‍යය | පදය |
| ප්‍රථම පුරුෂ | බල + | යි | බලයි | බල + | ති | බලති |
| මධ්‍යම පුරුෂ | බල + | හි | බලහි | බල + | හු | බලහු |
| උත්තම පුරුෂ | බල + | මි | බලමි | බල + | මු | බලමු |

## කාරක භේදය

කාරක භේදය තුන් වැදෑරුම් වේ.

(i) කර්තෘ කාරක
(ii) කර්ම කාරක
(iii) භාව කාරක

කිසියම් ආඛ්‍යාත පදයකින් කර්තෘ උක්ත වේ නම් එය කර්තෘකාරක වේ. එමෙන් ම කිසියම් වාක්‍යයක කර්ම පදය උක්ත වේ නම් එය කර්මකාරක ය. ක්‍රියා මාත්‍රය පමණක් උක්ත වේ නම් එය භාවකාරක වෙයි.

උදා:- බල + ඊ - බැලී (කර්තෘකාරක)
බල + ඉණි - බැලිණි (කර්මකාරක)
බල + ඊම් - බැලීම් (භාවකාරක)

❍ කර්තෘකාරකයෙහි අතීත කාල ආඛ්‍යාත ප්‍රත්‍යය යෙදෙන අයුරු,

| ඒක වචන | | | බහු වචන | |
|---|---|---|---|---|
| පුරුෂය | ධාතුව+ප්‍රත්‍යය | ක්‍රියා පදය | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
| ප්‍රථම පුරුෂ | බල + ඊ | බැලී | ඌ | බැලූ |
| මධ්‍යම පුරුෂ | බල + ඊහි | බැලීහි | ඌහු | බැලූහු |
| උත්තම පුරුෂ | බල + ඊම් | බැලීම් | ඌමු/ඊමු | බැලූමු/බැලීමු |

❍ කර්මකාරකයෙහි අතීත කාල ආඛ්‍යාත ප්‍රත්‍යය යෙදෙන අයුරු,

| ඒක වචන | | | බහු වචන | |
|---|---|---|---|---|
| පුරුෂය | ධාතුව+ප්‍රත්‍ය | ක්‍රියා පදය | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
| ප්‍රථම පුරුෂ | නම + ඉණි | නැමිණි | උණු | නැමුණු |
| මධ්‍යම පුරුෂ | නම + ඉණිහි | නැමිණිහි | උණුහු | නැමුණුහු |
| උත්තම පුරුෂ | නම + ඉණිමි | නැමිණිමි | උණුමු/ඉණිමු | නැමුණුමු/<br>නැමිණිමු |

❍ කර්තෘකාරකයෙහි වර්තමාන කාල ආඛ්‍යාත ප්‍රත්‍යය යෙදෙන අයුරු,

| ඒක වචන | | | බහු වචන | |
|---|---|---|---|---|
| පුරුෂය | ධාතුව+ප්‍රත්‍යය | ක්‍රියා පදය | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
| ප්‍රථම පුරුෂ | රඟ + යි | රඟයි | ති | රඟති |
| මධ්‍යම පුරුෂ | රඟ + හි | රඟහි | හු | රඟහු |
| උත්තම පුරුෂ | රඟ + මි | රඟමි | මු | රඟමු |

❍ කර්මකාරකයෙහි වර්තමාන කාල ආඛ්‍යාත ප්‍රත්‍යය යෙදෙන අයුරු,

| ඒක වචන | | | | බහු වචන | |
|---|---|---|---|---|---|
| පුරුෂය | ධාතුව | ප්‍රත්‍යය | ක්‍රියා පදය | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
| ප්‍රථම පුරුෂ | නට | එ + යි | නැටෙයි | එ + ති | නැටෙති |
| මධ්‍යම පුරුෂ | නට | එ + හි | නැටෙහි | එ + හු | නැටෙහු |
| උත්තම පුරුෂ | නට | එ + මි | නැටෙමි | එ + මු | නැටෙමු |

❍ කර්තෘකාරකයෙහි අනාගත කාල ආඛ්‍යාත ප්‍රත්‍යය යෙදෙන අයුරු,

| ඒක වචන | | | | බහු වචන | |
|---|---|---|---|---|---|
| පුරුෂය | ධාතුව | ප්‍රත්‍යය | ක්‍රියා පදය | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
| ප්‍රථම පුරුෂ | ලිය | අන්නේ | ලියන්නේ | අන්නෝ | ලියන්නෝ |
| මධ්‍යම පුරුෂ | ලිය | අන්නෙහි | ලියන්නෙහි | අන්නහු | ලියන්නහු |
| උත්තම පුරුෂ | ලිය | අන්නෙමි | ලියන්නෙමි | අන්නෙමු | ලියන්නෙමු |

❍ කර්මකාරකයෙහි අනාගත කාල ආඛ්‍යාත ප්‍රත්‍යය යෙදෙන අයුරු,

| ඒක වචන | | | | බහු වචන | |
|---|---|---|---|---|---|
| පුරුෂය | ධාතුව | ප්‍රත්‍යය | ක්‍රියා පදය | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
| ප්‍රථම පුරුෂ | වය | එන්නේ | වැයෙන්නේ | එන්නෝ | වැයෙන්නෝ |
| මධ්‍යම පුරුෂ | වය | එන්නෙහි | වැයෙන්නෙහි | එන්නෙහු | වැයෙන්නෙහු |
| උත්තම පුරුෂ | වය | එන්නෙමි | වැයෙන්නෙමි | එන්නෙමු | වැයෙන්නෙමු |

❍ භාවකාරකයෙහි අතීත කාල ආඛ්‍යාත ප්‍රත්‍යය යෙදෙන අයුරු,

| වචන (මෙහි වචන භේදයක් නොමැත) | ධාතුව | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
|---|---|---|---|
| ඔහුට/ඇයට/ඔවුන්ට | නට | ඉණි | නැටිණි |
| ඔබට/නට/තිට/තොපට | නට | ඉණි | නැටිණි |
| මට/අපට | නට | ඉණි | නැටිණි |

❍ භාවකාරකයෙහි වර්තමාන කාල ආඛ්‍යාත ප්‍රත්‍යය යෙදෙන අයුරු,

| වචන (මෙහි වචන භේදයක් නොමැත) | ධාතුව | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
|---|---|---|---|
| ඔහුට/ඇයට/ඔවුන්ට | නට | ඒ | නැටේ/නැටෙයි |
| ඔබට/නට/තිට/තොපට | නට | ඒ | නැටේ/නැටෙයි |
| මට/අපට | නට | ඒ | නැටේ/නැටෙයි |

### විශේෂයි

භාවකාරක යනු කිසියම් ක්‍රියා පදයක ක්‍රියා භාවය පමණක් හඟවන ආඛ්‍යාත පද විශේෂයකි. පුරුෂ, ලිංග, වචන භේදයක් නැතිව අතීත කාලය සඳහා "ඉණි" ප්‍රත්‍යය ද වර්තමාන කාලය සඳහා "ඒ" ප්‍රත්‍යය ද යෙදෙයි. මේවා "නිරුත්සාහක ක්‍රියා" ලෙස ද හැඳින්වේ. අවසාන ක්‍රියා පදය ප්‍රථම පුරුෂ ඒක වචනයෙන් පමණක් යෙදීම මෙම ''භාවකාරකයෙහි'' විශේෂත්වය යි.

## ක්‍රියාකාරකම 3.1

පහත සඳහන් වාක්‍ය බහු වචනයට හරවා ලියන්න

1. මම පොත කියවමි.
2. උපාසක මහතා සිල් සමාදන් වෙයි.
3. භික්ෂුව පිඬු පිණිස හැසිරුණේය.
4. කවියා කවියක් ලියන්නේය.
5. තෝ කොහි යහිද?
6. නුඹ මට ද්‍රෝහි වුණෙහිද?

## ක්‍රියාකාරකම 3.2

පහත සඳහන් වාක්‍ය ඒක වචනයට හරවා ලියන්න

1. භික්ෂූහු බණ දෙසති.
2. තොපි සෙල්ලම් කළෙහු ද?
3. වඳුරෝ පලතුරු කන්නෝ ය.
4. මිනිස්සු ගඟින් එතෙර වෙති.

## ක්‍රියාකාරකම 3.3

පහත සඳහන් පද්‍ය ඛණ්ඩය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සිව්යෙන් මිදුණු බෝවිටියා ගෙඩිය සොයා
මල් කැකුළකට නෑකම් ඇති තුඩග තියා
ලස්සන කිරිල්ලක් වන ලැහැබකට ගියා
දිටියෙමි ඇගේ කූඩුව කොතනක ද කියා

නොපොවන පරිදි මිනිසෙකුගේ පියවි ඇස
ලැහැබෙහි කුඩා පඳුරක අතු රිකිලි හිස
ඇය බැඳි කැදූල්ලෙහි සැඟවුණු මිහිරි රස
වැටහෙයි මටත් ගත හැකි නම් කුරුලු වෙස

1. ඉහත පැදි පෙළෙහි ඇති අවසාන ක්‍රියා පද තෝරා ලියන්න.

2. එම ක්‍රියා පදවල ධාතු ප්‍රකෘති හා ප්‍රත්‍යය වෙන් කර දක්වන්න.

3. ඉහත පද්‍ය පන්තියේ එන ක්‍රියා පද බහු වචනයට හරවා ලියන්න.

## ක්‍රියාකාරකම 3.4

පහත වගුව සම්පූර්ණ කරන්න.

| ක්‍රියා පදය | වචනය | පුරුෂය | කාරකය | කාලය | මූලය |
|---|---|---|---|---|---|
| හැඬිණි<br>වුසු<br>වැටෙන්නාහු<br>රකියි<br>මැරීම්<br>දිලෙයි<br>දකිනා | | | | | |

## ක්‍රියාකාරකම 3.5

පහත සඳහන් ධාතු මූලවලට අනුරූප නිරුත්සාහක ක්‍රියාපද සාදන්න.

√නග , √බිඳ , √රක්

√නට , √බල , √දුව

√හැසිර , √පලඳ , √වට

√යව

කිසියම් නාම පදයක මුල් ස්වරූපය හෙවත් ශබ්ද ප්‍රකෘතියක අගට යෙදී විවිධාර්ථවත් පද බිහි කරන්නේ "විභක්ති ප්‍රත්‍යය" මගිනි. ඒවා "නාම විභක්ති ප්‍රත්‍යය" ලෙස ද හැඳින්වෙයි.

උදා:- මිනිස් + ආ - මිනිසා
ගොවි + ආ - ගොවියා
වලස් + උ - වලස්සු
සිංහ + ඕ - සිංහයෝ
පුත් + උන් - පුතුන්

ඉහත සඳහන් උදාහරණවලට අනුව පැහැදිලි වන්නේ අර්ථවත් නාම පදයක් සෑදීම සඳහා ශබ්ද ප්‍රකෘතියට හෙවත් නාම ප්‍රකෘතියට පසුව විභක්ති ප්‍රත්‍යය අවශ්‍ය වන බවයි.

සිංහල භාෂාවේ දක්නට ඇති විවිධ නාම පද විවිධාර්ථ ප්‍රකාශ කිරීම සඳහා යෝග්‍ය පරිදි සකස් කරන්නේ විභක්තිය යි. සිංහල භාෂාවේ විභක්ති නවයක් ඇත. ඒවා නම්,

(1) පෙර විභක්තිය
(2) කම් විභක්තිය
(3) කතු විභක්තිය
(4) කරණ විභක්තිය
(5) සපදන් විභක්තිය
(6) අවධි විභක්තිය
(7) සබඳ විභක්තිය
(8) අඳර විභක්තිය
(9) අලප් විභක්තිය

ඉහත සඳහන් විභක්තීන්ට අදාළ "විභක්ති ප්‍රත්‍යය" ඇත. ඒවා ඒක වචන හා බහු වචන වශයෙන් විවිධ විභක්ති රූපවලට බෙද දැක්වීම "නාම පද වර නැගීම" ලෙස ද හැඳින්වේ. එහෙත් භාෂාවේ සෑම නාම පදයක් ම එක ම ආකාරයකින් වර නොනැගේ. ඊට හේතුව වන්නේ සිංහල භාෂාවේ ලිංගත්‍රයක් ඇති බැවිනි.

(1) පුරුෂ ලිංග
(2) ස්ත්‍රී ලිංග
(3) නපුංසක ලිංග වශයෙනි.

ඉහත සඳහන් ලිංගත්‍රයෙහි ඇති ශබ්ද

(1) ප්‍රාණවාචී ශබ්ද
(2) අප්‍රාණවාචී ශබ්ද

ලෙස ද වර්ග කෙරෙයි.

අප භාවිත කරන නාම පදවල ශබ්ද ප්‍රකෘතියේ අන්තය අනුව එම පදවලට එක් වන "ප්‍රත්‍යයවල" වෙනස්කම් දැකිය හැක. ඒවා අපි පසුව උදාහරණ සහිතව විමසා බලමු. නාම වර නැගීම පහත සඳහන් ලෙස වර්ග කෙරේ.

(1) අකාරාන්ත ශබ්ද වර නැගීම.
(2) ආකාරාන්ත ශබ්ද වර නැගීම.
(3) ඇකාරාන්ත ශබ්ද වර නැගීම.
(4) ඈකාරාන්ත ශබ්ද වර නැගීම.
(5) ඉකාරාන්ත ශබ්ද වර නැගීම.
(6) ඊකාරාන්ත ශබ්ද වර නැගීම.
(7) උකාරාන්ත ශබ්ද වර නැගීම.
(8) ඌකාරාන්ත ශබ්ද වර නැගීම.
(9) එකාරාන්ත ශබ්ද වර නැගීම.
(10) ඒකාරාන්ත ශබ්ද වර නැගීම.
(11) ඔකාරාන්ත ශබ්ද වර නැගීම.

ලිංගත්‍රයට අදාළ "ප්‍රත්‍යය" භාවිත වන ආකාරය පිළිබඳ සලකා බලමු.

(i) ප්‍රාණවාචී පුරුෂ ලිංග ශබ්ද වර නැගීමේදී භාවිත වන ප්‍රත්‍යය මාලාව.

| විභක්ති | ඒක වචන ප්‍රත්‍යය | බහු වචන ප්‍රත්‍යය |
|---|---|---|
| පෙර | ආ | උ/ඕ/හු |
| කම් | ආ | අන්/උන්/ඉන් |
| කතු | විසින් | විසින් |
| කරණ | කරණ කොට ගෙන | කරණ කොට ගෙන |
| සපදන් | ආට | උන්ට/අන්ට/අනට |
| අවධි | ආගෙන් | උන්ගෙන්/අන්ගෙන් |
| සබඳ | ආගේ | උන්ගේ/අන්ගේ |
| අදර | කෙරෙහි | කෙරෙහි |
| අලප් | අ | උනි/අනි/එනි/ඉනි |

(ii) ස්ත්‍රී ලිංග ශබ්ද වර නැගීමේදී භාවිත වන ප්‍රත්‍යය මාලාව.

| විභක්ති | ඒක වචන ප්‍රත්‍යය | බහු වචන ප්‍රත්‍යය |
|---|---|---|
| පෙර | අ | උ/ඕ/හු |
| කම් | ආ | අන්/උන් |
| කතු | විසින් | විසින් |
| කරණ | කරණ කොට ගෙන | කරණ කොට ගෙන |
| සපදන් | අට | උන්ට/අන්ට |
| අවධි | අගෙන් | උන්ගෙන්/අන්ගෙන් |
| සබඳ | අගේ | උන්ගේ/අන්ගේ |
| අදර | කෙරෙහි | කෙරෙහි |
| අලප් | අ | උනි/අනි |

(iii) නපුංසක ලිංග ශබ්ද වර නැගීමේදී භාවිත වන ප්‍රත්‍යය මාලාව.

| විභක්තිය | ඒක වචන ප්‍රත්‍යය | බහු වචන ප්‍රත්‍යය |
|---|---|---|
| පෙර | අ | (බහු වචන රූපය) |
| කම් | ආ | (බහු වචන රූපය) |
| කතු | එන් | ඉන් |
| කරණ | එන්/කරණ කොට ගෙන | ඉන් කරණ කොට ගෙන |
| සපදන් | අට | වල් + අට |
| අවධි | ඉන්/එන් | වලින් |
| සබඳ | ඒ | වල |
| අදර | එහි | වල |


නපුංසක ලිංග ශබ්දවල ආලපන විභක්තිය භාවිතයට ගැනෙන්නේ නැත.

ඉහත සඳහන් විභක්ති ප්‍රත්‍යයවලට ශබ්ද ප්‍රකෘති එක් කිරීමෙන් අර්ථවත් නාම සෑදෙන අයුරු විශේෂයෙන් සලකා බැලිය යුතුය.

උදා:- ප්‍රාණවාචී පුරුෂ ලිංග ශබ්ද වර නැගීම.

අකාරාන්ත "ගව" ශබ්දය

| විභක්ති | ඒක වචනය | බහු වචනය |
|---|---|---|
| පෙර | ගවයා | ගවයෝ |
| කම් | ගවයා | ගවයින් |
| කතු | ගවයා විසින් | ගවයින් විසින් |
| කරණ | ගවයා කරණ කොට ගෙන | ගවයන් කරණ කොට ගෙන |
| සපදන් | ගවයාට | ගවයන්ට |
| අවධි | ගවයාගෙන් | ගවයන්ගෙන් |
| සබඳ | ගවයාගේ | ගවයන්ගේ |
| අදර | ගවයා කෙරෙහි | ගවයන් කෙරෙහි |
| අලප් | ගවය | ගවයිනි |




ප්‍රාණවාචී ස්ත්‍රී ලිංග ශබ්ද වර නැගීම.

අකාරාන්ත ''නළඟන'' ශබ්දය

| විභක්ති | ඒක වචනය | බහු වචනය |
|---|---|---|
| පෙර | නළඟන | නළඟනෝ |
| කම් | නළඟන | නළඟනන් |
| කතු | නළඟන විසින් | නළඟනන් විසින් |
| කරණ | නළඟන කරණ කොට ගෙන | නළඟන් කරණ කොට ගෙන |
| සපදන් | නළඟනට | නළඟනන්ට |
| අවධි | නළඟනගෙන් | නළඟනන්ගෙන් |
| සබඳ | නළඟනගේ | නළඟනන්ගේ |
| අදර | නළඟන කෙරෙහි | නළඟනන් කෙරෙහි |
| අලප් | නළඟන | නළඟනනි |

ප්‍රාණවාචී ස්ත්‍රීලිංග ශබ්ද

අඟන, කෙනෙර, සෙබඩ, වෙළඹ, බිරිඳ, ආදී ශබ්ද අකාරාන්ත ස්ත්‍රී ලිංග ශබ්ද වේ.

කාන්තා, වනිතා, භාර්යා, කන්‍යා ආදී ශබ්ද ආකාරන්ත ස්ත්‍රීලිංග ශබ්ද වේ.

කුමරි, සැතිරි, යෙහෙළි, බැමිණි, කිකිළි, මෙනවි, කැවිඩි ආදී ශබ්ද ඉකාරාන්ත ස්ත්‍රීලිංග ශබ්ද වේ.

ස්ත්‍රී, දේවී ආදී ශබ්ද ඊකාරාන්ත ස්ත්‍රීලිංග ශබ්ද වේ.

අඹු, ගැහැනු ආදී ශබ්ද උකාරාන්ත ස්ත්‍රීලිංග ශබ්ද වේ.

බිසෝ ආදී ශබ්ද ඔකාරන්ත ස්ත්‍රීලිංග ශබ්ද වේ.


දූ ආදී ශබ්ද ඌකාරාන්ත ස්ත්‍රීලිංග ශබ්ද වේ.

සත් ආදී ශබ්ද සත්‍රීලිංග හලන්ත ශබ්ද වේ.

නපුංසක ලිංග ශබ්ද වර නැඟීම

අකාරාන්ත ''දොර'' ශබ්දය

| විභක්ති | ඒක වචනය | බහු වචනය |
|---|---|---|
| පෙර | දොර | දොරවල් |
| කම් | දොර | දොරවල් |
| කතු | දොරෙන් | දොරවල්වලින් |
| කරණ | දොරින්, දොරකරණ කොට ගෙන | දොරවල්වලින්, දොරවල්කරණ කොට ගෙන |
| සපදන් | දොරට | දොරවල්වලට |
| අවධි | දොරෙන් | දොරවල්වලින් |
| සබඳ | දොරේ | දොරවල්වල |
| අදර | දොරෙහි | දොරවල්වල |




## ක්‍රියාකාරකම 3.6

පහත දැක්වෙන නාම පදවල ශබ්ද ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන්කර දක්වන්න.

1. නරියාගෙන්
2. යුවතිය
3. ලතාවෝ
4. ගෙඩිවල
5. ලෙහෙනුන්
6. මහණෙනි
7. ඔළු ගෙඩිය
8. පිඹුරෝ
9. කකුළුවන්
10. සැපින්න

## ක්‍රියාකාරකම 3.7

පහත සඳහන් නාම ස්වරාන්ත හා හලන්ත භේදය අනුව වෙන් කොට දක්වන්න.

1. කත්
2. යක්
3. සුළු දිය
4. පොළව
5. කවුඩු
6. ඇස්
7. කියඹු ලතා
8. රුක්
9. පුටු
10. සැපින්න

## ක්‍රියාකාරකම 3.8

"වනිතා" ශබ්දය සියලු විභක්තීන්හි ඒක වචන යෙහි හා බහු වචනයෙහි වරනගා දක්වන්න.

## ක්‍රියාකාරකම 3.9

පහත සඳහන් පද්‍යවල සරල අදහස ලියන්න.

උයන් කෙළි කෙළන මල් කුමරියන් කෙරෙන්  
අරන් රොන් රසය මල් කුමරෙකුගෙ යුරෙන්  
බියෙන් මෙන් පියාඹන සැටි මටත් හොරෙන්  
මගෙන් උඹට වරදක් නැහැ ළඟට වරෙන්

නිල්වන් අහස තනිවම ඔය බමන්නේ  
සෙල්ලම් කරන්ට ද උඹ මට කියන්නේ  
මල්පෙති ලෙසින් මේ අත්තටු පෙනෙන්නේ  
මල්ලෝකයේ කොතනද උඹ උපන්නේ

## ක්‍රියාකාරකම 3.10

ඉහත සඳහන් පද්‍ය පංතියේ නාම පද වෙන් කොට දක්වන්න. ඒ වායේ විභක්ති නාම ද ලියා දක්වන්න.

# 04. ආඛ්‍යාත පද

## ප්‍රයෝජ්‍ය, ආශිර්වාද ක්‍රියා පිළිබඳ මූලික අවබෝධය.

සිංහල භාෂාවේ පද ප්‍රභේද කිහිපයක් වෙයි. එනම්,

1. නාම පද
2. ආඛ්‍යාත පද
3. අව්‍යය පද

මෙම පරිච්ඡේදයෙන් විග්‍රහ වන්නේ ආඛ්‍යාත පද පිළිබඳවයි.



1. විනෝදයට කැමති ළමයෙක් ලස්සන සරුංගලයක් උඩ යවමින් <u>සිටියි.</u>

2. සුළඟ හෙමින් හෙමින් <u>හමයි</u>.

ඉහත සඳහන් වාක්‍ය දෙක විමසුමෙන් බලන්න. පළමු වැකියෙන් කියවෙන්නේ ළමයෙකු විසින් කරනු ලබන ක්‍රියාවකි. ඔහු සරුංගලයක් යවමින් සිටියි.

දෙවන වැකියෙන් ඊට වෙනස් අරුතක් හැඟවෙයි. යමෙක් කරන දෙයක් නොව ඉබේ සිදු වන දෙයක් එම වැකියෙන් හැඟවෙයි. සුළඟ හෙමින් හෙමින් හමයි. මේ වැකි දෙකේ ආඛ්‍යාත පද දෙක ''සිටියි, හමයි'' වේ.

> මේ අනුව කිරීමක්, වීමක් හෝ විඳීමක්, හඟවන පද ආඛ්‍යාත පද නමින් හැඳින්වේ.

මෙබඳු ආඛ්‍යාත පද සකස් වනුයේ ධාතු ප්‍රකෘතියකට (ක්‍රියා මූලයකට) ප්‍රත්‍යයක් එකතු වීමෙන් ය. ධාතු ප්‍රකෘතිය යනු ක්‍රියා පදයක මූලය යි.

> ක්‍රියාපදය = ධාතු ප්‍රකෘතිය + ප්‍රත්‍යය

ඉහත සමීකරණය අනුව ධාතු ප්‍රකෘතිය (ක්‍රියා මූලය) පිළිබඳ ඔබට ගැටලුවක් මතුවිය හැකි ය. ධාතු ප්‍රකෘතිය නම් ක්‍රියා පදය සකස් වීමට පෙර මුල්ම අවස්ථාවයි.

''ලියයි''

මෙය ක්‍රියා පදයකි. මෙම ක්‍රියා පදය සැකසී ඇත්තේ

ධාතු ප්‍රකෘතිය + ප්‍රත්‍යය ලෙසටයි.

ඒ අනුව, ලිය + යි ධාතු ප්‍රකෘතිය ''ලිය'' වේ. ප්‍රත්‍යය ''යි'' වේ. මේ දෙක එක්ව ''ලියයි'' යනුවෙන් ක්‍රියා පදයක් සෑදේ. මෙහි ''ලිය'' යන ධාතු ප්‍රකෘතියට ''යි'' ප්‍රත්‍යය එකතු වී වර්තමාන කාල ප්‍රථම පුරුෂ ඒක වචන ''ලියයි'' යන ක්‍රියා පදය සෑදේ. ක්‍රියා පදයෙන් ප්‍රත්‍යය වෙන් කළ පසු ක්‍රියාමූලය සොයා ගත හැකි ය.

ක්‍රියාමූලය සොයා ගැනීමේ පහසු සරල ක්‍රමයක් ඇත. එනම් එම ක්‍රියාපදය ප්‍රයෝජ්‍ය ක්‍රියාවක් බවට පත්කිරීමයි. ඉන්පසු එම ප්‍රයෝජ්‍ය ක්‍රියාවෙහි ප්‍රයෝජ්‍ය ප්‍රත්‍යය හා ආඛ්‍යාත ප්‍රත්‍යය ඉවත් කළපසු ක්‍රියා මූලය ලැබේ. උදාහරණ කීපයක් සලකා බලමු.

| ක්‍රියාපදය | ප්‍රයෝජ්‍ය ක්‍රියාවෙහි යෙදීම | ''ප්‍රත්‍යය'' ඉවත් කොට ක්‍රියාමූලය ලබා ගැනීම |
|---|---|---|
| නටයි | නටවයි | √නට |
| කරයි | කරවයි | √කර |
| දුවති | දුවවති | √දුව |
| අඬයි | අඬවයි | √අඬ |

ආඛ්‍යාත පදයක ලක්ෂණ කීපයක් දක්නට ලැබෙයි.

★ අතීත වර්තමාන සහ අනාගත යනුවෙන් කාල භේදයක් පෙන්නුම් කරයි.
★ ප්‍රථම පුරුෂ, මධ්‍යම පුරුෂ සහ උත්තම පුරුෂ යනුවෙන් පුරුෂ භේදයක් පෙන්නුම් කරයි.
★ ඒක වචන සහ බහු වචන යනුවෙන් වචන භේදයක් පෙන්නුම් කරයි.
★ කර්තෘකාරක, කර්මකාරක සහ භාවකාරක වශයෙන් කාරක භේදයක් පෙන්නුම් කරයි.

## ලිය ධාතුව - කර්තෘකාරක

### වර්තමාන කාලය

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ලියයි | ලියති / ලියත් |
| මධ්‍යම පුරුෂ | ලියහි | ලියහු |
| උත්තම පුරුෂ | ලියමි | ලියමු |

### අතීත කාලය

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ලීවේය | ලීවෝය/ලීවෝහ/ලීහ |
| මධ්‍යම පුරුෂ | ලීවෙහි | ලීවෙහු |
| උත්තම පුරුෂ | ලීවෙමි | ලීවෙමු |

### අනාගත කාලය

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ලියන්නේ | ලියන්නෝ |
| මධ්‍යම පුරුෂ | ලියන්නෙහි | ලියන්නෙහු |
| උත්තම පුරුෂ | ලියන්නෙමි | ලියන්නෙමු |

## ලිය ධාතුව - කර්මකාරක

### වර්තමාන කාලය

| | ඒකවචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ලියනු ලබයි/ලියවෙයි | ලියනු ලබති/ලියවෙති |
| මධ්‍යම පුරුෂ | ලියනු ලබහි/ලියවෙහි | ලියනු ලබහු/ ලියවෙහු |
| උත්තම පුරුෂ | ලියනු ලබමි/ලියවෙමි | ලියනු ලබමු/ ලියවෙමු |

### අතීත කාලය

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ලියන ලදි/ලියවිණි | ලියන ලදහ/ලියවුණුහ |
| මධ්‍යම පුරුෂ | ලියන ලදහි/ලියවිණිහි | ලියන ලදහු/ලියවුණුහු |
| උත්තම පුරුෂ | ලියන ලදිමි/ලියවිණිමි | ලියන ලදමු/ලියවුණුමු |

### අනාගත කාලය

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ලියනු ලබන්නේ | ලියනු ලබන්නෝ |
| මධ්‍යම පුරුෂ | ලියනු ලබන්නෙහි | ලියනු ලබන්නෙහු |
| උත්තම පුරුෂ | ලියනු ලබන්නෙමි | ලියනු ලබන්නෙමු |

ආඛ්‍යාත පදවල සකර්මක අකර්මක භේදය :-

ආඛ්‍යාත පදයක මුල් ස්වරූපය ''ධාතු ප්‍රකෘතිය'' නමින් හැඳින්වේ. එම ධාතු ප්‍රකෘති,

(1) සකර්මක
(2) අකර්මක

යනුවෙන් දෙවැදැරුම් වේ. කර්මයක් අපේක්ෂා කරන ධාතු ප්‍රකෘති සකර්මක ධාතු ලෙස හැඳින්වේ.

නිදසුන් :- **අම්මා බත් උයයි.**
**ස්වාමීන් වහන්සේ දහම් දෙසන සේක.**

කර්මයක් අපේක්ෂා නොකරන ධාතු ප්‍රකෘති ''අකර්මක ධාතු ප්‍රකෘති'' ලෙස හැඳින්වේ.

නිදසුන් :- **දරුවා නිදයි**
**ළමයා හඬයි**

මේ ආකාරයට සකස් වන ක්‍රියා පද මූලික වශයෙන් කොටස් දෙකකට වර්ග කෙරෙයි.

(1) අවසාන ක්‍රියා පද.
(2) අනවසාන ක්‍රියාපද.

වැකියක අවසානයක් හැඟවෙන ක්‍රියා අවසාන ක්‍රියායි.

උපාසක මහතා සිල් සමාදන් වෙයි.
මට්ටකුණ්ඩලී දෙව්ලොව උපදියි.

යම්කිසි ක්‍රියාවක අවසාන බවක් නොහැඟවෙන, වැකියක් අවසන් කිරීමේ බලයක් නැති ක්‍රියාපද අනවසාන ක්‍රියා නම් වෙයි.

(1) අම්මා විහාරයට ගොස් මල් පූජා කළා ය.
(2) බුදුගුණ කියන් සිත් පහන් වේ.
(3) ළමයා පොත බලා නින්දට ගියේ ය.
(4) දූරිය ගී කියමින් නටයි.

### ක්‍රියාකාරකම 4.1

පහත දැක්වෙන ගේය පද රස විඳින්න.

උදෙන් උදෙන් හිරු - නැගෙන වෙලාවේ
රංචු පිටින් එන - මී මැස්සෝ
රුරුං රුරුං රුං - සින්දු කියා ගෙන
මලෙන් මලට යන - මී මැස්සෝ
මලෙන් මලෙන් පැණි - හෙමින් හෙමින් ගෙන
තුඩින් උරාබොන - මී මැස්සෝ
විලේ විලේ මල් - කැලේ කැලේ මල්
සොයා සොයා යන - මී මැස්සෝ
රසින් රසින් පිරි - ගුණෙන් ගුණෙන් වැඩි
දෙනවද මී පැණි - මී මැස්සෝ
ළඟින් ළඟින් ගොස් - මල් පෙතිවල ඉඳ
රහස් කියනවද - මී මැස්සෝ
මටත් මටත් පැණි - දෙතොත් මලක් ඇති
තැනක් කියන්නම් - මී මැස්සෝ
උඩින් උඩින් ගොස් - මලක් උඩට වී
සින්දු කියමු අපි - මී මැස්සෝ

ඉහත ගේය පද ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ගේය පදයේ ඇතුළත් ක්‍රියාපද | එම ක්‍රියා පදවල මූලය |
|---|---|
| | |

## ක්‍රියාකාරකම 4.2

පහත වගුව සම්පූර්ණ කරන්න.

| ධාතු ප්‍රකෘතිය | කර්තෘකාරක වර්තමානකාල ප්‍රථම පුරුෂ බහු වචන | කර්තෘකාරක වර්තමාන කාල උත්තම පුරුෂ බහු වචන | කර්මකාරක අතීතකාල උත්තම පුරුෂ ඒකවචන | කර්මකාරක වර්තමානකාල ප්‍රථම පුරුෂ බහු වචන |
|---|---|---|---|---|
| බල | ________ | ________ | ________ | ________ |
| ________ | කියති | ________ | ________ | ________ |
| ________ | ________ | නටමු | ________ | ________ |
| ________ | ________ | ________ | පැහැදිණිමි | ________ |
| ________ | ________ | ________ | ________ | මැරෙත් |

## ප්‍රයෝජ්‍ය ක්‍රියා:-

වෙනත් අයෙකු ලවා කරවනු ලබන ක්‍රියාව ප්‍රයෝජ්‍ය ක්‍රියාව වේ. ප්‍රයෝජ්‍ය ක්‍රියාව සෑදෙන්නේ ධාතු ප්‍රකෘතියටත් ආඛ්‍යාත ප්‍රත්‍යයටත් අතර ''ව'' යෙදීමෙනි.

| ආඛ්‍යාත පදය | ධාතු ප්‍රකෘතිය | ප්‍රත්‍යය | ප්‍රයෝජ්‍ය ක්‍රියාව |
|---|---|---|---|
| ලියයි | ලිය | යි | ලියවයි. |
| දුවයි | දුව | යි | දුවවයි. |
| නටයි | නට | යි | නටවයි. |
| බලති | බල | ති | බලවති. |

ප්‍රයෝජ්‍ය ක්‍රියාව අතීත, වර්තමාන, හෝ අනාගත අර්ථ ප්‍රකාශ කරයි.

## අතීත කාලවාචී ප්‍රයෝජ්‍ය ක්‍රියාව වරනැගීම.

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | බැලවීය | බැලවූහ |
| මධ්‍යම පුරුෂ | බැලවීහි | බැලවූහු |
| උත්තම පුරුෂ | බැලවීමි | බැලවූමු |

## වර්තමාන කාලයේ ප්‍රයෝජ්‍ය ක්‍රියා වරනැගීම.

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | සනසවයි | සනසවති |
| මධ්‍යම පුරුෂ | සනසවහි | සනසවහු |
| උත්තම පුරුෂ | සනසවමි | සනසවමු |

## අනාගත කාලවාචී ප්‍රයෝජ්‍ය ක්‍රියා වර නැගීම.

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | කියවන්නේ ය | කියවන්නෝය |
| මධ්‍යම පුරුෂ | කියවන්නෙහි | කියවන්නෙහු |
| උත්තම පුරුෂ | කියවන්නෙමි | කියවන්නෙමු |

ප්‍රයෝජ්‍ය ක්‍රියාව විධානයේදී පහත සඳහන් ලෙස යෙදේ.

උදා:- නටවව
බලවන්න
පිසවනු

ප්‍රයෝජ්‍ය ක්‍රියාව පූර්ව ක්‍රියා අර්ථයේදී පහත රූප ගනී.

උදා:- සනසවා
කොඳුරවා
සරසවා

ප්‍රයෝජ්‍ය ක්‍රියාව මිශ්‍ර ක්‍රියා අර්ථයේදී පහත රූප ගනී.

උදා:- ගයවමින්
රඟවමින්
හඬවමින්

ප්‍රයෝජ්‍ය ක්‍රියාව කාලාර්ථයේදී පහත දැක්වෙන රූප ගනී.

උදා:- ලියවන
බලවන
සනසවන

ප්‍රයෝජ්‍ය ක්‍රියාව වාක්‍යවල යෙදීමේදී වාක්‍යවල වෙනස්කම් කීපයක් ද ඇති වේ. ප්‍රයෝජ්‍ය ක්‍රියාව අකර්මක වාක්‍යයක ප්‍රයෝජ්‍ය ක්‍රියාර්ථයේ යෙදෙන විට, එම වාක්‍යය සකර්මක වාක්‍යයක් බවට පත්වේ.

| | | |
|---|---|---|
| උදා:- | දරුවා හඬයි. | මෙහෙකාරිය දරුවා හඬවයි. |
| | වැසි වසියි. | විද්‍යාඥයා වැසි වස්සවයි. |

එසේ ම ප්‍රයෝජ්‍ය ක්‍රියාව සකර්මක වාක්‍යයක යෙදෙන විට, එම වාක්‍යය බහු කර්මක වාක්‍යයක් බවට පත් වේ. එවැනි වැකියක ''ලවා'' යන පූර්ව ක්‍රියා කෘදන්ත නිපාත පදය යෙදේ.

| | | |
|---|---|---|
| උදා:- | ළමයා පොත බලයි. | ගුරුතුමා ළමයා ලවා පොත බලවයි. |
| | වඩුවා ලී ඉරයි. | මිනිසා වඩුවා ලවා ලී ඉරවයි. |

**ක්‍රියාකාරකම 4.3**

පහත සඳහන් ක්‍රියාපද ප්‍රයෝජ්‍ය ක්‍රියා බවට හරවන්න.

1. අදිමි
2. රැකෙහි
3. බලති
4. සැලකුහ

5. වදාරයි
6. ඇද්දාහ
7. කියත
8. ගයමින්
9. දොඩන්නෙහු
10. වයති

## ක්‍රියාකාරකම 4.4

පහත සඳහන් පද්‍ය පාඨවල ඇති ආඛ්‍යාත පද තෝරා ඒවා ප්‍රයෝජ්‍ය ක්‍රියා බවට හරවන්න.

- කියමින් ගී රස මියුරු
  නබමින් පද තල අනුරූ
- එහසුන් පැසුළු පවසමි රස නුසුන් කොට
  අසඳුන් න යන මඟ සලකුණු මෙතැන් සිට
- අ යන්න කියන්න ලොවටම ඇහෙන්න
- බල සුබ නිමිති පෙර මඟ නැකතටත් වැඩි
- ලද සැපතින් තොර නොව ලැබ නිති පිහිට
  වැද සව් සත සැනසෙත්වා මොක් පුරට
- කැලේ තිබෙන කොයි දේවත් රස වේවා
  මලේ බඹරු මෙන් පිරිවර ඇති වේවා
- හඳපානේ වැලි තලා
  සුරකුමරියො මල් සලා
  නටති මෙදෙස බල බලා
  ගිගිරි වළලු පය නොලා
- මඟ මඟ රෙදි වැරලි
  එපුර හැමතැන බලත් පිළිකුලි
- සෙවණ පතා අද මෙන් පැමිණෙන්නෙමි, සුළැඟිල්ලේ එල්ලී
- කුඩා වුවත් හරි සූරයි
  ඇඳපුටු අල්මාරි සපයි
  සොරකු වගේ දෙපස බලයි
  කොස් ඇට මීයා

**ක්‍රියාකාරකම 4.5**

ඉහත ගේය පද ඇසුරෙන් ඔබ සෑදූ ප්‍රයෝජ්‍ය ක්‍රියා පද 10 ක් තෝරා, ඒවා ඇතුළත් කොට වැකි දහයක් නිර්මාණය කරන්න.

## ප්‍රාර්ථනා ක්‍රියා

ආශිංසනයක්, නැතහොත් යහපත් හෝ අයහපත් පැතුමක් ප්‍රකාශ කිරීම සඳහා ප්‍රාර්ථනා ක්‍රියා රූප භාවිත වේ. ප්‍රාර්ථනා ක්‍රියාපදවල විශේෂත්වය වන්නේ ක්‍රියා රූපය අගට ''වා'' ප්‍රත්‍යය එක්වීමයි.

* ඔබට යහපතක් ම වේවා!
* ඔබ දිගුකල් දිනෙහි වා!
* ඔබ සියලු දේ ජය ගනිහි වා!
* ඔබේ ජීවිතය අපට ආදර්ශවත් වේවා!
* ඔබ ජාතියටම මග පෙන්වන්නෙක් වෙහි වා!
* සුවපත් වේවා!
* නිවන් සැප ලැබේ වා!

ඉහත දැක්වෙන්නේ ගුරු හාමුදුරුවන් වහන්සේ තම ශිෂ්‍ය පොඩි හාමුදුරුවන් වහන්සේට ආශිර්වාද කරන වාක්‍ය කීපයකි. ඒවායින් කෙරෙන්නේ ශිෂ්‍ය හාමුදුරුවන් වහන්සේට පිදෙන ප්‍රාර්ථනයකි. මෙසේ කෙරෙන ක්‍රියා ප්‍රාර්ථනා ක්‍රියා නමින් හැඳින්වේ. ප්‍රථම පුරුෂ, මධ්‍යම පුරුෂ හා උත්තම පුරුෂ ආඛ්‍යාතය අගට ''වා'' යන ප්‍රත්‍යය එක්වීමෙන් ප්‍රාර්ථනා ක්‍රියාව සෑදේ.

ප්‍රාර්ථනා ක්‍රියාවක් වර්තමාන කාලයේ වර නගමු.

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ලැබේවා | ලැබෙත්වා |
| මධ්‍යම පුරුෂ | ලැබෙහිවා | ලැබෙහුවා |
| උත්තම පුරුෂ | ලැබෙම්වා | ලැබෙමුවා |

මෙහිදී ප්‍රථම පුරුෂ බහු වචනයෙහි ''ති'' වෙනුවට ''ත්'' ප්‍රත්‍යය ද උත්තම පුරුෂ ඒක වචනයෙහි ''මි'' වෙනුවට ''ම්'' ප්‍රත්‍යය ද වෛකල්පිකව යෙදේ.

ඇතම් විට ප්‍රාර්ථනා ක්‍රියාවේ ''වා'' ප්‍රත්‍යය ලොප් වන අවස්ථා ද දක්නට ලැබේ.

උදා :- සැපවේවා ! - සැපවේ !
සැරදේවා ! - සැරදේ !
දිනේවා ! - දිනේ !

ඉහත දක්වූ ප්‍රාර්ථනා ක්‍රියා සියල්ල සුබ පැතුම් හඟවයි. ප්‍රාර්ථනා ක්‍රියාවේ තවත් පැතිකඩක් ලෙස අසුබ පැතුම් හඟවන ක්‍රියා ද දක්නට ලැබේ.

උදා :- සාප වේවා !
වැනසේවා !
මැරෙම්වා !
හංගවේවා !

මේ නිදසුන්වලින් ද පැතීමක් කෙරෙන නිසා ඒවා ප්‍රාර්ථනා ක්‍රියාවලට අයත්වේ.

### ක්‍රියාකාරකම 4.6

පහත සඳහන් ක්‍රියාපද යොදා වැකි තනන්න.

1. දිනත්වා
2. සුවපත්වේවා
3. සැරදේ
4. ජයවේවා
5. පැරදෙත්වා

### ක්‍රියාකාරකම 4.7

පහත සඳහන් කියමන් හරි නම් ✓ ලකුණ ද වැරදි නම් × ලකුණ ද වාක්‍යය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

1. ක්‍රියා පදයක මුල් ස්වරූපය ධාතු ප්‍රකෘතිය යි. (   )
2. කිරීමක් හෝ වීමක් හඟවන පද නාම පද වේ. (   )
3. ලියන්නේ ය යන ක්‍රියාපදයේ මූලය ''ලිය'' යන්නයි. (   )
4. ''බල සුභ නිමිති පෙර මඟ'' මෙහි ඇති ක්‍රියාපදය ආශිර්වාද ක්‍රියා පදයකි. (   )
5. ''කීහ'' යන්න ''කීවේ ය'' යන්නෙහි බහු වචන පදයකි. (   )
6. ''කියම්වා'' මෙය සකර්මක ක්‍රියාවකි. (   )
7. ස්වාමීනි! අපේ නිවසට වඩින්න. මෙය ආශිර්වාද ක්‍රියාවක් සහිත වැකියකි. (   )
8. කොවුලා නාද කළේය. මෙය සකර්මක වැකියකි. (   )
9. දූදනෙනි, තොපි අප කෙරෙන් දුරුවෙහුවා. මේ වාක්‍යය නිවැරදි ය. (   )
10. ශබ්ද ප්‍රකෘතියකට ආඛ්‍යාත ක්‍රියා ප්‍රත්‍යයක් එක්වීමෙන් ක්‍රියා පද සෑදේ. (   )

# 05. නෛපාතික කෘදන්ත

ක්‍රියා මූල කාල, පුරුෂ, වචන ආදිය පදනම් කරගෙන ප්‍රත්‍යය ගන්වා විවිධ ස්වරූප බවට පත් කළ හැකි ය. ක්‍රියා පද අතර එසේ වෙනස් කළ නොහැකි ක්‍රියා පද වර්ග කිහිපයක් ඇත. වාක්‍යවල නිපාත ස්වරූපයෙන් යෙදෙන එම ක්‍රියා කෘදන්ත නිපාත හෙවත් නෛපාතික කෘදන්ත යනුවෙන් හැඳින්වේ.

ඒවා අතුරින් අපර ක්‍රියා සහ ආවස්ථික ක්‍රියා යනු මොනවාදැයි හඳුනා ගනිමු.

- සුජාත පොඩි හාමුදුරුවෝ බුදුන් වැඳ පන්සලට වඩිති.
- මල පරවී බිමට වැටෙයි.
- ගොවියා කෙත බලමින් සතුටු වෙයි.
- කුකුළන් හඬලද්දී අපි ඒ ගමන ආරම්භ කළෙමු.

ඉහත වැකි දෙස බලන විට පැහැදිලි වන්නේ එක් වැකියක ක්‍රියා පද දෙක බැගින් ඇති බවයි. වාක්‍ය අවසානයේ යෙදී ඇති ප්‍රධාන ක්‍රියාව අවසාන ක්‍රියාවයි. වඩිති, වැටෙයි, වෙයි, කෙළෙමු යන ක්‍රියා පද වැකි පහේ ප්‍රධාන ක්‍රියා පද වේ. වැඳ, පරවී, බලමින්, හඬලද්දී යන ක්‍රියා පද අප්‍රධාන ක්‍රියා පද ලෙස හැඳින්වේ. ප්‍රධාන ක්‍රියාවට විශේෂණ ව යෙදෙන මෙම අප්‍රධාන ක්‍රියා පුරුෂ භේදයක්, ලිංග භේදයක් හෝ සංඛ්‍යා භේදයක් නොතකා, නිපාත ස්වරූපයෙන් එක සේ යෙදෙයි. එසේ හෙයින් ඉහත වැකිවල සඳහන් වැඳ, පරවී, බලමින්, හඬලද්දී යන අප්‍රධාන ක්‍රියා නෛපාතික කෘදන්ත (නිපාත ක්‍රියා) යනුවෙන් හැඳින්වේ. සිංහල භාෂාවේ මෙබඳු ක්‍රියා වර්ග හතරක් දක්නට ලැබේ.

* පූර්ව ක්‍රියා
* මිශ්‍ර ක්‍රියා
* ආවස්ථික නිපාත ක්‍රියා (අසම්භාව්‍ය ක්‍රියා)
* අපර ක්‍රියා

මෙයින් පූර්වක්‍රියා හා මිශ්‍ර ක්‍රියා ඔබ දෙවන වසරේදී හඳාරන්නට ඇත. මෙහිදී ආවස්ථික නිපාත ක්‍රියා (අසම්භාව්‍ය ක්‍රියා) හා අපර ක්‍රියා පිළිබඳ සලකා බලමු.

## ආවස්ථික නිපාත ක්‍රියා (අසම්භාව්‍ය ක්‍රියා)

කියත උන් මෙ තෙපල
ආයේය ඇඳුරු ගුත්තිල

මෙහි "කියත" යන ක්‍රියාවෙන් අවසාන ක්‍රියාව වූ ආයේය යන්න පිළිබඳ අදහසක් පළ කෙරෙයි. ආයේය යන ක්‍රියාව සිදුවන අවස්ථාව ඉන් ප්‍රකාශ වේ. එම අවස්ථාර්ථය ප්‍රකාශ කරන ක්‍රියා ආවස්ථික ක්‍රියා නමින් හැඳින්වේ. අසම්භාව්‍ය ක්‍රියා නමින් ද ඒවා නම් කරේ.

ආවස්ථික ක්‍රියා කොටස් දෙකකට යෙදේ.

1. කාලාර්ථයෙහි ආවස්ථික ක්‍රියා
2. අනියමාර්ථයෙහි ආවස්ථික ක්‍රියා

## කලාර්ථයෙහි ආවස්ථික ක්‍රියා

ආවස්ථික ක්‍රියාවෙන් කාලය පිළිබඳව පැවසේ නම්, එය කාලාර්ථයෙහි ආවස්ථික ක්‍රියා ලෙස හැඳින්වේ.

උදා:- 1. නිළිය ගී ගයද්දී නළුවා රැඟුම් පෑවේය.
2. වැසි වසිත සොරු පලායති.
3. නැගෙත සිත තුටු කොට - රියද පැන නැංගේය අහසට.

## අනියමාර්ථයෙහි ආවස්ථික ක්‍රියා

යමක් සිදුවීමට හෝ සිදු නොවීමට ඇති අවකාශය පිළිබඳ දක්වන අවස්ථා අනියමාර්ථයෙහි ආවස්ථික ක්‍රියා ලෙස හැඳින්වේ.

උදා:- 1. අස බමුණ ගම වැසි
මග රැඳුණ අද තෝ නසි
ගෙට ගිය අඹුව නසි
අතුරුදන්වී කියා මේ ලෙසි

2. දිලිය පස් මහල් පායෙහි මිණි කිරණ
බැලිය හැකි විනම් දුක වැඳ යා කළණ

3. මා එය කරතොත් තොපට ද දන්වමි.

4. ශිෂ්‍යයන් පැමිණියහොත් පන්තිය පැවැත්වෙයි.

ආවස්ථික ක්‍රියාවෙන් කියවෙන කර්තෘ අනුක්ත ව සිටී.

### ක්‍රියාකාරකම 5.1

පහත සඳහන් ආවස්ථික ක්‍රියා පද යොදා වැකිය බැගින් තනන්න.

1. වයතොත්
2. බැලුව
3. දෙසත්දී
4. වැස්සොත්
5. කියත
6. නොකළහොත්
7. යතුදු
8. එත
9. වණත
10. ඇසුව

මීළඟට අපි අපර ක්‍රියා (අනාගත නිපාත ක්‍රියා) පිළිබඳ සලකා බලමු.

## අපර ක්‍රියා (අනාගත නිපාත ක්‍රියා)

**ලබනුව සිව් දහන්**
**පැවිදි කරවා දුන් කමටහන්**

මෙහි ''ලබනුව'' යන්න අනාගත නිපාත ක්‍රියා පදය (අපර ක්‍රියා) නමින් හැඳින්වේ. ලබනුව යන්න අනාගත අර්ථය හඟවන්නකි. ඒනිසා මෙවැනි ක්‍රියා ''අනාගත නිපාත ක්‍රියා'' නමින් හැඳින්වේ. වර්තමානයේ මේ අනාගත ක්‍රියාර්ථය හඟවනු සඳහා ලබන්න, ලබන්නට යන රූප ද යෙදේ.

උදාඃ- 1. නිවන් සුව ලබන්න දහමෙහි හැසිරේ.
2. නිවන් සුව ලබන්නට දහමෙහි හැසිරේ.

### ක්‍රියාකාරකම 5.2

අපර ක්‍රියාර්ථය ප්‍රකාශවන පරිදි වාක්‍ය පහක් නිර්මාණය කරන්න.

# 06. අව්‍යය පද

ජීවකයෝ එපවත් අසා ''ශාස්ත්‍ර නම් බාලය, වැඩි මහලු යැයි යන බැවහර නැති සේ ය. නුවණ නම් වයස් නිසා ඇති වන දෙයක් නොවෙයි. මා දත් ශාස්ත්‍රය මුත් මාගේ වයසින් තමන් වහන්සේට ප්‍රයෝජන කිම් ද? තෙල රැජාව සන්සිඳුවාලා මුත් නොයෙමි. වැළිදු ධන හානියකුත් නොකෙරෙමි. මාගේ ශාස්ත්‍ර බල දක්වා මුත් කිසිවක් නොගන්මි' යි කියා යවූහ...''

ඉහත ඡේදයට අනුව පහත වගුව සම්පූර්ණ කරන්න.

| නාම පද | ක්‍රියා පද |
|---|---|
| | |

ඉහත ඡේදයේ එන නාම පද හෝ ක්‍රියා පද නොවන පද තෝරා පහත වගුවේ සටහන් කරන්න.

| නාම පද හා ක්‍රියා පද නොවන පද |
|---|
| |

ඉහත ඡේදයෙන් ඔබ උපුටාගත් නාම පද සහ ආඛ්‍යාත පද හැර අනෙක් පද "අව්‍යය පද" නමින් හැඳින්වේ. ඒවා මෙසේ ඉදිරිපත් කළ හැකියි.

1 නම්
2 සේ
3 නිසා
4 නො

5 මුත්
6 ද
7 තෙල
8 වැළිදු
9 ත්
10 ඕ

නාම පද හා ආඛ්‍යාත පද වර නැගීමේදී වෙනස් රූප ගන්නා නමුදු, අව්‍යය පද එබඳු වෙනස් රූප නොගනී. කිසිඳු වෙනසකට භාජනය නො වී හැම තැන්හි ම එක ම රූපයකින් රැඳී සිටී. ඒවා අව්‍යය පද නමින් හැඳින්වෙන්නේ ද වරනැගීමෙන් වෙනස් රූප නොගන්නා බැවිනි.

අව්‍යය පදයන්ගේ ප්‍රභේද දෙකක් වේ.

(1) නිපාත පද
(2) උපසර්ග පද

## නිපාත පද

නිපාත පද වාක්‍යයක මුල, මැද, අග යන කොතනක හෝ යෙදේ.

වාක්‍යයක මුල - අනේ, දෙව්දත් නොදිටි මොක්පුර
අහෝ, බල බලව දෙස් පුහුදුන්
වාක්‍යයක මැද - මව **ද** පියා **ද** දරුවන් රකිති
අනුවණ දනන් සහ වාසය නොකරමි
වාක්‍යයක අග - මේ සිදුවූයේ කුමක් **ද**?
ඔහු ඊයේ මෙහි ආවේ සවස **ද**?

භාෂාවේ විවිධාර්ථවත් නිපාත පද හමුවෙයි.

- ''සමුච්චයාර්ථයේ'' ද, ත්, සහ, හා, යන නිපාත යෙදේ.
  මම **ද** ළමයා **ද** ගෙදර යමු.
  මමත් ළමයාත් ගෙදර යමු.
  මව සහ පියා දරුවන් රකිති.
  මව හා පියා දරුවන් රකිති.

- "සමග" යන අර්ථයෙහි සහ, සමග, කැටුව යන නිපාත පද යෙදේ.
  - හේ මා **සහ** කතා නො කෙරෙයි.
  - මම මිතුරන් **සමග** දෙඩමළු වීමි.
  - මව දරුවන් **කැටුව** නගරයට ගියා ය.

- "හැඟීම්" ප්‍රකාශනයෙහි හා :, අහා ! යන නිපාත පද යෙදේ.
  - **හාඃ** පොඩි හාමුදුරුවන්ට තැග්ගක්.
  - **අහා!** උන්දැගේ උස.

- සමානාර්ථයෙහි මෙන්, සේ, වැනි, බඳු ආදි නිපාත යෙදේ.
  - ගොයකු **මෙන්** බඩගා නොයව්.
  - සුරඟනක **සේ** දිස්වෙයි.
  - පෙර සුරඟනන් **වැනි** අඟනෝ සොඳුරු රැසිරෙනි.
  - හේ රූ සිරින් මල්සරා **වගේ** ය.
  - කදෝපැණියෙකු **බඳු** ආලෝකයක් ඇතින් දිස්විය.

- කාලාර්ථයෙහි නිති, නිතොර, ඉක්බිති, දූන්, යළි, පසුව, ඉතින් ආදී නිපාත පද යෙදේ.
  - **නිති** පන්සිල් රකිමු.
  - **නිතොර** නමදිමි මුනිඳු සරණත.
  - **ඉක්බිති** ගිරවාණෝ වසුරු පිඩක් හෙළා පලා ගියෝ ය.
  - එති'යි **දූන් දූන්** කිවුය ඉඳුරා.
  - මුලිනුපුටා නොදැමූ ගසෙහි **යළි** අංකුර නැගේ.
  - ඒ අස්න **පැසුළු** පවසමි.
  - **ඉතින්** අපට කාගේ පිහිටක් ද?
- සීමාර්ථයෙහි තෙක්, දක්වා යන නිපාත පද යෙදේ.
  - හේ සඳුද සිට සිකුරාද **තෙක්** වැඩ කරයි.
  - මම මහනුවර **තෙක්** දුම්රියෙන් ගමන් කළෙමි.
  - ලිපිකරුවා සෙනසුරාද **දක්වා** වැඩ කළේ ය.
  - මම මහනුවර **දක්වා** බස්රියෙන් ගමන් කළෙමි.

(මෙහිදී ලිපිකරුවා වැඩ කළේ සිකුරාද තෙක් පමණි, මා බස්රියෙන් ගමන් කළේ මහනුවර සීමාව තෙක් පමණි)

- විනාර්ථයෙහි විනා, හැර, මිස, මිසක්, මුත් යන නිපාත පද යෙදේ.
    - ඉසිවතුන් **විනා** මේ ගත් කාට නො රිසි ද.
    - ගඟෙන් **විනා** මුහුදෙන් පැන් පිව හැකි ද.
    - සත් පුරුෂයන් **හැර** ලොවට සෙතක් කරන්නෝ කවරහු ද?
    - දෙමාපියන් **හැර** දරුවනට වැඩ වඩන්නෝ කවරහු ද?
    - අහරින් **මිස** අනෙකකින් කය නොවැඩේ.
    - දුදනන් **මිස** සෙස්සෝ අනුනට නින්ද නොකෙරෙති.
    - දෙවියෝ අමරස **මිසක්** අන් අහර නොබුදිති.
    - කුසගිනි ඇතියනට බතින් **මිසක්** අනෙකකින් පලක් නැත.

- විකල්පාර්ථයෙහි හෙවත්, නොහොත්, හෝ, වැනි, නිපාත පද යෙදේ.
    - මහසෙන් රජ **හෙවත්** මින්නේරි දෙවියෝ අදත් ගරු බුහුමනට ලක්වෙති.
    - දෙමාපියෝ **නොහොත්** ගුරුවරු දරුවන්ට යහපත කියා දෙති.
    - ළමයා **හෝ** මම ඉක්මනින් එමි.

- අවධාරණාර්ථයෙහි "ම" නිපාතය යෙදේ.
    - ජාතික ගීය ගැයෙද්දී හැම දෙනා **ම** නැගී සිටියහ.

- නිෂේධාර්ථයෙහි "එපා" නිපාතය යෙදේ.
    - **එපා එපා** මස් කන්නට කිරි අම්මාගේ.

- ආමන්ත්‍රණාර්ථයෙහි එම්බා, එම්බල, කොල, බොල යන නිපාත යෙදේ.
    - **එම්බා** ගහලය, එක කඩු පහරින් මගේ ගෙල සිඳ දමව.
    - **එම්බල** භටයිනි, වහා යුද්ධයට සැරසියව්.
    - **කොල** මේ ගඟ ගැඹුරු ද?
    - හැබෑනේන්නම් **බොල** මෙතන ඉන්නෙ පස්දෙනයි නෙ.

- ශ්‍රැති සූචනාර්ථයෙහි "ල" "ලු" නිපාත යෙදේ.
    - සමහරු මෙබස් කියත් **ල**.
    - ඔහු ඊයේ ගමට ගියේ **ලු**.

❍ තාදර්ථයෙහි පිණිස, සඳහා, වස්, පරිදි, ලෙස යන නිපාත යෙදේ.

පොඩි හාමුදුරුවෝ පිඩු සිඟනු **පිණිස** ගමට පිවිසෙති.
රට ගොඩනගනු **සඳහා** වැඩ කරමු.
රට රකිනු **වස්** සෙබළු දිවි පිදූහ.
මතු රැකෙනා **ලෙස** කටයුතු කරමු.
සිසුවා උගතෙකු වන **පරිදි** වැඩ කරයි.

❍ වාක්‍ය සම්බන්ධාර්ථයෙහි නමුත්, එහෙත් යන නිපාත යෙදේ.

ඔහු සේවයට ගිය **නමුත්** ආපසු නො ආයේය.
පෙර නම් වැසි සමයයි. **එහෙත්** දැන් දැඩි නියඟයකි.

මීට අමතරව භාෂාවේ තවත් නිපාත පද බොහොමයක් ඇත.

## ක්‍රියාකාරකම 6.1

දිනට නියමිත ඉතිහාස පාඩම හෝ භූගෝල පාඩම හෝ වරක් නැති නම් දෙවරක් පමණ කියවූ කල එහි වූ සමහර වැදගත් කරුණු මතකයෙහි රැඳෙන්නේ ය. කෙනෙකුගේ දේශනයකට සවන් දී සිටි කල ද සිදු වන්නේ එවැන්නක් ම ය. පුවත් පතක පළවන වැකියක් කියවූ විට ද එහි ඇති අනවශ්‍ය කරුණු සියල්ලම පසෙක තිබියදී ඔබට අවශ්‍ය සේ ඔබ සලකන කරුණු පමණක් සිතෙහි ධාරණය වන්නේ ය. එසේ වැදගත් සාරවත් සහ ප්‍රයෝජනවත් විස්තර පමණක් පිඩු කර ගැනීම එතරම් පහසු කටයුත්තක් නොවේ. ඒ සඳහා යම්කිසි ක්‍රමවත් වූ ද, විධිමත් වූ ද මානසික අභ්‍යාසයක් ඕනෑ කෙරේ.

ඉහත ඡේදයේ ඇති නිපාත පද තෝරන්න.

## ක්‍රියාකාරකම 6.2

එම නිපාත පද යොදා ගනිමින් අරුත් පැහැදිලි වන සේ වැකි ගොඩ නගන්න.

## ක්‍රියාකාරකම 6.3

පහත දැක්වෙන වගුවෙහි "අ" කොටසේ එන නිපාත පද "ආ" කොටසේ එන අර්ථය හා ගළපන්න.

| අ | ආ |
|---|---|
| 1. කාලාර්ථය | ක් |
| 2. සහාර්ථ | විට |
| 3. සමුච්චයාර්ථ | අහා: |
| 4. භාවාර්ථ | සමග |
| 5. විනාර්ථ | ද |
| 6. ප්‍රශ්නාර්ථ | එහෙත් |
| 7. නිෂේධාර්ථ | මිස |
| 8. අවධාරණාර්ථ | තෙක් |
| 9. ශ්‍රැති සූචනාර්ථ | ම |
| 10. සීමාර්ථ | ලු |
| 11. තාදර්ථ | එපා |
| 12. වාක්‍ය සම්බන්ධාර්ථ | පිණිස |

## උපසර්ග

ධාතු ප්‍රකෘතියක හෝ නාම ප්‍රකෘතියක අර්ථය විශේෂ වන ආකාරයෙන් එම ප්‍රකෘතියට මුලින් යෙදෙන අව්‍යය පද "උපසර්ග" නමින් හැඳින්වේ. ප්‍රකෘතියකට උපසර්ග එකතු වූ පසු එය තනි පදයක් වශයෙන් සැලකේ.

උපසර්ග එක් වීමෙන් ප්‍රකෘතිය වෙනස්කම් කීපයකට භාජනය වේ.

(1) අර්ථය තීව්‍ර කිරීම
(2) විරුද්ධාර්ථයක් ගෙන දීම
(3) අර්ථයට බාධා කිරීම

ප, පර, අව, ස, අනු, නි, දු, වි, අ, අදි, සු, උ, අබි, පරි, උප/අව, අප, පස්, පිළි, අති/ඉ, පි ආදී වශයෙන් සිදත් සඟරා ව්‍යාකරණයේ උපසර්ග විස්සක් ඇති බව සඳහන් වෙයි. එහෙත් උපසර්ග සංඛ්‍යාව සංඛ්‍යාත්මක වශයෙන් සීමා කළ නොහැක.

(1) අර්ථය තීව්‍ර කිරීම

| | | | |
|---|---|---|---|
| උදා:- | මිහිරි | - | සුමිහිරි (සු උපසර්ගය) |
| | රස | - | අතිරස (අති උපසර්ගය) |
| | බල | - | පබල (ප උපසර්ගය) |

ඉහත දැක්වුණු පදවල විශේෂත්වය සලකා බලමු. පළමු පදයට වඩා දෙවන පදයෙහි අර්ථය තීව්‍ර කිරීමක් හැඟවේ. එය සිදුවන්නේ පදයට මුලින් එක්වූ උපසර්ගය නිසා ය.

උපසර්ග පදයක් කේවලව ගත් කල ඍජු අර්ථයක් ප්‍රකාශ කළ නොහැකි ය. නාම පදයක් උපසර්ග පදයක් හා එක්වූ පසු අර්ථවත් වෙයි.

ඉහත උදහරණ සැලකීමේ දී,

පේෂල

මිහිරි

බල

විශේෂ

යන පද සඳහා පිළිවෙළින් සු, අති, ප, සු යන උපසර්ග එක් වූ පසු එම පදවල අර්ථයෙහි විශේෂත්වයක් පෙන්නුම් කෙරේ.

(2) විරුද්ධාර්ථයක් ප්‍රකාශ කිරීම

| | | | |
|---|---|---|---|
| උදා:- | මල | - | නිමල (නි උපසර්ගය) |
| | බල | - | දුබල (දු උපසර්ගය) |
| | ගුණ | - | අවගුණ (අව උපසර්ගය) |

(3) අර්ථයට බාධා කිරීම

| | | | |
|---|---|---|---|
| උදා:- | දන | - | දුදන (දු උපසර්ගය) |
| | බල | - | අබල/දුබල (දු/අ උපසර්ගය) |
| | පවත් | - | අපවත් (අ උපසර්ගය) |
| | මාන | - | අවමාන (අව උපසර්ගය) |

ඉහත සඳහන් පද විමසීමේදී පැහැදිලි වන්නේ මුල් පදවලට උපසර්ගය එක්වූ පසු දෙවන පදය අර්ථයට බාධා පමුණුවන බවයි.

## ක්‍රියාකාරකම 6.4

(1) පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| උපසර්ග පද | අර්ථය තීව්‍ර කරයි | විරුද්ධ බවක් ප්‍රකාශ කරයි | අර්ථයට බාධා කරයි |
|---|---|---|---|
| පබල<br>නිර්මල<br>සුබල<br>නිර්ගුණ<br>අපකීර්ති<br>පිළිතුරු<br>අවජාත<br>අධිපති<br>උදුළ<br>අවධාරණ | | | |

## ක්‍රියාකාරකම 6.5

පහත සඳහන් පදවලට යෝග්‍ය උපසර්ග යොදමින් වාක්‍ය නිර්මාණය කරන්න.

1. මිහිරි　　2. දුක්　　3. නම්බුව
4. දුළ　　5. ලජ්ජී

## ක්‍රියාකාරකම 6.6

පහත සඳහන් පද්‍යයේ උපසර්ග යෙදුණු පද තෝරා, උපසර්ගය වෙන් කොට දක්වන්න.

පිරිසිදු සුසිනිඳු සළු ඇඳ　　　ගන්නට
සුදනෙක් වෙනවද දුදනෙක්　　　කිසිවිට
සුවිසල් දුර්ගුණ කෙනෙකුට　　　ඇතිවිට
අවපස සඳලෙස පිරිහෙයි　　　හැමවිට

# 07. වාක්‍ය නිර්මාණය

## වාක්‍ය නිර්මාණ පරිචය

පරිපූර්ණ අර්ථයක් පළ කරන්නේ වාක්‍යය යි. වාක්‍ය පද කීපයක එකතුවකි. විභක්තියකින් කෙළවර වන්නේ පද යනුවෙන් ව්‍යාකරණයෙහි දැක්වේ. පද නොවූවක් කිසිවිටෙකත් වාක්‍යයක නොයෙදිය යුතු යනු ව්‍යාකරණයේ නියමය යි.

''ළමයා අඬයි''

මෙය පරිපූර්ණ වාක්‍යයකි. එහි ඇත්තේ උක්තය සහ ආඛ්‍යාතය පමණි. එහෙයින් පරිපූර්ණ වාක්‍යයක තිබිය හැකි අවම අවයව ගණන දෙකකි. ව්‍යාකරණයෙහි නියමය අනුව වාක්‍යයක තිබිය හැකි අවයව මෙසේ ය.

1. උක්තය
2. උක්ත විශේෂණය
3. කර්මය
4. කර්ම විශේෂණය
5. ආඛ්‍යාතය
6. ආඛ්‍යාත විශේෂණය
7. ආඛ්‍යාත විස්තාරකය

මේ අංග කිහිපයට එක් වූ වාක්‍යයක් නම්,
''දක්ෂ මිනිසා කුළු හරකා රැහැනින් බැඳ වහා හීලෑ කරයි.''

| | |
|---|---|
| උක්තය | - මිනිසා |
| උක්ත විශේෂණය | - දක්ෂ |
| කර්මය | - හරකා |
| කර්ම විශේෂණය | - කුළු |
| ආඛ්‍යාතය | - හීලෑ කරයි |
| ආඛ්‍යාත විශේෂණය | - වහා |
| ආඛ්‍යාත විස්තාරකය | - රැහැනින් බැඳ |

සිංහලයේ වාක්‍ය නිර්මාණයේ දී එහි ආකෘතික ලක්‍ෂණ දක්නට ලැබේ. පළමුව උක්තයත්, අනතුරුව කර්මයත්, ඊටත් අනතුරුව ආඛ්‍යාතයත් යෙදීමයි.

බල්ලා බළලා මරයි.

මෙම වාක්‍යයෙහි අදහස ආධුනිකයෙකුට ගැටලුවක් වීමට ඉඩ ඇත. බල්ලා හා බළලා යන රූප දෙක ම එකක් වැනි වීම ය. මේ ගැටලුව නිරාකරණය කරගැනීම සඳහා කථනයේ දී ''බල්ලා බළලාව මරයි'' යනුවෙන් කර්මයට ''ව'' යන්නක්, එකතු කරයි. එහෙත් ලේඛනයේ දී එවැනි යෙදීම් ශිෂ්ට සම්මත ලෙස නොපිළි ගැනේ.

එහෙත් වාක්‍යයේ ආකෘතික ලක්ෂණ සලකා බැලුවහොත් ඉහත දැක්වූ අන්දමේ ගැටලුවක් දැක්වීමට ඉඩක් නැත.

වාක්‍ය ප්‍රභේද කීපයක් වෙයි.

(1) සරල වාක්‍ය
(2) සංකීර්ණ වාක්‍ය
  (i) සංහත වාක්‍ය
  (ii) සංකුල වාක්‍ය

## 1) සරල වාක්‍ය

එක ම උක්තයක් හා එක ම ආඛ්‍යාතයකින් යුක්ත වාක්‍ය සරල වාක්‍යයි.

උදා : ගොවියා කෙත රකියි.
හේ ආහාර ගනී.
ළමයා පාසලට යයි.
දූරිය ඇඳෙහි නිදයි.
ගොනා තණ කයි.

## 2) සංකීරණ වාක්‍ය

එක ම උක්ත පදයකින් හා විවිධ ක්‍රියා පදවලින් ද ප්‍රධාන ආඛ්‍යාත පදයකින් ද යුක්ත වූයේ සංකීර්ණ වාක්‍යයි.

උදා : ''ගොවියා අලුයම පිබිද කා, බී, දැකැත්ත රැගෙන කුඹුරට ගොස්, ගොයම්

කපා ගොඩ ගසා, ගෙදර අවුත් බත් කා, වැසි වැටේදෝයි සිතමින් ගිමන් හරියි.

මෙහි ''ගිමන් හරියි'' යනු ප්‍රධාන ආඛ්‍යාතය යි. පිබිද, කා, බී, රැගෙන, ගොස්, කපා, ගොඩ ගසා, අවුත්, සිතමින් යන ක්‍රියා රූප නේපාතික ක්‍රියා යි.

i) සංහත වාක්‍ය

එක ම වාක්‍යයක සෑම අන්තර් වාක්‍යයක් ම ප්‍රධාන වෙයි.

''එවක් පටන් සිටු දියණියෝ කවති. පොවති. ඉස් සෝදති. නාවති.''

මෙහි සෑම අන්තර් වාක්‍යයක් ම ආඛ්‍යාතය ප්‍රධානත්වය ඇති වාක්‍ය කීපයකින් සමන්විත ය.

ii) සංකුල වාක්‍ය

සංකීර්ණ සංහත යන වාක්‍ය සම්මිශ්‍රණයෙන් යුක්ත වූයේ, සංකුල වාක්‍ය වේ.

''නොකඩවා, වන පොත් කෙරේ නම් ධාරණය වැඩේ. ස්මෘතිය යහපත් වේ. උගතෙක් වේ.

**ක්‍රියාකාරකම 7.1**

පහත සඳහන් වාක්‍ය කවර වාක්‍ය ගණයට අයත් ද යි නම් කරන්න.

1. වසු පැටවා දුවයි. පනියි. හඬ නගයි.
2. දූරිය පාසලින් ගෙදර ආවා ය.
3. නියඟයට වැව සිඳෙත් ම ජලචර ජීවීහු දුකට පත් වෙති. මියෙති.
4. ගුවන් යානය අහසට නැගිණි.
5. කුණ්ඩලකේශී, ''ස්වාමීන් මිය යන්නට පළමු ඔබෙන් අවසර ගන්නට අවශ්‍ය යැ''යි කීවා ය.
6. ගුරුවරයා ද, ශිෂ්‍යයා ද එකවිට ම පාසල කරා පිය නැගුවෝ ය.
7. වහන්ස, මඳක් ඉවසනු මැනවි !

8. පිරිවෙන පස්වරු 5.30ට වැසේ.
9. තමන්ට අවමන් කරන කොල්ලන්ට බණිමි'යි ඉබ්බා කට ඇරියේ ය.
10. නා හිමියෝ වන් පිළිවෙත් පිරීමෙහි අනුසස් දැක්වූ හ.

## නිවැරදිව වැකි ගොඩනගමු

වාක්‍ය නිර්මාණයේදී වාක්‍ය රීති අනුගමනය කිරීම නිවැරදි වාක්‍ය නිර්මාණයට මඟ පාදයි. මෙහි දී වඩාත් අවධානයට යොමු විය යුත්තේ උක්ත ආඛ්‍යාත පිළිබඳ ව යි.

❍ උක්තය හා ආඛ්‍යාතය වචනයෙන් ද පුරුෂයෙන් ද සමාන විය යුතු ය.

''මිනිසා යයි''

මෙහි මිනිසා යනු ප්‍රථම පුරුෂ ඒක වචන නාම පදයකි. ඒ නිසා ''යයි'' යන ආඛ්‍යාත රූපය ද ප්‍රථම පුරුෂ ඒක වචනයකි. මෙහි දී ඉහත දැක්වුණු සරල රීතිය අනුගමනය කිරීම නිසා මෙම වාක්‍යය නිදෙස් ය.

''මිනිස්සු යති''

මෙය මුල් වාක්‍යයට වඩා තරමක් වෙනස් ය. මේ වෙනස ඇති වූයේ නාම පදය බහු වචනයක් වීම නිසා ය. නාම පදය බහු වචනයක් වීම නිසා මුලින් දැක්වුණ රීතිය අනුව ආඛ්‍යාතය බහු වචනයක් විය යුතු ය. එහෙයින් ''මිනිස්සු යති'' යන වාක්‍යයේ නාම පදය ප්‍රථම පුරුෂ බහු වචන වේ. ආඛ්‍යාතය ද ප්‍රථම පුරුෂ බහු වචන පදයකි.

''මම යමි''

''මම'' යනු උත්තම පුරුෂ සර්ව නාම පදයකි. ඊට ගැළපෙන අයුරින් ''යමි'' යන ආඛ්‍යාත පදය උත්තම පුරුෂ ද ඒක වචන ද වෙයි. වචන යෙදීම සමාන වුවත් පුරුෂයෙන් අසමාන නම් එම වාක්‍යය සදෙස් ය. නිදසුනක් ලෙස දක්වතොත් ''මම යයි'' යන වාක්‍යය සදෙස් ය. උක්තයත් ආඛ්‍යාතයත් ඒක වචන වුවත් පුරුෂයෙන් අසමාන වන හෙයිනි. ''මම'' යනු උත්තම පුරුෂ නාම පදයකි. ''යයි'' යනු ප්‍රථම පුරුෂ ආඛ්‍යාත පදයකි.

මේ නිසා උක්ත ආඛ්‍යාත ප්‍රයෝගයේදී මේ සරල රීති මෙන් ම ඊට විකල්ප රීති ද දක්නට ලැබේ.

ඉහත දක්වූ රීතියට විකල්ප රීතියක් නම් ''ඕ'' විභක්තිය ගත් නාම පදය ඒක වචන වුවත්, ඒ සමග යෙදෙන ආඛ්‍යාත පදය බහු වචනයක් වේ. මේ නවත් රීතියකි.

රජ්ජුරුවෝ උයනට යති.
බෝධි සත්ත්වයෝ පෙරුම් පුරති.
මහ බෝසතාණෝ නිදන්නට වන්හ.

සමූහවාචී නාමවල ''ඒ'' විභක්ති ගත් උක්තය බහු අර්ථ වුවත් ඒ හා යෙදෙන ආඛ්‍යාතය ඒක වචනයක් වෙයි.

මහ දෙනේ කෙලෙසුන් වනසයි.
ඇමති ගෙණේ රජගෙට පිවිසෙයි.
බඹර ගෙණේ නිරිඳු පොබයයි.

අචේතන ගණයේ නාම භාවිතයේදී උක්තය බහු වචන වුවත් ඒ හා යෙදෙන ආඛ්‍යාතය ඒක වචන වේ.
මල් විකසිත වේ. (වෙයි)
ගල් පෙරළේ. (පෙරළෙයි)

එහෙත් බහු වචන ප්‍රත්‍යය ගත් කල්හි, අචේතන ගණයේ පද වුවත් සාමාන්‍ය රීතිය අනුව බහු වචන ආඛ්‍යාතය ම ආරක්ෂා කරයි.

ගංගාවෝ ගලා බසිති.
තාරකාවෝ බැබළෙති.
පුෂ්පයෝ විකසිත වෙති.
රුක්හු පෙරළෙති.
බෙරහු ගුගුළෝ ය.

සමූහාර්ථයේ ''ද'' නිපාතයෙන් එක් කෙරෙන උක්ත පද කීපයක් ඇති වාක්‍යයක ඒ උක්ත පද අතර උත්තම පුරුෂ උක්තයක් ඇතොත් ආඛ්‍යාතය උත්තම පුරුෂ බහු වචනයෙන් සිටී. උත්තම පුරුෂය නැතහොත් මධ්‍යම පුරුෂය බලවත් වේ. සියල්ල ප්‍රථම පුරුෂයට අයත් නම් ආඛ්‍යාතය ප්‍රථම

පුරුෂ බහු වචනයෙන් සිටී.

උදා : ළමයා ද තෝ ද මම ද ගෙදර යමු.
ළමයා ද මිනිසා ද තෝ ද ගෙදර යහු.
මිනිසා ද ළමයා ද බල්ලා ද ගෙදර යති.

''හෝ'' නිපාතයෙන් බැඳුණු උක්ත පද කීපයක් ඇති වාක්‍යයක ආඛ්‍යාතය ආසන්නතම උක්තයට සමාන වේ.

ළමයා හෝ මම හෝ වැඩ කරමි.
බල්ලා හෝ බළල්ලු හෝ මීයන් අල්ලති.
මම හෝ ළමයා හෝ වැඩ කරයි.

සංශයාර්ථයේ හෝ වාර්තා කථනයේ ''යි'' නිපාතයෙන් බැඳුණු අන්තර් වාක්‍යයක කර්තෘ අනුක්ත විභක්තියෙන් ද ක්‍රියා රූපය කර්තෘ ගැන නොතකා හැම විට ම ප්‍රථම පුරුෂ බහු වචනයෙන් ද සිටී.

මා අකුරු උගනිති'යි ගුරුවරයා සිතයි.
ඔවුන් අද මෙහි එති'යි අම්මා පැවසුවා ය.
ඇඳුර තුටු නොවෙති'යි නොසිත අප සිප් නොදති'යි
අප සුවසේ වෙසෙති'යි සොහොයුරිය ලියා යැවුවා ය.
එක්සත් ජාතීන් නිව්යෝක්හි රැස් වෙති'යි රොයිටර් වාර්තා කරයි.
හමුද භටයන් සැඟවී සිට පහර දෙති'යි මාධ්‍ය වාර්තා කරයි.

භාෂාවේ ඇතැම් වචන ස්වභාවයෙන් ම බහු වචන නාම පද ලෙස සැලකේ.

කෙනෙක් මෙසේ පවසති.
අයෙක් නටත් සුරා මතින්
ඇතමෙක් පවට බිය නොවෙති.
ඇතැම්හු කුසලයට කම්මැළි වෙති.
සමහරු නන් දෙඩවති.
කවුරු පැරකුම් රජුට සරිවෙත් ද?

උක්තය ''වහන්සේ'' යනුවෙන් අවසන් වෙතොත් ආඛ්‍යාතය ''සේක'' යනුවෙන් අවසන් වෙයි.

බුදුන් වහන්සේ දෙව්රමට වැඩි සේක.
භික්ෂූන් වහන්සේ සිඟා වඩින සේක.
ස්වාමීන් වහන්සේ බණ දෙසන සේක.

උක්තය 'දැ' යන්නෙන් අවසන් වෙතොත් ආඛ්‍යාතය 'දැ' යන්නෙන් අවසන් විය යුතු ය. නැතහොත් බහු වචන විය යුතු ය.

වහන්සේ දැ සිඟා වඩින දැ ය/වඩිති.

උන් දැ ගමට යන දැ ය/යති.

හෙරණුන් දැ මළුපෙත් අමඳින දැ ය/අමදිති.

ආණ, අණු, අණි ප්‍රත්‍යය යෝගයෙහි ආඛ්‍යාතය බහු වචන වේ.

පියාණෝ ඔවා දෙති.

තෙරණුවෝ සිඟා වඩිති.

මැණියෝ බත පිසති.

මලණ්ඩියෝ කිරට ලොල් වෙති.

අම්මණ්ඩි ඉණට පලා තෙළා ගෙනෙති.

ඉහතින් දක්වා ඇත්තේ වාක්‍ය නිර්මාණය සම්බන්ධ ව කර්තෘ උක්ත වන වාක්‍ය රීති කිහිපයකි. යම් කිසි අදහසක් දැක්වීමේ දී කර්තෘ උක්ත වන්නා සේ ම එහි කර්මය උක්ත වන ආකාරයෙන් ද දැක්වීමේ හැකියාව ඇත. කර්තෘ උක්ත වන වාක්‍ය කර්තෘකාරක වාක්‍ය ලෙසත් කර්මය උක්ත වන වාක්‍ය කර්මකාරක වාක්‍ය ලෙසත් හැඳින්වේ.

### ක්‍රියාකාරකම 7.2

පහත සඳහන් වාක්‍ය සදෙස් නම් නිදෙස් කොට ලියන්න.

1. මිනිසුන් දිනපතා වැඩට යති.
2. දැරියක් සමග මහමග ගමන් ගත් කාන්තාවක් නයෙක් දැක බියට පත් වූවා ය.
3. පෙරේද වට වැස්සෙන් ගහකොළ ගෙවල් දොරවල් කැඩී බිඳී ගියේ ය.
4. සැම ගැමියෙක් ම තම සහයෝගය දුන් හෙයින් ගම ඉක්මණින් ම දියුණුවට පත් විය.
5. නාගරිකයෝ ගැමියන් මෙන් නොව අතෘප්තිමත් ජීවිත ගත කරයි.
6. සඟරුවන මහ මග වඩිති.
7. කණ උන්දැ නා ගහ මුල ගෙදර විසී ය.
8. බුදුගොස් හිමියෝ මේ දිවයිනට පැමිණ සිංහල අටුවා පාලියට නැගුවේ ය.
9. ගැහැනියක් ලෙස වෙස් වලාගත් වික්‍රමපාල හඳුනා ගැනීමට දෙමහල්ලන් අපොහොසත් විය.
10. ජපනුන් හපනුන් ය.

## කර්මකාරක වාක්‍ය

වාක්‍ය නිර්මාණයේ දී දත යුතු වැදගත් කරුණකි, කර්තෘකාරක හා කර්මකාරක භේදය.

පහත වැකි දෙස බලමු.

නාහිමි දහම් දෙසයි.
ඉගෙනීමේ අගය උන්වහන්සේ පැහැදිලි කරති/කරන සේක.
උන්වහන්සේ අලුත් අදහස් ප්‍රකාශ කරති/කරන සේක.
සෑම දෙනාම සතුට පළ කරති.
බොහෝ දෙනෙක් එය ආදර්ශයට ගත්හ.

පහත වාක්‍ය ද කියවා බලමු.

* නාහිමි විසින් දහම් දෙසෙයි/දෙසනු ලබයි/දෙසනු ලැබෙයි.
* ඉගෙනීමේ අගය උන්වහන්සේ විසින් පැහැදිලි කෙරෙයි/කරනු ලබයි/කරනු ලැබෙයි.
* උන්වහන්සේ විසින් අලුත් අදහස් ප්‍රකාශ කෙරෙයි/කරනු ලබයි/ලැබෙයි.
* සැමදෙන විසින් ම සතුට පළ කෙරෙයි/කරනු ලබයි/ලැබෙයි.
* බොහෝ දෙනා විසින් එය ආදර්ශයට ගැණිනි/ගනු ලැබුණි/ලැබිණි.

ඉහත පළමු කොටසේ වැකිවලින් දෙන අදහස දෙවන කොටසේ වැකිවලින් ද ඉදිරිපත් කෙරෙයි. එහෙත් එම වාක්‍යවල රටා එකිනෙකට වෙනස් ය. එක් එක් වාක්‍යයේ උක්තය හා ආඛ්‍යාතය වෙන් කරමු.

| | |
|---|---|
| 1. නාහිමි | දෙසයි |
| 2. උන්වහන්සේ | පැහැදිලි කරති |
| 3. උන්වහන්සේ | ප්‍රකාශ කරති |
| 4. සෑම දෙනාම | පළ කරති |
| 5. බොහෝ දෙනෙක් | ආදර්ශයට ගත්හ |

| | |
|---|---|
| 1. දහම | දෙසෙයි |
| 2. ඉගෙනීමේ අගය | පැහැදිලි කෙරෙයි |
| 3. අලුත් අදහස් | ප්‍රකාශ කෙරෙයි |
| 4. සතුට | පළ කෙරෙයි |
| 5. එය | ආදර්ශයට ගැණුනි |

මෙහි දී කරුණු කීපයක් අපට පැහැදිලි වනු ඇත.

* එක ම අදහස කීප ආකාරයකට ප්‍රකාශ කළ හැකි ය.

* එහි දී මූලික ව වාක්‍යයේ උක්තය හා ආඛ්‍යාතය වෙනසකට ලක් වේ.

* මුල් වාක්‍ය පහේ කර්තෘ උක්ත වී ඇත.

* දෙවන වාක්‍ය පහේ උක්ත වී ඇත්තේ කර්මයයි.

| |
|---|
| කර්තෘ උක්ත වන වාක්‍යය කර්තෘකාරක වාක්‍ය වේ. |

| |
|---|
| ආඛ්‍යාතයෙන් කර්මය උක්ත වේ නම් එම වාක්‍ය කර්මකාරක වේ. |

කර්තෘකාරක වාක්‍යක් කර්මකාරක වාක්‍යයක් බවට හැරවීමේ දී ඔබේ අවධානයට ලක්විය යුතු කරුණු කීපයකි.

* කර්තෘකාරක වාක්‍යයේ තිබෙන උක්ත කර්තෘ පදය අනුක්ත වේ.

* අනුක්ත වූ කර්තෘ පදයට පසුව ''විසින්'' යන නිපාතය යෙදේ.

* කර්තෘකාරක වාක්‍යයේ කර්ම පදය උක්තය බවට පත්ව ප්‍රථමා විභක්තිය ගනී.

* කර්තෘකාරක වාක්‍යයේ ක්‍රියාපදය කර්මකාරකය අනුව සැකසේ.

* කර්මකාරක වාක්‍යයේ දී ක්‍රියාපදයට ''ලබ ධාතු'' රූප එක් කළ හැකි ය.

* කාලය (අතීත/අනතීත) සහ සංඛ්‍යාව (ඒක වචන/බහු වචන) ගැන ඔබේ අවධානය විශේෂයෙන් යොමු කළ යුතු ය.

* සිංහලයේ සමහර ක්‍රියාපද සමග කර්මයක් නොයෙදේ. ඒවා අකර්මක ක්‍රියාපද වේ. ඒවා කර්මයක් ඇති ලෙස සලකා කර්මකාරකයෙන් තැබීමට උත්සාහ නොගන්න.

* ප්‍රකාශය වඩා සිත් ගන්නේ කර්තෘ උක්ත කළොත් ද? කර්මය උක්ත කළොත් දැ යි සලකා කාරකය නිගමනය කරන්න.

## ක්‍රියාකාරකම 7.3

කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය සඳහා උදාහරණ කීපයක් පහත දැක්වේ. එම වාක්‍යවල උක්තපදය හා ක්‍රියා පදය සොයන්න.

| කර්තෘකාරක | කර්මකාරක |
|---|---|
| 1) ගුරුතුමා මා පැසසීය. | 1) ගුරුතුමා විසින් මම පැසසුණෙමි. |
| 2) දෙමාපියෝ අප රැක්කාහ. | 2) දෙමාපියන් විසින් අපි රැකුණෙමු. |
| 3) විනිසුරුවෝ බයිසිකල් සූරයන් තෝරති. | 3) විනිසුරුවන් විසින් බයිසිකල් සූරයෝ තේරෙති. |
| 4) පරිවෙණාධිපති හිමියෝ ශිෂ්‍යයන් අමතති. | 4) පරිවෙණාධිපති හිමියන් විසින් ශිෂ්‍යයෝ ඇමතෙති. |
| 5) බුද්ධපුත්‍ර හිමි පූජාවලිය ලිවී ය. | 5) බුද්ධපුත්‍ර හිමි විසින් පූජාවලිය ලියැවිණි. |
| 6) දෙවන ධර්මකීර්ති හිමියෝ සද්ධර්මාලංකාරය රචනා කළහ. | 6) දෙවන ධර්මකීර්ති හිමියන් විසින් සද්ධර්මාලංකාරය රචනා කෙරිණි. |
| 7) මව සහ දුව මල් නෙළති. | 7) මව සහ දුව විසින් මල් නෙළෙයි. |
| 8) මම ඔබේ ලිපිය ලැබීමි. | 8) මට ඔබේ ලිපිය ලැබුණි. |
| 9) මව දරුවන් සනසයි. | 9) මව විසින් දරුවෝ සැනසෙති. |
| 10) පාරිවෙණික ශිෂ්‍යයෝ දේශකයාගේ අදහස් අවධානයට ලක් කළහ. | 10) පාරිවෙණික ශිෂ්‍යයන් විසින් දේශකයාගේ අදහස් අවධානයට ලක් කෙරිණි. |

## ක්‍රියාකාරකම 7.4

හිස් තැන්වලට සුදුසු පදය ලියා දක්වන්න.

1. ______________ ගුරු උපදෙස් පිළිගැණුනි.
2. ගුරුළුගෝමීහු අමා වතුර ______________
3. ______________ පිනට දහමට සිත් යොදත්.
4. බොහෝ සිංහලයෝ ______________ වෙති.
5. සාජහාන් විසින් ටජ්මහල ______________
6. පළමු වන කාශ්‍යප ______________ අසිරිමත් සීගිරිය නිර්මාණය කෙරිණි.

7. ලක් දිවට පැමිණි බුදුගොස් හිමියන් විසින් සිංහල අටුවා පාලියට
   ________________
8. බුද්ධදාස රජතුමා අරුම පුදුම වෙදකම් ________________
9. අනේපිඬු සිටුවරයා මහත් සේ ධනය වැය කොට දෙව්රම් වෙහෙර තනවා බුදුරදුනට ________________
10. විහාර ප්‍රතිසංස්කරණයෙහි යෙදීමෙන් මහ විජයබා රජතුමා විසින් මහත් ශාසනික සේවයක් ________________

**ක්‍රියාකාරකම 7.5**

වගුවේ ඇති හිස් තැන් සම්පූර්ණ කරන්න.

| කර්තෘකාරක | කර්මකාරක |
|---|---|
| වළඳයි | ________________ |
| ________________ | සැනසෙති |
| ________________ | බැඳුණහ |
| පවන්වයි | ________________ |
| ________________ | පැසසෙම් |
| අගයති | ________________ |
| ________________ | ඇගයෙහි |
| අගයමු | ________________ |
| ________________ | කියැවිණ |
| රකිමු | ________________ |

**ක්‍රියාකාරකම 7.6**

ඉහත වගුවේ සඳහන් ක්‍රියා පද යොදා වාක්‍ය නිර්මාණය කරන්න.

# 08. සාම්ප්‍රදායික යෙදුම්

භාෂාවක ඇතැම් වචන එහි වාච්‍යාර්ථය ඉක්මවා වෙනත් අර්ථයක් හඟවයි. එවැනි භාෂා ප්‍රයෝග ඒ බසට ම ආවේණික වෙයි. යම් කිසි කරුණක් හැඟීම්බර ව ප්‍රකාශ කරන්නට අවශ්‍ය වූ විටක මෙවැනි යෙදුම් භාවිතයට ගැනේ. මේවා වෙනස් බසකට පරිවර්තනය කිරීමට පුළුවන්කමක් නැත. සිංහල වාක් සම්ප්‍රදය, හෙළ ඌරුව, හෙළ ආර, සිංහල රීතිය වැනි නම්වලින් ද මේවා හැඳින්වේ.





**පරංගියා කෝට්ටේ ගියා වගේ**

ක්‍රි.ව. 1505දී ඉන්දියාවේ ගෝව බලා යාත්‍රා කළ පෘතුගීසි නෞකාවක් කුණාටුවකට හසු වී ගාලු වරායට සේන්දු විය. ගාල්ලෙන් කොළඹ බලා යාත්‍රා කළ එම නෞකාව කොළඹ වරායේ නැංගුරම් ලා ගත්තේ ය. එවකට කෝට්ටේ රාජ්‍ය විචාළේ 8 වැනි ධර්ම පරාක්‍රමබාහු රජතුමා ය. මේ විදේශීය නාවිකයන් ගැන කණ වැකුණු රජතුමා ඔවුන් පිළිබඳ තොරතුරු සොයා බලන්නට ඇමතියෙකු පත් කළේ ය.


නැව්පතියා හමු වූ ඇමතිවරයාට දැනගන්නට ලැබුණේ පෘතුගීසීන් සිංහල රජතුමා සමග වෙළෙඳ ගිවිසුමක් ඇති කරගන්නට කැමති බවත් ඒ සඳහා රජතුමා හමුවීමට අවකාශ ලබා දෙන ලෙසත් ය. මේ බව රජුට දැන් වූ විට පෘතුගීසීන්ගේ යුද්ධ ශක්තිය පිළිබඳ දැන සිටි රජතුමා ඇමතිට අණ

කළේ එක එල්ලේ කොළඹ වරායේ සිට කෝට්ටේ මාලිගය කරා කැඳවා ගෙන නොයන ලෙසත්, කෝට්ටේ රාජධානිය බොහෝ දුර පිහිටා ඇති බව හඟවනු සඳහා ඈතට කැඳවා ගෙන ගොස් බොහෝ පමා කොට මාලිගාවට කැඳවන ලෙස ය. රාජ නියෝගය ලත් රාජ පුරුෂයෝ මෙසේ ආ පෘතුගීසි පිරිස කළුතර දක්වා කැඳවා ගෙන ගොස් රට මැදින් කෝට්ටේ රාජධානියට කැඳවා ගෙන ආහ. ඉතා කෙටි කාලයකින් කෝට්ටේ රාජධානියට ළඟා විය හැකි ව තිබුණ ද මෙම ගමන සඳහා දින කීපයක් ගත විය.

මෙම ඓතිහාසික සංසිද්ධිය පසුබිම් කොට ගෙන ''පරංගියා කෝට්ටේ ගියා වගේ'' යන පිරුළ ජන වහරට එක් විය. මෙයින් ගම්‍ය වන්නේ ඉතා පහසුවෙන් කළ හැකි දෙයක් සඳහා අනවශ්‍ය ලෙස දිගු කාලයක් හා ශ්‍රමයක් වැය කරන බවයි. අර්ථ විරහිත ලෙස කාලය හා ශ්‍රමය වැය කිරීම නිශ්ඵල අර්ථ ශූන්‍ය දෙයක් බව වටහා දීම මෙහි ලක්ෂ්‍යාර්ථයයි.

අපි තවත් උදාහරණයක් සලකා බලමු.

නන්ද කුමරු ශාසනයෙහි අභිරතියක් නැතිව, එළිපත්ත උඩ සිටීම භික්ෂූන්ට ගැටලුවක් විය.



මෙම වාක්‍යයේ නන්ද කුමරු එළිපත්ත උඩ සිටීම යන්නෙන් එහි වාච්‍යාර්ථය නොගැනේ. නන්ද කුමරු ගිහිගෙයටත් පැවිද්දටත් දෙකට ම නොමැතිව ජනපද කල්‍යාණි ගැන සිතමින් මානසික ව දෝලනය වූ බවක් මෙයින් අදහස් කෙරේ.

පහත උදාහරණය අවධාරණය කරමු.

චිංචිමාණවිකා තොමෝ බුදුන්ට **පදයක් හදන්නට** සවස වෙහෙරට ගියා ය.

මේ වැකියෙහි පදයක් හදනවා යනු ප්‍රකෘතියකට ප්‍රත්‍යයක් එක්කොට අර්ථවත් ඒකකයක් නිර්මාණය කිරීමක් නොවේ. එය එහි වාච්‍යාර්ථයයි. එහෙත් පදයක් යනුවෙන් ගම්‍ය වන්නේ ඊට ඉඳුරා ම වෙනස් වූ අර්ථයකි. චිංචිමාණවිකාවට අවශ්‍ය වන්නේ බුදුන් අවමානයට ලක් කිරීම ය.

පිරිස් බණ අසා වෙහෙරින් බැහැර වන අවස්ථාවේ ඕ වෙහෙර දෙසට යන්නීය. උපාසක පිරිස් වෙහෙරට යන විට ඇය වෙහෙර දෙස සිට පෙරළා එමින් සිටින්නී ය. මෙම සිද්ධිය උපාසක පිරිසට බුදුන් වහන්සේ පිළිබඳ කුතුහලයක් දනවීමට හේතු වන්නකි. චිංචිමාණවිකාවගේ අභිප්‍රාය වූයේ බුදුන් කෙරෙහි අවමානයක් ජනිත කරවීමයි. පදයක් හදනවා යන්නෙන් ගම්‍ය වන්නේ එම අදහසයි.

මේ ආකාරයට සිංහලයේ විවිධ අවස්ථා හරවත් ව හා රසවත් ව ඉදිරිපත් කිරීමේ මෙවලමකි, සාම්ප්‍රදායික යෙදුම්. විස්තරාත්මක ව පැවසිය යුතු යමක් ඉතා කෙටියෙන් එහෙත් සමස්තාර්ථය ම හැඟවෙන පරිදි ප්‍රකාශ කිරීමේ ශක්තිය භාෂාව සතුව ඇත. එබඳු ප්‍රයෝගයන්ගෙන් භාෂාව වඩා සජීවී වන අතර එය අර්ථපූර්ණ ද භාවපූර්ණ ද වෙයි. ඉහත දක්වුණු

පරංගියා කෝට්ටේ ගියා වගේ
එළිපත්ත උඩ සිටීම
පදයක් හදන්නට

මේ ප්‍රකාශ තුළින් ඊට අදාළ සිදුවීම් කිසිදු අයුරකින් භාෂා භාවිතයෙන් ගම්‍ය වේ යැයි සිතිය නොහැකි ය. මෙම සාම්ප්‍රදයික යෙදුම් ඉඟිවැකි, පිරුළු හා ආප්තෝපදේශ යනුවෙන් වර්ගීකරණය වේ.

**ඉඟි වැකි** -

★ මොරසූරන වැස්ස
★ ඇම ගිල්ලා
★ මූණේ දූලි ගෑවා
★ දෙවියන් සිහිවුණා

★ ගඟට ඉනි කපනවා
★ දිව දෙකේ මිනිහෙක්
★ පොත්ගුල්ලා
★ ගලේ කෙටූ අකුරු
★ එක මල්ලේ ලුණු කනවා
★ අණ්ඩර දෙමළ

මේ ඉඟිවැකි හෙවත් රූඩීවලින් යමක් සිදු වූ ආකාරය පිළිබඳ ඉඟියක් ලබා දෙයි. මතු පිටින් පැවසෙන අදහසට ඉඳුරාම වෙනස් වූ අදහසක් ලබාදීමට ඉඟිවැකිය සමත් වේ. සිංහල භාෂාව ඉඟි වැකිවලින් පොහොසත් වූවකි. එබඳු ඉඟිවැකියකින් පවසන අදහසක් සිංහලයට ම ආවේණික වූවක් විනා අන් බසකට පරිවර්තනය නොකළ හැකි ය.

## ප්‍රස්තාව පිරුළු

මානව සංහතියේ පරපුරෙන් පරපුරට පැවත ආ ජීවන අත්දැකීම් සමුදය ඇතුළත් ප්‍රස්තාව පිරුළු මඟින් අපේ ජීවිත පරිඥානය පුළුල් කරයි. සීමිත වචන සංඛ්‍යාවකට පරිමිත ප්‍රස්තාව පිරුළු ඒ මඟින් පුළුල් ජීවන පරාසයක් පිළිබඳ අවබෝධය ලබා දෙයි. ප්‍රස්තාව පිරුළකින් කියවෙන පුළුල් අදහස ගැඹුරු ය. අර්ථවත් ය. භාෂාවේ ප්‍රාණවත් බව ඇති කරන ප්‍රස්තාව පිරුළු භාෂාවේ අනන්‍යතාව ආරක්ෂා කරයි.

★ අලි මදිවට හරක්.
★ අන්දරේ සීනි කෑවා වගේ.
★ ආටානාටිය කියනවා වගේ.
★ ඇඟිලි පහ ම එක වගේ ද?
★ ඇසළ පෙරහැරට බෙරත් හිඟ ද?
★ උපාසක බළල්ලුත් මීයන් අල්ලනවලු.
★ කතාව දෝලාවෙන් ගමන පයින්.
★ කිරියි පැණියි වගේ
★ කීවොත් සඟ නසී. නොකීවොත් වෙහෙර නසී.
★ කාපු පතේ පැහැරුවා වගේ.

ඒ අතරින් කිහිපයකි.

කොපමණ ගුණ කළත්
දුදනෝ නොවෙති යහපත්
කිරි දියෙනි දෙවියත්
අඟුරු සුදුවන කලෙක් නම් නැත්

ඇතෙක් වනේ කොළ කැවට කිඩ කීවට දණ ගසාද
සුසික්කිතව ඇති කළාට උරුලැවගේ ගඳ ඇරේ ද
මැණික් ගලේ පය හැපුනට කණෙක් ඇහිඳලා ගනී ද
කොතෙක් කිවත් මෝඩයාට උගේ ගතිය උෟ අරී ද?

''ආප්ත'' යනු දනුම් තේරුම් ඇති අත්දැකීම්වලින් පිරිපුන් තැනැත්තන් හැඳින්වීම සඳහා භාවිත වන්නකි. ඔවුන්ගේ උපදෙස් ආප්තෝපදේශ නමින් ගැනේ. ඒවා ප්‍රස්තුත කාරණය එක එල්ලේ ප්‍රකාශ කරයි. එහෙයින් ඉඟිවැකිවල හෝ ප්‍රස්තා පිරුළුවල හෝ එන ප්‍රකාශනයනට වඩා මෙහි වෙනසක් වෙයි. ඒ වෙනස හුදෙක් වාච්‍යාර්ථය ම ඉස්මතු කොට දැක්වීමයි.

ඉහත කවිවල ඇත්තේ එවැනි ඍජු ප්‍රකාශන කීපයකි. පහත සඳහන් ආප්තෝපදේශ විමසා බලමු.

- ★ යුද්දෙට නැති කඩුව කොස් කොටන්න ද?
- ★ කළ කළ දේ පල පල දේ.
- ★ උඩඟුකම විනාශයට මුල ය.
- ★ ඇවිද්ද පය දහස් වටී.
- ★ සොයන්නාට හම්බ වේ.
- ★ දේසේ හැටියට බාසේ.
- ★ උඩ පැන්නොත් බිම වැටේ.
- ★ පිරුණු කළේ දිය නොසැලේ.
- ★ ආරේ ගති නැරේ.
- ★ උගත මනා ශිල්පය ම යි මතු රැකෙනා

## ක්‍රියාකාරකම 8.1

පහත 'අ' තීරුවේ ඇති යෙදුම්වලට ගැළපෙන අදහස ''ආ'' තීරුවෙන් තෝරා ලියන්න.

| (අ) | (ආ) |
|---|---|
| * ගොලුබෙලි ගමන | * අසාධ්‍ය අවස්ථාවේදී |
| * සායම ගියා | * ඉතා සෙමින් වැඩ කිරීම |
| * තරු පෙනුණා | * විස්මයට පත් වීම |
| * මර ඇඳේදී | * ඉතා අසීරුවෙන් යමක් කිරීම |
| * ගහන හෙණේ පැණි වරකාවටත් වදී | * හැංගි හොරා ක්‍රියා කිරීම |
| * පැදුරටත් නොකියා යයි | * කිසිම සඳහනක් හෝ සලකුණක් නොකොට පලා යෑම |
| * සුදු ලූණු පොඩි කිරීම | * මුල අමතක කොට දැමීම |
| * හොර ගල් ඇහිඳිනවා | * විපත සියල්ලට පොදු බව |
| * නැඟපු ඉනිමඟට පයින් ගැසීම | * අවමානයට ලක් වීම |
| * අනූනවයෙන් බේරෙනවා | * අනුන් මුළා කිරීම |

## ක්‍රියාකාරකම 8.2

එක මල්ලේ ලූණු කාගෙන පණ දෙන්නට වගේ සිටිය ඔහු මගේ ඉහ මොළ කන්නට සැරසෙන විට මට දෙවියන් සිහි වුණා. එහෙත් කපන්න බැරි අත සිඹින්නේත් නැතිව මගේ සායමත් යන්න නොදී දස අතේ හිතා මතාලා මිනිහා කියන ගල් පැලෙන බොරු පලිප්පු දමා දමා කියද්දීත් මිහිහාගේ ගැටවලට අහුවන්නේත් නැතිව අත දීලා දත නියවන්නට වන බවත් දැන දැන ම යාළුකම් ඇටකුණා වන්නට කලින් මිනිහගේ බත්පතට වැලි දමන්නෙත් නැතිව මිනිහා හන්දාම සිදු වූ දේ නිසා මගේ නාහේ ළගට ගිලෙන්න කලින් මිනිහගේ ම කරේ ඒ උරවක්‍රමාලාව ලා යන්තම් පණ බේරා ගත්තා.

1. ඉහත ඡේදයේ ඇති සාම්ප්‍රදායික යෙදුම් යටින් ඉරි අඳින්න.

2. ඒවායින් කියවෙන අදහස ලියන්න.

# 09. රචනය


## වාක්‍ය රචනය

කුඩා අවදියේ පරිසරයේ ඇති විවිධ ද්‍රව්‍යවලින් විවිධ දේ නිර්මාණය කොට අපි ඉමහත් ආස්වාදයක් ලැබුවෙමු. ළමයින් නිදහසේ මෙබඳු කාර්යයන්හි යෙදීමෙන් ඔවුන්ගේ බුද්ධිය ද චින්දන ශක්තිය ද, චාලක හැකියාව ද, නිර්මාණාත්මක ශක්තිය ද වර්ධනය වේ. ළමයින් නිර්මාණයට පෙළඹවීම ඔවුන්ගේ සහජ විභව්‍යතා ප්‍රබෝධවත් වීමට ද බලපාන බව මනෝවිද්‍යාඥයන්ගේ මතය යි. මේ නිසා නිර්මාණ ශක්තීන් ප්‍රබෝධවත් කරන වාතාවරණයක් ඇති කිරීම අධ්‍යාපනයේ ද වගකීම වේ. කෙනෙකුගේ පෞරුෂයේ පදනම ගොඩනැගෙන්නේත් රසාස්වාදයට අදාළ බීජ ඇතුළු කිරීම තුළිනි. ඒ මගින් ඔහුගේ නිර්ව්‍යාජ හැඟීම් හා ස්වාධීනත්වය ඉස්මතු වේ.

ගුරු උපදෙස් මත ශිෂ්‍ය කේන්ද්‍රීය නිර්මාණාත්මක ක්‍රියාකාරකම් මෙහෙයවිය යුතු වේ. ප්‍රායෝගික පාඩමක් ලෙස ඔබේ නිර්මාණය සැලසුම් කිරීම වැදගත් ය.

### 1 පියවර

පන්ති කාමරයෙන් බැහැරව පරිසරය නැරඹීමට සිසුන් කැඳවාගෙන යාම.



විහාරයට ගොස් බුද්ධ ප්‍රතිමා වහන්සේ නැරඹීම.

ප්‍රතිමාවෙන් මූර්තිමත් වන දයාව, කරුණාව, වැනි මානුෂික ගුණාංග සාකච්ඡා කිරීම.



බෝධීන් වහන්සේ නැරඹීම.

එහි ඇති වැදගත්කම, බෝපත් සැලෙන රිද්මය, අතුරිකිලි විහිදුන ආකාරය, සිසිලස, පෞරාණිකත්වය සාකච්ඡා කිරීම.



චෛත්‍ය රාජයාණන් වහන්සේ නැරඹීම.

වාස්තු විද්‍යාත්මක නිර්මාණයක් ලෙස ඇගයීම.

චෛත්‍යයේ ආකෘති සාකච්ඡා කිරීම.




අවට ඇති සතුන් නැරඹීම.

ඔවුන්ගේ නම්, සොබාදහමේ සුන්දරත්වය, සාකච්ඡා කිරීම.



මල් පාත්තියක් නැරඹීම.

එහි සෞන්දර්යාත්මක රටාව සාකච්ඡා කිරීම.



දිය පාරක් නැරඹීම.

සෞන්දර්යාත්මක රටාව සාකච්ඡා කිරීම.

මේ ආකාරයට පරිසරයේ ඇති විවිධ දේ පිළිබඳ නිරීක්ෂණයට අවස්ථාව සලසා දෙන්න.

**ක්‍රියාකාරකම 9.1**

මෙම නිරීක්ෂණ මුල් කොටගෙන :-

- ★ රචනයක් ගොඩ නගන්න.
- ★ චිත්‍රයක් අඳින්න.
- ★ කථාවක් පවත්වන්න.
- ★ කවි පන්තියක් නිර්මාණය කරන්න.
- ★ සංවාදයකට පිවිසවන්න.
- ★ තමා ලද අත්දැකීම් විස්තර කරන්න.

## 2 පියවර

පරිසරයේ ඇති විවිධ හැඩතල හඳුනාගැනීමට සැලැස්වීම.

ඒ තුළින් වෘත්තය "◯" යන හැඩය සිසුන්ට හඳුන්වාදීම.

ඉන්පසු පරිකල්පනය දියුණු කරමින් වෘත්තය යොදා ගනිමින් විවිධ රූප නිර්මාණයට පෙළඹවීම.

උදා -:


මුහුණ


ඉර


ස්විචය

නිර්මාණය කරන රූපයේ කොතනක හෝ වෘත්තය තිබිය යුතු ය. වෘත්තය ඇතුළතින් හෝ පිටතින් විවිධ හැඩ එක්කරමින් එය රූපයක් බවට පත් කළ හැකි ය.

## ක්‍රියාකාරකම 9.2

එවැනි වෙනත් රූප පහක් නිර්මාණය කරන්න.

## 3 පියවර

රෝස මලේ නටුවේ කටු
වන බඹරෝ ඔහොම හිටු
නටුව නොවේ මල සිඹිම්
මම ළමයෝ පැණි උරම්

අහසේ තරු වැල් පිරිලා
පොළොවේ සුදු මල් පිපිලා
මඟුල් ගෙවල් දෙකක් වගෙයි
මේ දෙපොළම හැඩ ගැහිලා

ගස වතු සුදූ
වී පිරී සිදූ
පොහොය නැතිදූ
සිල්ගත් බදූ

රැගත් සුරා පිරූ විතින්
සුරත් තඹුරු පෙති සෙ නෙතින්
පුවත් නොදැන බමන ගතින්
නටත් අයෙක් සුරා මතින්

ඉහත සඳහන් එක එක කවිය පිළිබඳ විස්තරයක් ලියන්න. ඔබ ඉහත කළ නිර්මාණ පහත සඳහන් නිර්ණායක හා ගැළපේදැයි විමසා බලන්න.

හරවත් බව
අන්තර්ගතය
ශිල්පීය කුසලතා
වාක්‍ය රචනයක් මගින් ද මනිනු ලබන්නේ ඉහත සඳහන් අංගයන්ම ය.

## හරවත්බව

රචනය හරවත්වීම තුළින් බලාපොරොත්තු වන්නේ අදාළ මාතෘකාව මනාව විවරණය කොට මාතෘකාවට ගැළපෙන අදහස් සමුදයක් ගොනුකොට දැක්වීමයි. කරුණු ගොනු කිරීමේ දී එක් එක් කරුණක් සඳහා අලුත් ඡේදයක් යොදා ගැනීම අවශ්‍ය වෙයි. ඡේද වෙන් කිරීමේ දී එක් ඡේදයක දී මතු කළ කරුණක් අනෙක් ඡේදයක දී සාකච්ඡා කිරීම නොකළ යුතු ය. එය රචනයේ දී පුනරුක්ති දෝෂය නමින් හැඳින්වේ.

මේ නිසා ඡේද වෙන් කිරීම, රචනයේ වැදගත් ලක්ෂණයක් වන අතර ඡේද අතර මනා සම්බන්ධතාවක්, ගැළපීමක් තිබීම ද අවශ්‍ය ලක්ෂණයකි. කරුණු සියල්ල මාතෘකාවට ගැළපෙන, කුළුගන්වන සුළු ඒවා විය යුතු ය.

එහෙයින් රචනයක් ලිවීමේ දී හැඟීම් - අදහස් විසිර යා නොදී එක් අරමුණක තබාගෙන ලිවීම රචනයේ සාර්ථකත්වයට බෙහෙවින් හේතු වෙයි.

## අන්තර්ගතය

අන්තර්ගතය අරමුණු හා බැඳී පවතී. එහෙයින් හරවත් කරුණු අන්තර්ගත කොට අදාළ ප්‍රස්තුතය හා ගැළපෙන අයුරින් ලිවීම වැදගත් ය.

## ශිල්පීය කුසලතා

මෙහිදී අක්ෂර වින්‍යාසය, විරාම ලකුණු භාවිතය, උක්ත ආඛ්‍යාත භාවිතය, පද බෙදීම පමණක් නොව අත් අකුරු ද සැලකිල්ලට භාජනය වෙයි. කෙතරම් සාරවත් රචනයක් වුවත් කියවීමට අසීරු අත් අකුරු හෝ නොපැහැදිලි අත් අකුරු රචනය සාර්ථකවීමටත්, හොඳ ලකුණක් ලැබීමටත් බාධක වෙයි. එහෙයින් මෙබඳු ඌනතා වළක්වා ගැනීම රචනයක් ලිවීමේ දී ඔබෙන් බලාපොරොත්තු වෙයි. රචනය ලිවීමට පෙරාතුව රචනයේ සැකිල්ල සටහන් කර ගැනීම අදහස් විසිර යා නොදී සාර්ථක රචනයක් ලිවීමට මං පාදයි.

එහෙයින් ව්‍යුහගත නොවූ රචනයක් ලිවීමේ දී රචනයේ අන්තර්ගත විය යුතු කරුණු පිළිබඳ ව සිතා බැලීම වැදගත් වෙයි.

රචනාව කරුණු අතින් පමණක් නොව භාෂාව පැත්තෙන් ද පෝෂණය විය යුතුය. රචනයේ දී අපේක්ෂා කරන්නේ මාතෘකාව පිළිබඳ ව විශ්ලේෂණාත්මක ව, නිර්මාණාත්මක ව හා තර්කානුකූල ව කරුණු ඉදිරිපත් කිරීමයි. රචනය ඉදිරිපත් කිරීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි ඔබේ අවධානය යොමු කරන්න.

* විෂය ඥානය :-

- මාතෘකාවට අදාළ සෑම අංශයක් ගැන ම අවධානය යොමු කිරීම.
- අදාල විෂය ඥානය රචනය තුළින් ප්‍රකාශ වීම.
- කරුණුවල පවත්නා යෝග්‍යතාව හා ප්‍රමාණාත්මක බව.

* අදහස් ප්‍රකාශනය :-

- නිවැරදිව අදහස් ඉදිරිපත් කිරීම.
- තර්කානුකූලබව හා විචක්ෂණ හැකියාව.
- තැනට ගැළපෙන උපමා, ප්‍රස්තාව පිරුළු ආදිය භාවිත කිරීම.

* ව්‍යුහය :-

- ඡේද බෙදා කරුණු දැක්වීම.
- ඡේද අතර මනා සම්බන්ධතාව ආරක්ෂා කර ගැනීම.
- කරුණුවල පවත්නා සිත්ගන්නාසුලු බව.

* ශිල්පීය දක්ෂතා :-

- නිවැරදි වියරණ භාවිතය.
- නිවැරදි අක්ෂර වින්‍යාසය, පද බෙදීම හා විරාම ලක්ෂණ භාවිතය.
- නිවැරදි වාක්‍ය නිර්මාණය.
- පැහැදිලි අත් අකුරුවලින් ඉදිරිපත් කිරීම.

ඉහත කරුණු උපයෝගී කර ගනිමින් ''වන සම්පත සුරකිමු'' යන මාතෘකාව යටතේ රචනා සැකිල්ලක් ගොඩ නගමු.

## වන සම්පත සුරකිමු

'වන සම්පත' යන්න අර්ථකථනය කිරීම.

වනාන්තරවල ඇති වැදගත්කම පැහැදිලි කිරීම.

- මිනිසා සහ ගස්වැල් අතර ඇති සම්බන්ධතාව
- වනාන්තර පිළිබඳ අපේ මුතුන්මිත්තන්ගේ ආකල්ප.
- ස්වාභාවික විපත්වලින් මිනිසා ආරක්‍ෂා කිරීම.
- ස්වභාවධර්මයේ සෞන්දර්යය ආරක්‍ෂා කර ගැනීම.
- පරිසර දූෂණය වළක්වා ගත හැකි වීම.
- වාතය පිරිසිදු වීම, නිසි කලට වැසි ලැබීම.

වන සම්පත විනාශ වන අයුරු.

- ජනගහනය අධික වීම.
- ජාවාරම්කරුවන්ගේ ක්‍රියා කලාප.
- කාර්මීකරණය ඉහළ යාම.
- ස්වාභාවික උපද්‍රව (නියඟ/ලැව්ගිනි)

වන සම්පත සුරැකීමට ගත යුතු පියවර.

- වනාන්තරවලට හානි නොකිරීම.
- අලුත් වනාන්තර ඇති කිරීම.
- වන සම්පත විනාශ කරන අයට නීති මගින් දඬුවම් පැමිණවීම.
- රුක්රෝපණ කටයුතු පුළුල් කිරීම.
- සන්නිවේදන මාධ්‍යවලින් වන සම්පත අගය කිරීමේ වැඩ සටහන් විකාශය කිරීම.
- අධ්‍යාපනය මගින් ආකල්ප ඇති කිරීම.

## ක්‍රියාකාරකම 9.3

ඉහත සඳහන් කරුණු මැනවින් හඳුනාගෙන පහත සඳහන් මාතෘකාවක් යටතේ රචනා සැකිල්ලක් ගොඩනගන්න.

* ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ
* අවුකන බුදු පිළිමය
* ශ්‍රී ලංකාවේ වතු වගාව
* පරිසර දූෂණය
* සිරිපා කඳු මුදුනේ දී

## ක්‍රියාකාරකම 9.4

ඔබ නිර්මාණය කළ රචනා සැකිල්ල උපයෝගී කර ගනිමින් රචනයක් ගොඩ නගන්න.

# 10. අර්ථාවබෝධය

පරසිඳු මෙ මිහි තල
මදුරට පුරෙහි සාගල
මදුරජුට බෝ බල
දුවක් විය පබවති නමින් දුල

සිව්රියන් ගෙය කුස
බැඳ හිඳින සඳ ඒ දිගැස
දුරුවෙයි අඳුරු රැස
මිණි පහන් ගණනක් නැගූ ලෙස

එකුමරි වසන තැන
රජ කුමරියො ඇතත් වෙන
නොම දිලෙත් රුසිරෙන
දිනිඳු අබියස ලූ පහන් මෙන

ඉහත දැක්වෙන කව්වල අදහස ඔබේ වචනයෙන් කියන්න යයි ගුරු ස්වාමීන් වහන්සේ තම ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට පවසන සේක.

**ශිෂ්‍ය ප්‍රතිචාර -** පළමුවන කවියේ අදහස සෝරත හිමි මෙසේ පහදයි.

මේ මිහිතලයෙහි මදුරට සාගල නම් පුරයෙහි බොහෝ බලවත් මදු රජුට පබාවතී නමින් දූවක් වූවා ය.

**ශිෂ්‍ය ප්‍රතිචාර -** දෙවන කවියෙහි අදහස වනරතන හිමි මෙසේ පැහැදිලි කරයි.

සිව්රියන් ගෙය ඇතුළේ ඒ දිගැස සිටින විට අඳුර දුරුවේ මිණි පහන් ගණනක් නැගූ ලෙස.

ශිෂ්‍ය ප්‍රතිචාර - තුන් වන කවියෙහි අදහස වනරතන හිමි මෙසේ පැහැදිලි කරයි.

එම කුමරිය වාසය කරන තැන වෙනත් රජ කුමාරිකාවෝ සිටියත් ඔවුහු නොබබළති. දිනිඳු ඉදිරියේ දූල් වූ පහන් මෙනි.

ගුරු හිමි - ඔබ වහන්සේලා දක්වූ ප්‍රතිචාර කදිමයි. එහෙත් සමහර වචනවල තේරුම තව දුරටත් අපි පැහැදිලි කර ගත යුතුව තිබෙනවා.

පද්‍ය හෝ වේවා ගද්‍ය හෝ වේවා සාහිත්‍ය නිර්මාණයක පාඨයන්හි අදහස වටහා ගැනීම අර්ථාවබෝධයට මෙන් ම එමගින් ලැබෙන රසාස්වාදයට ද හේතුවේ. ඒ නිසා වාක්කෝෂයේ මුහුකුරා නොගිය බව නිසා මුල් පද්‍යයේ වචන පාවිච්චි කරමින් නගන අර්ථ විවරණය සිත් නොගනී. එහෙයින් රස මතුකර ගත හැක්කේ වචනාර්ථය හා බැඳුණු කවියෙහි සමස්ත අර්ථය ග්‍රහණය කොට ගැනීමෙනි. කාව්‍යයේ වචනවල මතුපිටින් තිබෙන අදහස වාච්‍යාර්ථය නමින් හැඳින්වෙනවා.

මේක පෙර අපර දෙදිග කාව්‍ය විචාරවාදීන් පිළිගත් සිද්ධාන්තයකි. පාඨකයාගේ හදවතට පවසන දේට වඩා ගැඹුරු වූ ද, පළල් වූ ද අරුතක් එහි සැඟ වී ඇති බව අප පැහැදිලි කරගත යුතුව තිබෙනවා.

සෝරත හිමි - එතකොට හාමුදුරුවනේ වාච්‍යාර්ථය කියන්නේ මොකක් ද?

ගුරු හිමි - වාච්‍යාර්ථය කියන්නේ වචනයක මතු පිටින් පළවන අදහසට. ඒත් හොඳ කාව්‍යයක ලක්ෂණයක් නම් වාච්‍යාර්ථය ඉක්මවා ගිය එකක් විය යුතුයි. ව්‍යංග්‍යාර්ථය කියන්නේත් ඒකටමයි.

| | |
|---|---|
| නොම දිලෙත් | රුසිරෙන |
| දිනිඳු අබියස ලූ පහන් | මෙන |

යන කවි පද දෙකෙන් හැඟෙන්නේ පබාවතී කුමරිය අභිරූපිකාවක් බවයි. ඇයට උපමා කළ හැකි රුවැත්තියක් මිහිතලය මත නොවී ය. තවත් උදාහරණයක් බලන්න.

''පැහැ සරණිය මිණි පැමිණිය කොත් අගට''

කැලණි පුරවරයේ ශ්‍රී විභූතිය බලා මැණික් කොත් අගට ආවා. එයින් අදහස් කරන්නේ ඒ නගරය අතිශයින් ශෝභාවත් බව යි.

''බලා පයැ'ද යනු බැරි පුර කලාවන්''

කවියා දකින්නේ කාන්තාවන්ගේ අසීමිත රූප සෞන්දර්ය යි. ඔවුන් දකින කෙනෙකුට ඔවුන් හැර බැහැර යා නොහැක. මේ වචන දහසකින් හෝ නොකිව හැකි විස්තරයක් වචන කිහිපයකින් ප්‍රකාශ කිරීමයි. අපි ව්‍යංග්‍යය කියන්නේ මෙන්න මේකටයි. කාව්‍යයක් ගද්‍ය හෝ වේවා පද්‍ය හෝ වේවා වාච්‍යාර්ථය ඉක්මවා ගිය ධ්වනිතාර්ථයක් මතු කිරීම මෙහි දී ඉතාම අවශ්‍ය ලක්ෂණයක් වී තිබේ. වාච්‍යාර්ථය ඉක්මවා ගිය අර්ථය ධ්වනිතාර්ථය යි. එනම් වචනවලින් කියවෙන තේරුමට වඩා බෙහෙවින් පුළුල් අර්ථයක් ඒ වචනවලින් ගම්‍ය වීමයි.

එහෙනම් ඔය ඇත්තෝ ඇහුම්කන් දීගෙන ඉන්න මම ඒ ගැන ලියවුණ ලිපියක් කියවන්නම්. අවශ්‍ය වෙතොත් ප්‍රශ්න අහන්න.

පෙරදිග මෙන්ම අපරදිග විචාරවාදීහු කාව්‍යයේ මතුපිටින් දෙන අර්ථයට වඩා (වාච්‍යාර්ථය) ව්‍යංග්‍යාර්ථය පිළිබඳ ව සැලකිල්ලක් දැක්වූහ. අපරදිග විචාරවාදයේ ආදිතමයා ලෙස සැලකෙන්නේ ඇරිස්ටෝටල් ය. ඇරිස්ටෝටල් ''පොයටික්ස්'' නමින් කාව්‍ය විචාරයට අදාළ කෘතියක් රචනා කොට ඇත. කාව්‍ය විචාරයට අනුව සාහිත්‍යයේ දී භාෂාව භාවපූර්ණ විය යුතුය. එයද අනෙක් විෂයන්හි යෙදෙන භාෂාවෙන් වෙනස් වන්නේ මේ භාවපූර්ණ ලක්ෂණය නිසා ය.

**නිදසුනක් ලෙස :**

ආර්ථික විද්‍යාව, මානව විද්‍යාව, විද්‍යාව, ගණිතය, සමාජ විද්‍යාව සහ සෞඛ්‍ය විද්‍යාව වැනි විෂයන්හි භාෂාව ඊට අදාළ විෂය කරුණු දක්වන්නට ලියවුණු පරිමිත භාෂාවකි. එහෙත් අප තුළ සැඟවුණු භාව උද්දීපනය කොට රසයක් ජනිත කිරීමට සමත් වන්නේ සාහිත්‍යයික භාෂාව පමණි.

පෙරදිග කාව්‍ය විචාරයට අනුව භාෂාවේ වචනයක අර්ථ කිහිපයක් වෙයි.

(01) වාච්‍යාර්ථය
(02) ලක්ෂ්‍යාර්ථය
(03) ව්‍යංග්‍යාර්ථය

ගුරුවරයා - මෙතෙක් කියවුණු ලේඛනයට අනුව වාච්‍යාර්ථය හා ව්‍යාංග්‍යාර්ථය යනු කුමක් දැ යි ඔය ඇත්තන්ට තේරුම් යන්න ඇති. අපි ආයෙත් ලිපියේ ඉතිරි කොටස කියවමු.

## ලක්ෂ්‍යාර්ථය

මෙයින් අදහස් කෙරෙන්නේ දෙවෙන අර්ථයක් පළ කිරීමයි. "ගල් ළිදේ ගෙදර" කීවොත් ළිදේ ගෙදරක් තිබිය නොහැක. ගල් ළිද ආසන්නයේ ගෙය පිහිටා ඇති බව මෙයින් ගම්‍ය වේ. සිංහල සාම්ප්‍රදායික යෙදුම්වල, රූඪි හා ප්‍රස්තාව පිරුළුවල ඇත්තේ ද ලක්ෂ්‍යාර්ථය බව සමහර විද්වත්හු පවසති.

"කැලේ තිබෙන කොයි දේවත් රස වේවා
මලේ බඹරු මෙන් පිරිවර ඇති වේවා
අච්චේ තිබෙන රැස් මාලා අඩු වේවා
ගව්වෙන් ගව්ව දිව මාලිග සෑදේවා"

යශෝදරා තමා අතහැර ගිය සිදුහත් කුමරුට වෛර නොකරයි. දෙස් නොපවරයි. එහෙත් ඇය පති භක්තිය ඇති මහිලාවක ලෙස සැමියාට දුකක් වේයැයි පසුතැවිලි වෙයි. සැමියා මාලිගයෙන් පලා ගියේ ජන ශූන්‍ය කැලෑවකට බව ඇය දනී. එහි මාලිගයේ මෙන් මිහිරි ආහාර නැත. එහෙයින් ඇය කැලයේ තිබෙන කවර ම දෙයක් හෝ ඔහුට මිහිරි රසයක් ගෙන දේවා'යි ප්‍රාර්ථනය කරයි.

හුදකලාව වසන තම සැමියාට මාලිගයේ සිටිද්දී මෙන් අත් පා මෙහෙවරට කිසිවෙකු නැත. මේ කරුණ ඇගේ කම්පනයට හේතුවේ. එහෙයින් මලේ සුවඳට බඹරු එන්නා සේ ඔහුගේ ගුණ සුවඳ හඳුනන පිරිවර

ලැබේ වා යි පතයි. ගෙයක් දෙරක් නැති කැලෑවෙහි දැඩි හිරු රැසින් ඔහුට පීඩාවක් වෙති'යි සිතන ඇය අව්වේ රැස් මාලා අඩු වෙන්න යැයි අයදියි. පෙර සැප සම්පතින් පිරුණු මාලිගයෙහි විසූ ඔහුට වන වාසය බෙහෙවින් දුක් දෙම්නස් උපදවනු ඇතැයි කල්පනා කළ යශෝදරා ඔහුට ගව්වෙන් ගව්ව දිව මාලිග පහළ වේවා'යි ප්‍රාර්ථනා කරයි.

**ගුරු හිමි -** දැන් ඔය ඇත්තන්ට පේනවා නේද අපි ඉහත දක්වපු කවිය කොයි තරම් දුරට ඒක කියපු යශෝදරාවගේ සිත් සතන් පැහැදිලි කරනවද කියා. මෙයින් සැමියා කෙරෙහි වූ පති භක්තිය ඒ වගේම එම වචන මාලාව මගින් යශෝදරාගේ ප්‍රතිරූපය අපූරුවට මූර්තිමත් කරලා පෙන්වනවා නේද.

**සෝරත පොඩි හාමුදුරුවෝ -** හාමුදුරුවනේ, යශෝදරා දේවිය සිදුහත් කුමරු අභිනිෂ්ක්‍රමණය කරපු නිසා අඬා දොඩා වැළපෙනවාට වැඩිය කුමරුගේ සැප ප්‍රාර්ථනා කරලා තියෙනවා නේද? ඇය උතුම් කුලකාන්තාවක් නේද?

**ගුරු හිමි -** ඔව්, බොහොම හරි. මේ සේරම අපිට හඟවා තියෙන්නේ කවියා යොදා ගත් හතර පදයෙන් විතරයි. ඒ හතර පදය තුළින් අපිට පති භක්තිය තියෙන අපූරු ගැහැනියකගේ රූපය මතු වී පේනවා. හරියට චිත්‍රයක් වගේ.

**සෝරත පොඩි හාමුදුරුවෝ -** එහෙනම් හාමුදුරුවනේ කවියාත් හරියට චිත්‍ර ශිල්පියෙක් වගේ කෙනෙක් ද?

**ගුරු හිමි -** ඇත්තටම ඔව්. පොඩි වෙනසකුත් තියෙනවා. දැන් ඔය ඇත්තෝ දැකලා තියෙනවනේ අපේ විහාරගෙයි තියෙන ලස්සන බුද්ධ රූපය. මේ මූර්තිය අඹපු මූර්ති ශිල්පියාට ඒකට ඕනෑ කරන අමු ද්‍රව්‍ය ගොඩක් තිබුණා. සිමෙන්ති, බදම, වර්ණ ආදී දේවල් යොදා ගෙන තමයි ඒ ශිල්පියා මේ අපූරු ලස්සන බුද්ධ රූපය හදලා

තියෙන්නේ. එතකොට ඔය ඇත්තන්ට මතකනෙ අර ප්‍රධාන බිත්තියේ ඇඳලා තියෙන සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය කියන චිත්‍රය. එයත් අපූරු චිත්‍රයක්. ඒකේ මානව රූප කොච්චර ලස්සනද? නොයෙක් හැඩතල තිබෙනවා. ගහ කොළ අපූරුවට නිර්මාණය කරලා තිබෙනවා. ඒත් කවියෙකුට මේ සේරම නිර්මාණය කරන්න තිබෙන්නේ වචන විතරයි. ඒ වචනවල අර්ථයට මුල් තැන දෙමින් ගැළපීම කවියාගේ කාර්යයේ වැදගත් ම ලක්ෂණයයි.

**ගුරු හිමි** - අර්ථාවබෝධයේ දී බොහෝ විට කාව්‍යයේ දී මෙන් අපි ව්‍යංග්‍යාර්ථයටත්, ලක්ෂ්‍යාර්ථයටත් වඩා වාච්‍යාර්ථය මතු කොට දැක්වීම බලාපොරොත්තු වෙනවා. ඒ නිසා අදාළ ඡේදයේ හෝ කවි පෙළේ එන වචනවල අර්ථය ඔබේ බසින් ලිවීම බලාපොරොත්තු වෙනවා. මේකට ප්‍රමාණවත් ලෙස වාක්කෝෂය වැඩි දියුණු වෙලා තියෙන්න ඕනෑ.

**සෝරත හිමි** - හාමුදුරුවනේ, වාක්කෝෂය කියන්නේ මොකක්ද?

**ගුරුවරයා** - ඒක තමයි පොඩි නම භාෂාවේ වචන පිළිබඳ තියෙන අවබෝධය. ඒක ඇති කර ගන්න නම් පොත පත කියවන්න වෙනවා. දැන් අපි උදහරණයක් ගනිමු. "ඉර" කියන වචනයට දිනිඳු, දිනකර, දිනමිණ, දිවාකර, දිවයුරු, දිනපති, ගුවන් මිණ ආදී පද තියෙනවා. ඒවාට කියන්නේ පර්යාය පද කියලා. ඒවා අර්ථයෙන් සමානයි.

**ශිෂ්‍යයා** - මෙච්චර වචන ගොඩක් මතක තියාගන්නේ කොහොමද?

**ගුරු හිමි** - ඒක එච්චර අමාරු නෑ. ඕනෑ කරන්නේ නිතර නිතර කියවීම පමණයි. එතකොට ඒ වචන මුණ ගැහෙනවා. මතකයේ රැඳෙනවා. හොඳයි මම මේ කියවන ඡේදයට කන් දෙන්න.

"ඒ ධාර්මික කුමාර තෙමේ රාජ්‍ය කරණයෙහි අභිලාෂ නැත්තේ ය. එබැවින් රාජ්‍ය ප්‍රතිලාභ පිණිස සිතිවිලි පමණකුදු නූපදවයි. උදක් මයිල් මහතෙරුන් වහන්සේගේ ධර්මානුශාසන මාත්‍රයකින් ම රාජ සේවය කරයි. මෙසේ රාජ්‍ය කරන වේලෙහි රාජ සේවය කරනු පිණිස රජගෙට වඩී. එසේ වැඩ, ඔවුන් හා සමග රජගෙන් නික්මිණි. නික්ම සවස් වෙලෙහි මහා ස්ථවිරයන් වහන්සේගේ විහාරයෙහි ම වාසය කරයි. වාසය කරමින් රුවන්වැලි මහ සෑයට කළ මනා වැඳුම් පිදුම් ආදී වූ උපස්ථානයෙහි යෙදෙයි. ගිලනුන්හට උපස්ථානයෙහි යෙදෙයි. ගිලනුන්හට හා සිල්වතුන් වහන්සේහට කළමනා උපස්ථානාදියෙහි ද යෙදෙයි. එසේ යෙදීමෙන් දවස් හරන්ණේ ය.

**ගුරුවරයා** - ඉහත ඡේදය අපි විමසිල්ලට ලක් කරමු. මෙහි අර්ථාවබෝධය යනු මේ ඡේදයේ දැක්වෙන සියලු ම කරුණු ඒ ආකාරයෙන් ම අප පිළිගත යුතු වීමයි. ඡේදයේ යම්කිසි වැරදි අදහසක් තිබුණත්, එය නිවැරදි කිරීමට අපට අයිතියක් නැත. එසේම අලුතින් මොන ම හෝ අදහසක් ඊට ඇතුළත් කිරීමට ද ඉඩකඩක් අපට නැත. අපේ කාර්ය වන්නේ ඡේදය හොඳින් කියවා අදාළ ප්‍රශ්නවලට ඡේදයේ ඇති ආකාරයට ම ඉතාමත් කෙටියෙන් පිළිතුරු සැපයීම යි. පිළිතුරු සැපයීමේ දී ඡේදයෙන් උපුටා දැක්වීම් ආදිය නොකොට තමන්ගේ වචනයෙන් ඉතා කෙටියෙන් පිළිතුරු දැක්වීම අපේක්ෂා කෙරෙනවා. අසන ප්‍රශ්නයට ඉතාමත් කෙටියෙන් වචනයකින් හෝ දෙකකින් හෝ වේවා පිළිතුරු සැපයීම මෙහි දී කළ යුතු වෙනවා. එය පරීක්ෂකවරයාගේ අපේක්ෂාව යි. ඒ අනුව මෙම ඡේදය තුන් වාරයක් කියවා පහත දැක්වෙන ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

## ක්‍රියාකාරකම 10.1

මේ ඡේදයේ එන පහත සඳහන් වචනවල අර්ථ ඔබේ බසින් ලියන්න.

1. ධාර්මික
2. රාජ්‍යකරණයෙහි
3. අභිලාෂ
4. ප්‍රතිලාභ
5. මයිල්
6. මාත්‍රයකින් ම
7. උපස්ථානයෙහි

## ක්‍රියාකාරකම 10.2

පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"දෙවියන් ද, යකුන් ද, අවතාර ද, යන්ත්‍ර මන්ත්‍ර ද, කොඩිවින ද, හූනියම් ද විද්‍යාඥයෝ බැහැර කරති. ඒ සියල්ලම බොරුයැයි ඔවුහු නො සිතති. ඔවුන් ඒ මති මතාන්තර සහ විශ්වාස බැහැර කරන්නේ ඒ නිසා නො වේ. ඒ මති මතාන්තරයේ සහ විශ්වාසයන්ගේ ඇත්ත හෝ නැත්ත හෝ නොදත හැකි ය. ඔවුන් ගුරු කොට ගන්නා විද්‍යා විධි අනුව ප්‍රත්‍යක්ෂයෙන් එය නොදත හැකි ය. ඔවුන් එය බැහැර කරන්නේ එබැවිනි.

1 විද්‍යාඥයන් බැහැර කරන කරුණු කීයක් මෙම ඡේදයෙහි දැක්වේ ද?

2 විද්‍යාඥයෝ මේවා මිථ්‍යා විශ්වාස ලෙස බැහැර කරත් ද?

3 එවැනි විශ්වාස විද්‍යාඥයන් පිළිනොගන්නේ ඇයි?

4 ඉහත ඡේදයට අනුව විද්‍යාඥයන් ඇදහිලි හා විශ්වාස බැහැර කරන්නේ ඇයි? ඒ පිළිබඳ ඔබට හැඟෙන අදහස කුමක් ද?

## ක්‍රියාකාරකම 10.3

මෙ නිරිඳුගේ දූ ළඳ
උළ කුඩය දේවී සොඳ
සොමි ගුණෙනි පුන් සඳ
පවතී සිරිසඳ සිරින් ඇම සඳ

රුසිරු ගුණ සීතා
සුරතුර දිනු දැතා
විලසින් විනීතා
ලොවට කුලුණෙන් සදිසි මාතා

1. මේ වර්ණනය කවුරු පිළිබඳ ව ද?

2. කුලුණෙන් ලොවට මාතාවක් යැ යි කවියා පවසන්නේ කවුරුන් ගැන ද?

3. "සුරතුර දිනු දැතා" මෙහි අදහස පැහැදිලි කරන්න.

4. මෙහි එන උපමාව හා උපමේය සොයා දක්වන්න.

5. පහත දැක්වෙන පදවලට සමානාර්ථ පද දක්වන්න.
    1. ළඳ
    2. නිරිඳු
    3. සඳ
    4. තුර
    5. කුලුණින්

# 11. සාරාංශය

## සාරාංශකරණය

කිසියම් ඡේදයක සාරවත් කොටස ඉස්මතු කර දැක්වීම සාරාංශකරණයෙන් බලාපොරොත්තු වේ. අදහසක් විස්තර කර ලිවීම මෙන් ම හකුළුවා ලිවීම ද වැදගත් ය. කිසියම් කඳක අනවශ්‍ය කොටස් ඉවත් කර හරය වන අරටුව පමණක් ලබාගන්නා සේ විස්තරාත්මක පාඨයක මුඛ්‍යාර්ථයට හානියක් නොවන පරිදි එහි උපමා, රූපක, විශේෂණ හා අලංකාර වැනි පද ඉවත් කර අර්ථය ලබා ගැනීම සාරාංශ කිරීමේ දී සිදු විය යුතු ය. පාඨයක් සාරාංශ කිරීම මගින් පරීක්ෂාවට ලක් කෙරෙන්නේ පාඨය කියවා එහි අන්තර්ගතය ග්‍රහණය කර ගැනීමේ හැකියාව මෙන් ම එය නිවැරදි ලෙස ලියා දැක්වීමේ හැකියාව කොතරම් ප්‍රමාණයට ඔබ සතුව ඇත් ද යන්න යි.

දීර්ඝ දේශන, ලිපි ආදිය කියවීමෙන් අවශ්‍ය කරුණු සාරාංශ කොට තබා ගැනීමට අපට සිදු වේ. එදිනෙදා ජීවිතයේ අප අවට පරිසරයේ බොහෝ දේ අපට අසන්නට දකින්නට ලැබෙන අතර ඇතැම් විශේෂිත දෙයක් වේ නම් ඒවා අප හිත මිතුරන් සමග පැවසීම සාමාන්‍ය දෙයකි. අපට විවිධ තොරතුරු සන්නිවේදනය කරනු ලබන විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් ලබා ගන්නා තොරතුරු සංක්ෂිප්ත කර ඉදිරිපත් කරනු ලබන අතර අප ද ඒවා තවත් කෙනෙකුට පවසන්නේ එහි ද සාරාංශයක් හැටියට යි.

කාර්ය බහුල අවිවේකී ජීවිත ගත කරන මිනිසා තම කටයුතු ඉතා ඉක්මනින් නිම කර ගැනීමට කැමැත්තක් දක්වයි. එහි දී අප සන්නිවේදනය කරනු ලබන පණිවුඩය ඉතා සරල ව කෙටි කාලයක් තුළ සංක්ෂිප්ත ව ඉදිරිපත් කළ යුතු වේ. එහි දී සාරවත් හා වැදගත් අදහස් තෝරා බේරා ගත යුතු ය.


අනුරපුරට මහ වැසි

අනුරාධපුර වාර්තාකරු
එල්.බී. ජයන්ත

දින කීපයක් පුරා උතුරු මැද පළාතට ඇද හැලෙන ධාරානිපාත වර්ෂාව තවමත් අඩු වී නැත. නුවර වැව, තිසා වැව මේ වන විට වාං දමමින් පවතී. අනුරාධපුරයට ළඟා විය හැකි මහාමාර්ග සියල්ල ජලයෙන් යට වී ඇත. දිස්ත්‍රික් ලේකම්තුමා මහ ජනතාවට සිදු වී ඇති හානිය අවම කර ගැනීම සඳහා අවශ්‍ය ආරක්ෂක විධිවිධාන යොදා ඇත.

මෙම පුවත පුවත්පතකින් කියවූ මල්හාමි වෙල්යායට යාමට පිටත් විය. අතර මග දී මල්හාමිට මුණගැසුණේ පැරණි හිතවතෙකු වූ රන්බණ්ඩා ය. රන්බණ්ඩා දුර ගමනක් යාම සඳහා ලක ලෑහැස්ති වී පැමිණේ.

මල්හාමි - රන්බණ්ඩා, කොහෙ ද මේ අරුමැක්කෙ?
රන්බණ්ඩා - මම යනවා, අනුරාධපුරේ මහ ගෙදර ගිහින් එන්ට.
මල්හාමි - මොනවා අනුරාධපුරේ ?
රන්බණ්ඩා - ඇයි එහෙම කීවේ ?
මල්හාමි - අනුරාධපුරයට මහවැස්ස. නුවර වැව, තිසා වැව වාං දමනවා. පාරවල් යට වෙලා. දිස්ත්‍රික් ලේකම්තුමා ආරක්ෂක විධි විධාන යොදවලා.
රන්බණ්ඩා - අනේ මම දන්නේ නෑනේ. එහෙම දෙයක්.
මල්හාමි - අන්න අද පත්තරේ තියෙනවා. ගිහින් බලන්න කෝ.
රන්බණ්ඩා - මල්හාමි විස්තරේ කීවාට බොහෝ ම පිං. මං කඩමණ්ඩියට යන්නම්කෝ.

මල්හාමි කියවූ පුවත්පත් වාර්තාව හා එම වාර්තාව රන්බණ්ඩාට පැවසූ අකාරය විමසා බලමු. මල්හාමි පුවත්පතින් කිය වූ වාර්තාවේ වචන පනහක් පමණ ඇතුළත් වේ. නමුත් රන්බණ්ඩාට මල්හාමි දැක් වූ වාර්තාවේ වචන ගණන දහ හතක් පමණ ය. පුවත්පත් වාර්තාවේ වචන ගණන 1/3 ක් පමණ වන සේ අඩු වී ඇත. මූලික අදහසේ කිසිවක් ඉන් ගිලිහී ද නැත. අලුතින් නව අදහස් එක් වීමක් ද නැත. තිබෙන අදහස මල්හාමිගේ වචනවලින් ඒ ඇසුරින් ම

ඉදිරිපත් වී ඇත. රන්බණ්ඩාට මල්හාමි පවසන්නේ තමා කිය වූ වාර්තාව ඉතා සංක්ෂිප්තව ය. අනුරපුරට ගංවතුර ගැලීමට හේතු වී ඇත්තේ මහා වර්ෂාවයි. මල්හාමි ඒ බව වටහා ගෙන ඇත. ඒ අනුව අපට පැහැදිලි වන්නේ මල්හාමි පුවත්පත් වාර්තාවේ මුඛ්‍යාර්ථය ග්‍රහණය කොට ඇති බවයි.

**සතුටුදයක සේ පිළිගත හැකි සාරාංශයක් ලිවීම සඳහා සම්මත රීති කිහිපයක් තිබේ.**

★ දෙන ලද ඡේදය හෝ පාඨය සාරාංශ කළ යුතු වචන ප්‍රමාණය සඳහන් කරනු ලබයි. එසේ නොවන අවස්ථාවක එය ඡේදයෙන් 1/3ක් වන සේ සාරාංශ කළ යුතු වේ.

★ දෙන ලද ඡේදය අවධානයෙන් කියවා එහි මුඛ්‍යාර්ථය තේරුම්ගත යුතු වේ. අවශ්‍ය නම් කිහිප වරක් හෝ කියවීම වැදගත් ය.

★ ඡේදයෙන් කියවෙන මුඛ්‍යාර්ථය එම ඡේදයේ ම හෝ වෙනත් තැනක හෝ සටහන් කර ගැනීමෙන් සාරාංශය ගොනු කර ගැනීම පහසු වේ.

★ සංකීර්ණ වාක්‍යයක ප්‍රධාන අදහස් බෙහෙවින් ඇත්තේ අන්තර් වාක්‍යයේ නොව ප්‍රධාන වාක්‍යයේ ය.

★ ඡේදයේ යොදා ඇති උද්ධෘත පාඨ, ප්‍රකෘති භාෂණ, උපමා, රූපක, අලංකාර පද, අතිශයෝක්ති, විවරණ, නිදර්ශන, උදාහරණ හා අනවශ්‍ය විශේෂණ පද සාරාංශයට ඇතුළත් නොකළ යුතු ය. එකම වචනය නැවත නැවත සාරාංශයට යෙදීමෙන් පුනරුක්ති දෝෂය ද ඇති වන අතර එමගින් සාරාංශය අනවශ්‍ය ලෙස දීර්ඝ වීම ද සිදුවෙයි.

★ උද්ධෘත පාඨ යොදා ප්‍රකෘති භාෂණයෙන් සාරාංශය නොලියා විකෘති භාෂණයෙන් ලිවිය යුතු වේ.

★ මුල් ඡේදයේ යම් ප්‍රකට සත්‍යයක් වුවත් සඳෙස් ව කියා ඇති නම් එය එසේ ම ලියන්න. එය නිදෙස් කිරීමේ අයිතිය සාරාංශයේ දී ඔබ සතු නො වේ.

★ සාරාංශය ඕනෑවට වඩා කෙටි වීම ද බරපතල දෝෂයකි.

★ අක්ෂර වින්‍යාසය, විරාම ලකුණු, උක්තාඛ්‍යාත පද සම්බන්ධය ආදිය ගැන ද සාරාංශයේ දී සැලකිලිමත් විය යුතු ය. සාරාංශය පද බෙදීමේ දී මුල් ඡේදය අනුගමනය කිරීම සුදුසු ය. සාරාංශයේ දී ගූඪාර්ථවත්, විපරීතාර්ථවත් වචන භාවිතයෙන් වළකින්න.

★ මුල් පාඨය කියවා නැති අයෙකුට වුව ද එහි අන්තර්ගත සෑම කරුණක් ම මැනවින් අවබෝධ විය යුතු ය.

★ ඡේදයේ මුඛ්‍යාර්ථයට හානියක් නොවී එය ප්‍රකාශ වන ආකාරයට තමන්ගේ ම වචනයෙන් ලිවීමට ඔබට නිදහසක් ඇත.

★ සාරාංශ කිරීමට දෙන කොටසේ ඡේද කීපයක් දක්නට ලැබුණත් සාරාංශයක ඡේද නොබෙදෙන බැවින් සාරාංශ කිරීමේ දී එය තනි ඡේදයක් ලෙස ඉදිරිපත් කළ යුතු වේ.

★ සාරාංශයේදී වාක්‍ය අතර සම්බන්ධතාව ද මැනවින් ආරක්ෂා විය යුතු ය.

★ සාරාංශයට මාතෘකාවක් යෙදීමේදී එය ඉතාමත් කෙටි විය යුතු අතර මුල් ඡේදයේ මුඛ්‍යාර්ථයට ගැළපිය යුතු ය. එසේම මාතෘකාව ප්‍රශ්නාර්ථයක් නොවිය යුතු ය. මාතෘකාව වචන තුනත්, පහත් අතර වීම ප්‍රමාණවත් ය.

**ක්‍රියාකාරකම 11.1**

පහත සඳහන් ඡේද සාරාංශ කර ලියන්න.

1. අවට බලන ඔහුට, ඒ රෑ සිය නගරය ගිනි ගෙන දැවෙන හැටි මොනවට පෙනෙන්නට විය. නගර වැසියන් වෙඩි කාගෙන, මර හඬ දෙමින් නැසෙන සැටිත්, ගැහැනුන් සහ ළමයින් සැනින් සිඳ බිඳ ගිය අත් පා ඇතිව, වැළපෙන සැටිත්, පෙනෙන්නට විය. අන්ධකාරය මෙ වේලේ ඔවුනට මහත් පිටිවහලක් විය. පිස්සු බල්ලන් මෙන් කිසි ඉවක් බවක් නැතිව, ගෙවල් ගිනි තැබීමත්, දුබල ගැහැනුන් සහ ළමයින් කඩුගෑමත්, වස්තු


කොල්ලකෑමත්, විනෝදය කොට ගෙන නොයෙක් සැහැසිකම් කරන, පරංගි භේවායන් මගහරිමින් යුහු-යුහු ව නගරයෙන් පිටත් ව යාමට ඔවුනට අන්ධකාරය මහෝපකාරී විය.

(විජයබා කොල්ලය)

2. විද්‍යාව භාෂාවක් වශයෙන් හැඳින්වීම නිවැරදි ය. අදහස් ප්‍රකාශ කිරීමේ හා හුවමාරු කර ගැනීමේ මාධ්‍යයක් වශයෙන් භාෂාව සැලකේ. එවැනි ගණයට අයත් සිංහල, කලාව, ආගම, දේශපාලනය, ඉංග්‍රීසි භාෂා විෂයයන් ද හැඳින්විය හැකි ය. මෙම විෂයයන් ද විද්‍යාව ද නව ක්ෂේත්‍රවලට ප්‍රවේශ වීමටත් එවැනි නව ක්ෂේත්‍රවල දී අවබෝධයක් ලැබීමටත් මිනිසාට හැකි ය. අනෙක් භාෂාවලට මෙන් විද්‍යාවට ද අනුගමනය කළ යුතු විනය පද්ධතියක් නැති නම් ව්‍යාකරණයක් වශයෙන් සැලකිය හැකි විද්‍යාත්මක ක්‍රමයක් ඇත. එසේ ම එහි සාහිත්‍යයක් හෙවත් ග්‍රන්ථකරණයක් සහ කර්තෘවරුන් වශයෙන් සැලකිය හැකි විද්‍යාඥයින් ද ඇත. එසේම විද්‍යාවේ අනු භාෂා වශයෙන් සැලකිය හැකි විවිධ ක්ෂේත්‍ර ඇත. එනම් රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව හා භෞතික විද්‍යාව යනුවෙනි.

(විද්‍යාත්මක ඥානය)

# 12. ප්‍රායෝගික ලේඛන




විවිධ කටයුතු සඳහා අපි භාෂාව උපයෝගී කර ගනිමු. ආරංචියක්/තොරතුරක් දන්වා යැවීම, ආරාධනාවක් කිරීම, විදුලි පණිවුඩ යැවීම, රාජකාරි කටයුතු සම්බන්ධ වාර්තා කිරීම, විශේෂ සිද්ධි පිළිබඳ වාර්තා කිරීම, දැන්වීම් පළ කිරීම ආදිය ප්‍රායෝගික ලේඛන වශයෙන් හඳුන්වනු ලැබේ. යමක් කථන ව්‍යවහාරයෙන් ඉදිරිපත් කරනවාට වඩා ලිඛිත ව්‍යවහාරයෙන් ඉදිරිපත් කළ පසු එහි වටිනාකම පිළිගත හැකි වීම ඉහළ ය. මේ නිසා ප්‍රායෝගික ලේඛනයන්හි වැදගත්කම මෙපමණ කැ යි කිව නො හැකිය. මෙම පරිච්ඡේදයෙන් ඒ පිළිබඳ විමසා බලමු.



ට්‍රිං.... ට්‍රිං.... ට්‍රිං.................

පොඩි හාමුදුරුවෝ - පණ්ඩිත හාමුදුරුවනේ, පියුං මහත්තයා ඇවිල්ලා.

පණ්ඩිත හාමුදුරුවෝ - මටත් ශබ්දේ ඇහුණා. පොඩි නම ගිහිල්ලා ලියුම් ටික අරන් එන්න කෝ.

පොඩි හාමුදුරුවෝ - එහෙමයි පණ්ඩිත හාමුදුරුවනේ. (පොඩි හාමුදුරුවෝ පියුම් මහතා ළඟට යයි).

පියුං මහත්තයෝ, ලියුම් ගොඩක් තියෙන්නේ. එහෙනම් දෙන්නකෝ.

තැපැල් මහත්තයා - පොඩි හාමුදුරුවනේ, මෙන්න මේ ලියුම නම් අත්සන් කරලයි ගන්න ඕන.


පොඩි හාමුදුරුවෝ - ඒ ඇයි?

තැපැල් මහත්තයා - මේක ලියාපදිංචි තැපෑලෙන් ආපු ලියුමක්. මේක බාර දුන් බවට සහතිකයක් තැපැල් කන්තෝරුවට දෙන්න ඕන. ඒකේ වගකීම වැඩියි. මේක බාර දෙන්න බැරි නම් ආපසු යවන්නත් ඕනෑ.

පොඩි හාමුදුරුවනේ මෙන්න මෙතන අත්සන් කරන්නකෝ.

(පොඩි හාමුදුරුවෝ අත්සන තබති).

මේ ලිපිය පරිවේණාධිපති හිමියන්ට ම බාර දෙන්න.




පොඩි හාමුදුරුවෝ - හා හොඳයි. තැපැල් මහත්තයාට බොහොම පින්. මං යනවා.

පොඩි හාමුදුරුවෝ - පණ්ඩිත හාමුදුරුවනේ, මේ ලිපිය ඔබ වහන්සේට ම දෙන්න කියලා පියුං මහත්තයා කීවා. යවන්නාගේ ලිපිනය කියලත් ලියලා තියෙනවා.

පණ්ඩිත හාමුදුරුවෝ - හා හා දෙන්නකෝ. පොඩි නම බොහොම හොඳයි. දැන් පිරිවෙන පටන්ගන්න වේලාවත් ළඟයි නේ. පිරිවෙන් ශාලාවට ගිහින් පන්තිය සූදානම් කරගන්නකෝ. මම පන්තියට එනවා.

(ටික වේලාවකට පසු)

පණ්ඩිත හාමුදුරුවෝ - සැම දෙනාට ම තෙරුවන් සරණයි. අපි අද හරි ම සතුටු විය යුතු දවසක්. ඒකට හේතුව මට මේ දැන් ලැබුණා විතරයි. ඒ සාක්ෂ්‍යයත් අරගෙනයි මම මේ පන්තියට ආවේ. කාරණය තව පොඩ්ඩකින් මම කියන්නම්කෝ. අපි අද පාඩමට ''ප්‍රායෝගික ලේඛන'' යන මාතෘකාව තෝරා ගනිමු.

ප්‍රායෝගික ලේඛන යටතේ විවිධ ලේඛන වර්ග පිළිබඳ ව සාකච්ඡා වෙනවා. අද අපි ''ලිපි ලිවීම'' පිළිබඳ ව ඉගෙන ගනිමු.

ලිපි කියල කියන්නේ විවිධ පෞද්ගලික හා සාමාජීය අවශ්‍යතා සඳහා උපයෝගී කර ගනු ලබන පහසු සන්නිවේදන ක්‍රමයක්. රාජකාරී හා ව්‍යාපාරික කටයුතුවලදී ලිපි හුවමාරුව බහුල ව සිදු කෙරෙන අතර එය ඉතා වැදගත් ද වෙනවා. මෙසේ අපි භාවිත කරන ලියුම් අරමුණු අනුව වර්ග කීපයකට බෙදා දක්වන්නට පුළුවන්.

★ පෞද්ගලික ලිපි
★ ව්‍යාපාරික ලිපි
★ රාජකාරි ලිපි

සුමන පොඩි හාමුදුරුවන්ට ඊයේ ලියුමක් ලැබුණා නේද? කවුද ඒක ලියලා එවල තිබුනේ.

| | | |
|---|---|---|
| සුමන පොඩි හාමුදුරුවෝ | - | පණ්ඩිත හාමුදුරුවනේ ඒක එවලා තිබුණේ අපේ අම්මා. ඒ අයගේ තොරතුරු තමයි ලියලා තිබුණේ. |
| පණ්ඩිත හාමුදුරුවෝ | - | බොහොම හොඳයි. ඒ ලිපිය වගේ ලිපිවලට අපි කියන්නේ පෞද්ගලික ලිපි කියලා. ඈත ප්‍රදේශවල වාසය කරන අපේ නෑයන්ගේ, හිතවතුන්ගේ තොරතුරු දැනගැනීම, අපේ තොරතුරු ඔවුන්ට දන්වා යැවීම වැනි ලිපි අපි හඳුන්වන්නේ පෞද්ගලික ලිපි කියලා. |

ව්‍යාපාරික ආයතන විවිධ කටයුතුවලදී පුද්ගලයින්, වෙනත් ආයතන ආදිය සම්බන්ධ ව තම වගකීම් හා කාර්ය පිළිබඳව සිදු කරන කටයුතුවල දී හුවමාරු කරන ලිපි ව්‍යාපාරික ලිපි වශයෙන් හඳුන්වනවා. රජයේ දෙපාර්තමේන්තු, ආයතන සංස්ථා මණ්ඩල ආදිය තම කටයුතු කිරීමේදී හුවමාරු කෙරෙන ලිපි රාජකාරි ලිපි වශයෙන් හඳුන්වනවා. සුමන පොඩි හාමුදුරුවෝ කියන්න බලන්න ලිපි වර්ග කීයක් තියෙනවා ද කියලා.

**සුමන පොඩි හාමුදුරුවෝ** - ලිපි වර්ග තුනයි පණ්ඩිත හාමුදුරුවනේ.

**පණ්ඩිත හාමුදුරුවෝ** - ඒවා නම් කරන්න බලන්න.

**සුමන පොඩි හාමුදුරුවෝ** - පෞද්ගලික ලිපි, ව්‍යාපාරික ලිපි, රාජකාරි ලිපි පණ්ඩිත හාමුදුරුවනේ රාජකාරි ලිපි කියන ඒවා ටිකක් පැහැදිලි කරලා දෙනව ද?

**පණ්ඩිත හාමුදුරුවෝ** - බොහොම හොඳයි. රාජකාරි ලිපි ගැන මම පැහැදිලි කරන්නම්කෝ.

මේ එක් එක් වර්ගයට අයත් ලිපි ලිවීමේදී ලිවිය යුතු ආකාරය එකිනෙකින් වෙනස් වෙනවා. රාජකාරි ලිපියක් ලිවීමේදී පිළිපැදිය යුත්තේ පෞද්ගලික ලිපියක් ලිවීමේදී පිළිපැදිය යුතු ක්‍රමය නොවේ. ව්‍යාපාරික ලිපිය ලිවිය යුත්තේ මේ දෙකට ම වෙනස් අයුරෙනි.


හොඳයි අපි බලමුකෝ රාජකාරි ලිපි ලියන්නේ කොහොම ද කියලා. ඉස්සර වෙලා පියුම් මහත්තයා ගෙනත් දුන්නු පොඩි හාමුදුරුවෝ අත්සන් කරලා ගෙන ආ ලිපිය බලමුකෝ. මේ තියෙන්නේ.




මේක රාජකාරි ලිපියක්. මේ ලිපිය වැදගත් නිසා ලියා පදිංචි තැපෑලෙන් තමයි එවල තියෙන්නේ. ඒ කියන්නේ මේ ලිපිය සම්බන්ධ තොරතුරු (යවන්නා, ලබන්නා ආදී) තැපැල් කන්තොරුවේ සටහන් වෙනවා. ලියා පදිංචි බව පෙන්නුම් කරන්න තමයි ලිපි කවරයේ ඉහළ වම් පැත්තේ ලියා පදිංචි ලේබලය අලවා තිබෙන්නේ.




මෙවැනි ලිපි බාරදීමේදී ලිපිය ලබා ගත් පුද්ගලයා අත්සන් කරලා ලබා ගත් බව සහතික කළ යුතු ය. මේ ලිපියේ තැපැල් ගාස්තුවත් සාමාන්‍ය ලිපියකට වඩා වැඩියි. රාජකාරි ලිපි සාමාන්‍ය තැපැලෙන් ද එවන්න පුළුවන්. මේ ලිපිය ලැබිය යුතු පුද්ගලයා නැති නම් එය එවූ පුද්ගලයා වෙත ආපසු බාරදීමට තැපැල් කන්තෝරුව කටයුතු කරනවා.


No. 747000
Registered Postal Article Delivery Receipt
Office of Posting
Registration No.
No. 747000
Date Stamp
Received Registered Postal Article as per above-numbered receipt.
Transferred to


No. 746996
P. O. J. 11/ Pink Orig.
(15 × 10 1/2 White Dup. S., T. & E.) 8/74
Date Stamp
Registration No.
Addressee
Signature (in full)
Name of Recipient

සුමන පොඩි හාමුදුරුවෝ මේ ලිපිය කියවන්න බලන්න.

මගේ අංකය මැද/පිරි/04/02,
අධ්‍යක්ෂ,
කලාප අධ්‍යාපන කාර්යාලය,
දංලන්ද.
2013.11.04

පරිවේණාධිපති හිමි,
ධර්මරාජ පිරිවෙන,
මහබැද්ද.

<u>සමස්ත ලංකා සිංහල භාෂා සාහිත්‍ය තරගාවලිය - 2013.</u>

පරිවේණාධිපති හිමි,

2013.10.20 දින කොළඹ 10 ආනන්ද විද්‍යාලේ දී පැවැති සමස්ත ලංකා අත් අකුරු විචිත්‍ර තරගයෙන් මහබැද්ද ධර්මරාජ පිරිවෙනේ රුවැව සෝරත හිමි ප්‍රථම ස්ථානය ලබාගෙන ඇත.

ත්‍යාග සහ සහතික පත් ප්‍රදානය පසුව දැනුම් දෙනු ලැබේ.

මෙයට,

..............................
සිංහල භාෂා විෂය අධ්‍යක්ෂ

පණ්ඩිත හාමුදුරුවෝ - අපිට හරි ම සතුටුයි නේ ද? අපේ පිරිවෙනේ රුවැව සෝරත පොඩි හාමුදුරුවෝ අත් අකුරු තරගයෙන් සමස්ත ලංකා පළමු වන ස්ථානය ලබා තිබෙන බව තමයි සඳහන්. අපේ පිරිවෙනට ඉහළ ගෞරවයක්

ලබා දුන් සෝරත පොඩි හාමුදුරුවන්ට
අපි හැම දෙනාම සුබ පතමු. දැන්
අපි රාජකාරි ලිපි ගැන සලකා බලමු.

මේ ලිපිය ලිවීමේදී සම්මත රටාවක් අනුගමනය කර තිබෙනවා. ඔබ වහන්සේලාට පේනවා නේ ද? මේ පිළිවෙළ මම කරුණු වශයෙන් එකින් එක පැහැදිලි කරන්නම්.

1. මේ ලිපිය දිහා බලන්න. මේ ලිපියේ ඉහළින් සහ වම් අත පැත්තෙන් අඟලක පමණ තීරුවක් හිස්ව තිබෙනවා නේද?

පොඩි හාමුදුරුවෝ - එහෙමයි. එහෙමයි.

පණ්ඩිත හාමුදුරුවෝ - අපි රාජකාරි ලිපියක් ලියන විට මෙහෙම තීරුවක් හිස් ව තබන්න ඕනෑ. රාජකාරි ලිපි අපි අහක දමන්නේ නැහැ. ඒවා පසුවට අවශ්‍ය වේ යැ'යි සිතා තැන්පත් කර තබනවා. ලිපියට හානියක් නොවන ලෙස ලිපි ගොනුවක ඉහළින් හෝ වම් පැත්තෙන් තැන්පත් කොට තැබීමට යි එසේ තීරුවක් වෙන් කර තිබෙන්නේ. දැන් මේ ලිපියත් මම කාර්යාලයේ තැන්පත් කර තබනවා. ඉදිරියට අවශ්‍ය වුණු විටක දී ගැනීම සඳහා.

2. ඊ ළඟ කරුණ තමයි ලිපිය එවන තැනැත්තාගේ ලිපිනය. මේ බලන්න. ලිපියේ දකුණු පැත්තේ ඉහළ කෙළවරේ මේ සටහන් කර තියෙන්නේ එවන්නාගේ ලිපිනය. ලිපිය එවන දිනයත් එතන ම සටහන් වෙනවා.

සුමන පොඩි හාමුදුරුවෝ මේ ලිපිය අරගෙන ඒ ලිපිනය කියවන්නකෝ බලන්න.

සුමන පොඩි හාමුදුරුවෝ - මගේ අංකය : මැද/පිරි/4/2
අධ්‍යක්ෂ
කලාප අධ්‍යාපන කාර්යාලය,
දංලන්ද.
2013.11.04

පණ්ඩිත හාමුදුරුවෝ - බොහොම හොඳයි. අර ලිපිනයට උඩින් මගේ අංකය කියලා එකකුත් තිබෙනවා නේද? ඒ මොකක් ද? රාජකාරි ලිපියක් ලියන කොට ඒ ලිපියට අදළ අංකයක් තිබෙනවා. රාජකාරිය හා සම්බන්ධ වන ලිපිගොනු අංකය. ඒ අංකය මගින් අදළ දෙපාර්තමේන්තුවට හෝ ආයතනයට පුළුවන් ඒ ලිපිය ගැන සබඳතාව ප්‍රකාශ කරන්න. එසේ ම ඉදිරියට කටයුතු කිරීමේදීත් මේ අංකය වැදගත්. එනම් මෙම ලිපියට පිළිතුරක් ලියනවා නම් එම ලිපියේ මෙම අංකය සඳහන් කළ යුතු වෙනවා. ලිපිනය ලිවීමේදී විරාම ලකුණු ද නිවැරදි ව භාවිත කළ යුතු වෙනවා. එය ඉතා ම වැදගත්.

3. තුන්වන කාරණය තමයි ලිපිය ලබන නිලධාරියාගේ කාර්යාලයීය ලිපිනය. එය ලිපියේ වම් පැත්තේ එවන්නාගේ ලිපිනයට පහළින් ලිවිය යුතුයි. මෙහිදී අදළ නිලධාරියාගේ නම සටහන් කිරීම අනවශ්‍යයි. නිල නාමය පමණක් දැන්වුවා ම ප්‍රමාණවත්. මේ ලිපියට අනුව ලිපිය ලබන්නා කවුරු ද කියලා පොඩි හාමුදුරුවෝ කියන්න බලන්න.

පොඩි හාමුදුරුවෝ - පරිවේණාධිපති හිමි,
ධර්මරාජ පිරිවෙන,
මහබැද්ද.

පණ්ඩිත හාමුදුරුවෝ - බොහොම හොඳයි. ඊට පස්සේ

ඊ ළඟ කාරණය වශයෙන් ලිපියේ අන්තර්ගතය ඉතා සංක්ෂිප්ත ලෙස මාතෘකාවක් වශයෙන් යොදනු ලබනවා. මෙම ලිපියේ එසේ යොදා ඇති මාතෘකාව කුමක් ද?

පොඩි හාමුදුරුවෝ - සමස්ත ලංකා සිංහල භාෂා සාහිත්‍ය තරගාවලිය 2013

පණ්ඩිත හාමුදුරුවෝ - බොහොම හොඳයි. මේ මාතෘකාවට අනුව මේ ලිපියේ සඳහන් වන්නේ සිංහල භාෂා සාහිත්‍ය තරගාවලිය පිළිබඳ කරුණුයි. වෙනත් කටයුතු සම්බන්ධ ව ලියන රාජකාරී ලිපිවල ද එම ලිපිවල අන්තර්ගතය සංක්ෂිප්ත ව දැක්විය යුතු වෙනවා.

පහත සඳහන් මාතෘකා පාඨ විමසා බලමු.

(1) පිරිවෙන්/පාසල් නිල ඇඳුම් බෙදීම පිළිබඳ ව යි.
(2) විශ්‍රාමික නිවාඩු නිකේතනයක් ඉදි කිරීම පිළිබඳ ව යි.
(3) පිරිවෙන් පුස්තකාල පොත් ලබා දීම.

මේ ආකාරයට ප්‍රස්තුතයට අදාළ ව විවිධ මාතෘකා පාඨ යොදා ගැනේ.

පණ්ඩිත හාමුදුරුවෝ - ඊ ළඟ කාරණය තමයි ලිපිය ලබන නිලධාරියාගේ නිල බලය අනුව සුදුසු ඇමතුමක් යෙදීම. මෙම ලිපියේ නිල ඇමතුම ස්වාමීන් වහන්ස යන්නයි.

අපේ පිරිවෙනේ පරිවේණාධිපති හිමි කවුරු වුවත් ඒ ඇමතුම ඕනෑ ම අයෙකුට ගැළපෙනවා නේද? මේ ආකාරයට ලිපිය යවන පුද්ගලයාගේ නිලය අනුව විවිධ ඇමතීම් සටහන් වෙනවා.

ප්‍රාදේශීය ලේකම්තුමනි / තුමියනි,
ග්‍රාම සේවා නිලධාරිතුමනි /තුමියනි,
පුස්තකාලයාධිපතිතුමනි / තුමියනි,
මහත්මාණෙනි / මහත්මියනි,

මේ ආකාරයට විවිධ ඇමතුම් දක්නට ලැබෙනවා.

පණ්ඩිත හාමුදුරුවෝ - මී ළඟ කරුණ ලිපියේ අන්තර්ගතය යි. ලිපියේ ඇති වැදගත් ම කොටස තමයි, මෙය. ලිපියේ බඳ (කඳ) නමින් ද මෙය හැඳින්වෙනවා. නිලධාරියාට දැන්විය යුතු කරුණු ඉතා නිරවුල් ව, පැහැදිලි ව හා නිවැරදි ව ඉතාමත් කෙටියෙන් ඡේද බෙදා මෙහි ඇතුළත් විය යුතුයි. අනවශ්‍ය විස්තර කිසිවක් මීට ඇතුළත් නොකිරීමට ද වග බලා ගත යුතු යි.

මේ ලිපියේ බඳ කොටස සමිත පොඩි හාමුදුරුවෝ කියවන්න බලන්න.

පොඩි හාමුදුරුවෝ - (ලිපිය කියවයි.)

පණ්ඩිත හාමුදුරුවෝ - මෙහි සඳහන් වන්නේ සමස්ත ලංකා සිංහල භාෂා සාහිත්‍ය තරගයෙන් පළමු ස්ථානය හිමි කර ගත් පුද්ගලයාගේ නම යි. එය ඉතාමත් කෙටියෙන් නිවැරදි ව හා පැහැදිලි ව සටහන් කොට ඇති බව අපට පේනවා නේ ද? වෙනත් රාජකාරි ලිපිවල ද මෙම ලක්ෂණ ආරක්ෂා විය යුතුයි.

පණ්ඩිත හාමුදුරුවෝ - දැන් ලිපිය අවසන් කරන අවස්ථාව තමයි එළඹිලා තියෙන්නේ. මේ ලිපිය අවසන් කර තියෙන්නේ මෙන්න මේ ආකාරයට.

මෙයට,



..............................

සිංහල භාෂා විෂය අධ්‍යක්ෂ

මෙහි දී ලිපිය ලියන තැනැත්තාගේ අත්සන හා නිල නාමය පමණක් සඳහන් වෙනවා. රාජකාරි ලිපියක ස්වභාවය වටහා ගන්නට ඇතැයි දැන් මම විශ්වාස කරනවා.

## විදුලි පුවත්

ඈත වෙසෙන්නෙකුට ඉතා වැදගත් පුවතක් හදිසියේ ම දැන්වීමට අවශ්‍ය වූ විටක ඒ සඳහා උපකාරි වන්නේ විදුලි පුවතයි. විදුලි පණිවුඩයක් ලිවීමේ දී එය ඉතා පැහැදිලිව ලිවිය යුතු ය. එසේ ම විදුලි පණිවුඩයක් ලිවීමේදී ලැබෙන ඉඩ ප්‍රමාණය ද ඉතා සීමිත ය. අප ලියන සෑම වචනයකට ම මුදලක් ගෙවිය යුතු වීම ඊට හේතුවයි. මේ නිසා විදුලි පණිවුඩය සැකසීමේදී ඉතා අඩු වචන සංඛ්‍යාවක් භාවිත කිරීමට හැම උත්සාහයක් ම ගත යුතු ය.

විදුලි පණිවුඩයක මූලික කොටස් කීපයකි.

(1) ලබන්නාගේ ලිපිනය
(2) දැන්විය යුතු පණිවුඩය
(3) දන්වන්නාගේ නම
(4) දන්වන්නාගේ ලිපිනය

Sri Lanka Telecom

SLT/046

This form is for Inland and Indian telegram only.

Stamp to be affixed by the sender overleaf.

Attach this receipt when making a complaint.

Receipt for Telegram

| No. | Date | Amount |
|---|---|---|
| | | |

TELEGRAPHS

Signature of Accepting officer

Sent at ... To ... By

| Class | Time | Office of Origin | Date | Service Instructions | Words | Amount |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

Nothing to be written by the sender above this line

Instructions such as "Reply paid", "Urgent" "State" to be written here.

To : Name ..........

Address ..........

N.B. - (i) The Name and address of the sender if to be Telegraphed should be written above this line.

(ii) The Sender's signature, name and address should be furnished overleaf.

---

Notes

The ACCURACY of telegram is not guaranteed. Sri Lanka Telecom PLC do not bear any liability, whatsoever, for the non-delivery, errors or delays of a telegram.

Any complaint regarding the telegram should be addressed to the Manager, Call Center, Sri lanka Telecom PLC, Colombo 01, within two months from the date of the telegram enclosing the receipt.

Stamps to be affixed here

---

Notes

The ACCURACY of telegram is not guaranteed. Sri Lanka Telecom PLC do not bear any liability, whatsoever, for the non-delivery, errors or delays of a telegram.

Any complaint regarding the telegram should be addressed to the Manager, Call Center, Sri lanka Telecom PLC, Colombo 01, within two months from the date of the telegram enclosing the receipt.

Sender's signature .......... Sender's address ..........

Name ..........

## (1) ලබන්නාගේ ලිපිනය

විදුලි පණිවුඩය ලබන්නාගේ ලිපිනය ඉතා නිවැරදි ව සටහන් විය යුතු ය. රජයේ / පෞද්ගලික සමහර ආයතනවලට විදුලි පණිවුඩ ලිපි යොමුවක් දක්නට ලැබේ. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විදුලි පණිවුඩ යොමුව මෙසේ ය.

විභාග,
කොළඹ.

යවන්නාගේ පහසුව තකා මෙසේ සකස් කොට තිබේ.

## (2) දැන්විය යුතු පණිවුඩය

විදුලි පුවතක ඉතාමත් වැදගත් කොටස මෙයයි. මෙය අවුල් සහගත වුවහොත් එහි ප්‍රතිඵලය අසතුටුදායක විය හැකි ය. ඒ නිසා ඉතා නිරවුල් ව හා පැහැදිලි ව පණිවුඩය සකස්විය යුතු ය.

විදුලි පණිවුඩ කීපයක් සලකා බලමු.

- වෛද්‍ය පරීක්ෂණය 10 වෙනි සිකුරාදා පෙ.ව. 8.00ට.
- ලොකු අයියා මළා. අවසන් කටයුතු 3 වෙනිදා
- වහාම ක්‍රියාත්මක වන පරිදි ඔබ අනු/මිහින්තලේ බාලිකා විදුහලට මාරු කරමි.

## (3) යවන්නාගේ නම

විදුලි පණිවුඩය ලබන්නා එය එවා ඇත්තේ කා විසින් ද යන්න පැහැදිලිව දැන ගත යුතු ය. එම නිසා එය ආරක්ෂා වන පරිදි යවන්නාගේ නම සටහන් විය යුතු ය.

## (4) යවන්නාගේ ලිපිනය

විදුලි පුවත ඉදිරිපත් කරන ආකෘතියේ පිටුපස යවන්නාගේ ලිපිනය ද සටහන් විය යුතු ය.

# 13. විරාම ලක්ෂණ

කතා බහ කරන විට, අදහස් අවධාරණය කිරීම, හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා හඬ උස්පහත් කිරීම, අභිනය උපයෝගී කර ගැනීම වෙනුවට ලේඛනයේදී යොදා ගනු ලබන්නේ විරාම ලක්ෂණයි. ලේඛනයේදී විරාම ලක්ෂණ නිසි ලෙස භාවිත කිරීම ඉතා වැදගත් ය.

මේ බලන්න

ළමයා මළා. ළමයා මළ බව මින් ප්‍රකාශ වේ.

ළමයා මළා? මෙසේ සටහන් වුවහොත් එයින් කිසියම් ප්‍රශ්නයක් ගොඩ නැගේ.

ළමයා මළා! මෙසේ ලියා ඇත්නම් එය පුදුමයට කරුණක් බව හැඟ වේ.

මේ අනුව කිසියම් අදහසක් ලියා දැක්වීමේ දී විරාම ලක්ෂණ ඉතා වැදගත් බව පැහැදිලි වනු ඇත.

මේ වාක්‍ය ද පරීක්ෂා කර බලන්න.

1. විත්තිකරු නිදහස් කරන්න. එපා මරන්න.
2. විත්තිකරු නිදහස් කරන්න එපා. මරන්න.

පළමු වැකියේ දී නිදහස ලබන විත්තිකරු නැවතීමේ තිත නිසා දෙවැනි වැකියේ දී එල්ලුම් ගස් යයි.

බලන්න විරාම ලක්ෂණ කොයි තරම් වැදගත් ද කියා. මේ බලන්න,

1. ඔහු අල්ලාගෙන ආ මසුන් ඉවත දමන්න.
2. ඔහු අල්ලා, ගෙන ආ මසුන් ඉවත දමන්න.

එකම වාක්‍යයේ විරාම ලක්ෂණ නිසා අදහස වෙනස් වේ. මෙයින් පැහැදිලි වන්නේ නිසි තැන විරාම ලකුණ යෙදිය යුතු බවත්, අනවශ්‍ය තැන එය නොයෙදිය යුතු බවත් ය.

මෙම පරිච්ඡේදයෙන් පහත සඳහන් විරාම ලක්ෂණ පිළිබඳව හඳුනා ගනිමු.

### දෙතිත :

* නිදසුන් පිණිස හෝ විස්තර පිණිස කරුණු ඉදිරිපත් කිරීමේ දී දෙතිත යෙදේ.
  නිදසුන : ලද පස් මල් : සුදු අඹ, සමන් කැකුළු, සුන් සහල්, ඊතණ, විලඳ

* ගණිත ප්‍රකාශනයක අනුපාතය යෙදීම සඳහා ද භාවිත වේ.
  3 : 2 අනුපාතයට එම මුදල කොටස් කරන්න.

* සංවාද ලියා දැක්වීමේ දී ද දෙතිත යෙදේ.

* ගුරු හාමුදුරුවෝ : පොඩි නම අභ්‍යාස ලියාගෙන ආවා ද?
  පොඩි නම : එහෙයි

### තිත් පෙළ . . .

* ප්‍රකාශනයක ඌනත්වයක් ඇති බව දැක්වීමේ දී තිත් තුනක් යෙදේ.



ලංකාවේ ඇතැම් පුරාණ ගොඩනැගිලිවල පියගැට පෙළ පාමුල තිබුණු අඩ සඳකට සමාන ගල් පුවරුව . . . නමින් හැඳින්වේ.

* උද්ධෘත පාඨයකින් මුල හෝ මැද හෝ කොටසක් අත් හළ බව දැන්වීමේ දී තිත් තුනක් යෙදේ.
  ''සව්සිරිනි සාරය . . . වෙළුවන නම් වී විහාරය''

* ප්‍රකාශයක හිස් තැන් දැක්වීම සඳහා ද තිත් තුන යෙදේ.
  කොළඹ සිට යාපනයට දුර කිලෝ මීටර් . . . කි.

* අදහසක් අවධාරණය කරණු සඳහා ද තිත් තුන භාවිත වේ.
මහ හඬක් . . . අඳෝනාවක් . . . බිළිඳෙක් . . .

### තිත් හතර . . . .

* උද්ධෘත පාඨයකින් අග කොටස අත් හළ බව දැන්වීමේ දී තිත් හතර යෙදේ.

සව්සිරිනි සාරය
නිරිඳුගෙ බිම්බිසාරය
එපුරෙහි උදාරය . . . .

### ඇල ඉර

විකල්ප ව්‍යවහාර දැක්වීම සඳහා ඇල ඉර භාවිත වේ.

* මේස / තේ හැඳි දෙක බැගින් උදේ / සවස කෑමට පෙර / පසු බොන්න.

* ගරු ස්වාමීන් වහන්ස / මහත්මයාණෙනි / මහත්මියනි.

**ක්‍රියාකාරකම 13.1**

පහත සඳහන් ආරාධනා පත්‍රය සුදුසු විරාම ලකුණු යොදා නැවත ලියන්න.

සුන්දරාගම ශ්‍රී සණානන්ද මහා පිරිවෙනේ
සිංහල සාහිත්‍ය සංගමය
ඔවුන්ගේ වාද කණ්ඩායම සමග
මිනිසා හැඩගැසිය හැක්කේ
ආගමෙන් ද නීතියෙන් ද
යන මැයින්
2014 ජනවාරි 04 වනදා
සවස 0300 0500 දක්වා
සිය පිරිවෙන් ප්‍රධාන ශාලාවේ දී
පැවැත්වෙන සුහද විවාදයට
සහභාගි වන මෙන්

සුන්දරගම මහා විද්‍යාලයේ වාද කණ්ඩායමට
සාදරයෙන් ආරාධනය කෙරෙයි

### ක්‍රියාකාරකම 13.2

පහත සඳහන් විරාම ලකුණු සඳහා උදාහරණ තුන බැගින් ලියන්න.

1. දෙතිත
2. කෙටි ඉර
3. ඇල ඉර

### ක්‍රියාකාරකම 13.3

පහත දැක්වෙන ඡේදය අදාළ විරාම ලකුණු යොදා නැවත ලියන්න.

කිරිහාමි පඳුරු අස්සේ මළාක් මෙන් සිටි එඬේරෙක් කැලෑව මැදින් හරක් දක්කාගෙන එයි කිරිහාමි හරක් රැළ දකියි හරකුන්ගේ කුරෙහි මහත ද අඟෙහි දිග ද හොඳ හැටි පෙනේ හරක් රැළ ළං වන විට කිරිහාමිට තමා මැරුණු බව අමතක වෙයි කිරිහාමි වහා නැගිට එඬේරාට බනින්නට පටන් ගනියි.

| | |
|---|---|
| **කිරිහාමි** | පව්කරයා හරකුන් දක්කන්නේ මළවුන්ගේ ඇඟ උඩින් ද මෙහෙම පව් කළාම යන්නේ කොයි ලෝකෙද |
| **එඬේරා** | මැරුණු කාගේ ඇඟ උඩින් ද මම හරකුන් දැක්කුවේ |
| **කිරිහාමි** | ඇයි මගේ ඇඟ උඩින් නොවැ |
| **එඬේරා** | හහ් හහ් හා මේ කතා කරන්නේ මැරිලා ද |
| **කිරිහාමි** | ඔව් හිසත් පයත් එක හැටි හීතල වුණු දා මැරෙන බව දිවැස් ඇති අපේ හාමුදුරුවෝ කීවා අද වැස්සට තෙමිලා මගෙ හිසත් පයත් එක හැටි හීතල වුණා මම මළා |
| **එඬේරා** | අපොයි මඳූ මම දැනගෙන හිටියේ නැ ඒ වග ඉතින් ඒ ගිය පණ ගෙන්නාගන්න ගුරුකමක් කළේ නැද්ද |

| | |
|---|---|
| **කිරිහාමි** | අනේ නෑ |
| **එඬේරා** | ගිය පණ ගෙන්වා ගන්න කැමති ද |
| **කිරිහාමි** | අනේ ඔව් ඔබ ගුරුකමක් දන්නවා නම් කරන්න පණ තිබෙන තුරා ඔබට මෙහෙ කරනවා |
| **එඬේරා** | හොඳයි මම ඔබට උදව් කරන්නම් මගේ ගුරුකම එතරම් අමාරු එකක් නෙවෙයි මගේ හරකුන් එහෙම ඉඳලා හිටලා මැරෙනවා එතකොට මා උන්ගේ පණ ගෙන්වා ගන්නේ මෙන්න මේ කෙවිටෙන් මම ගුරුකම කරන්නම් මෙතන බිම මුනින් අතට වැතිරෙන්න කිරිහාමි මුනින් අතට බිම දිගාවෙයි |
| **එඬේරා** | හැබැයි පණ එන විට ටිකක් රිදෙයි ඒට බිය වෙන්න එපා හැකි තරම් වෙරෙන් කෙවිටෙන් පහර දෙයි එකයි දෙකයි තුනයි හතරයි පහයි හයයි හතයි |
| **කිරිහාමි** | අයියො ඇති ඇති පණ ආවා පණ ආවා කිරිහාමි කෑගසමින් නැගිටියි. |

කුමාරණතුංග මුනිදාසයන්ගේ
හත්පණ ඇසුරෙනි.

# 14. රසාස්වාදය

''එක් දවසක් අමිත්තතාපා බැමිණිය තොටදී දැක එගම සෙසු බැමිණියෝ කියන්නාහු ''පව් කිළිය, තෝ දත් හුණු නර මහල්ලෙකුට මෙහෙ කෙරෙහි ද? මේ කඩදත් මහල්ලාට තී දුන් තිගේ දෙමව්පියෝ තිට සතුරු වන්හ. තෝ උන්ට අප්‍රියෙහි වන. තෝ පින් නොකළ තැනැත්තියක බඳුයෙහි. තී ගිය ජාතියෙහි කවුඩුවන්ට පිඩු දුන් කල තී ලූ බත් කෑයේ මහලු කවුඩුවෙක් වන. එසේ හෙයින් වෙද තී මේ නර මහල්ලාට අඹු වූයේ. යෙහෙළි මෙසේ වූ ජර හම් මහල්ලා හා එක් ව පඤ්චකාම විෂයෙහි කවර නම් ඇල්මෙක් ද? ඌ කඩදත් දල්වා සෙන වේලෙහි තිට කවර නම් සමාධියක් ද? කිඹුල් පිටක් සේ කොර සැඩි වූ උගේ ශරීරයේ ගැවී කවර අස්වසෙක් ද? සොඳුර තිගේ මොළොක් වූ ශරීරය මිරිකා ඒ බමුණු කණාටුවාට මෙහෙ කොට දුක් නොගෙන තී සේ වූ අභිරූප වූ ළදරු සැමියකු සොයා ගෙනැ'යි කීහ.

(බුත්සරණ)



''දිනක් අමිත්තතාපා බැමිණිය නාන තොටට ගියා ය. එහි ගමේ අනෙකුත් බැමිණියෝ ද පැමිණ සිටිය හ. පව්කාර කෙල්ල, උඹ නාකි බමුණෙකුට මෙහෙවර කරන්නෙහි. මේ නාකි මිනිහට උඹ විවාහ කර දුන් උඹේ අම්මයි, තාත්තයි උඹේ හතුරෝ වගේ. උඹ ඒ දෙමව්පියන්ට ප්‍රිය නැතිව වෙන්න පුළුවන්. උඹ ඉස්සර පින් කරලා නෑ වගේ. ඉස්සර ආත්මයක උඹ දුන්නු දනයක දී උඹේ බත් පිඩු කාලා තියෙන්නේ නාකි කපුටෙක්. ඒක තමයි උඹ දූන් අර නාකි බමුණාට අඹුව වුනේ. අනේ නංගියේ, මේ හම රැලි වැටුණු මහල්ලත් එක්ක එකතුවෙලා පස්කම් සැප විඳින්නේ කොහොම ද? ඒ නාකි

මිනිහා කැඩුණු දත් පෙන්නලා හිනාවෙන කොට උඹට මොනවගේ සතුටක් ද? කිඹුලෙකුගෙ පිටක් වැනි උගේ ගොරහැඩි සිරුර ස්පර්ශයෙන් උඹට මොන විදියෙ සැපක් ද ලැබෙන්නේ. යෙහෙළිය, ඔයාගේ මොළොක් සිරුර වෙහෙස කොට ඒ කණාටු බමුණාට අත්පා මෙහෙවර නොකොට ඔබ වගේ රූමත් තරුණ සැමියෙකු සොයා ගන්න යැයි කීවෝ ය.''

ඉහත දැක්වුණු ඡේද දෙක කියවා බලන්න. එක ම අවස්ථාව ඉදිරිපත් කොට ඇති විලාසය දෙවැදෑරුම් ය. මුල් ඡේදය භාවාත්මක ය. අප සන්තානයෙහි සැඟව ගත් හැඟීම් උද්දීපනය කිරීමට ඒ ඡේදය සමත් වෙයි. ''භාව'' උද්දීපනයෙන් හෙවත් හැඟීම් පුබුදුවාලීමෙන් එය රසයක් බවට පත් වෙයි. රස සමාහිත සිතට එම ඡේදයෙහි දැක්වෙන අවස්ථා නිරූපණයේදී චිත්‍රයක් ලෙසින් මැවී පෙනෙයි. එසේ සිදු වන්නේ ලේඛකයා ඡේදය ඉදිරිපත් කිරීමෙහි දී දැක් වූ කුසලතාව අනුව ය. එසේ මැවෙන දෑ සාහිත්‍යයේ දී වාක් චිත්‍ර - චිත්තජ රූප - මනෝ චිත්‍ර ආදී නම්වලින් හැඳින්වේ.

දෙවන ඡේදය වාර්තාවක ස්වරූපයෙන් ලියවුණකි. එහි ඇත්තේ මුල් ඡේදයේ දැක්වුණු අදහස ම වුවත්, මෙහි දී අනුගමනය කළ භාෂාව, වාග් රීතිය, රචනා විලාසය අනුව පාඨක සිත්හි රසයක් මැවීමට අසමත් වෙයි. එය ප්‍රවෘත්තියක් හෙයින් නැවත කියවා බැලීමේ රුචියක් ඇති නොවෙයි. මෙය ප්‍රවෘත්තියක් හෙයින් එහි ඇත්තේ කිසියම් කාල පරාසයකට අයත් වටිනාකමක් මිස සර්වකාලීන අගයක් නොවේ. මේ නිසා සාහිත්‍යය කාලයේ හෝ දේශයේ හෝ අන්තරයක් නැතිව සර්වකාලීන අගයක් ගනී.

ඉහත දැක්වුණු මුල් ඡේදය 12 වන සියවසේ පොළොන්නරු රාජධානි අවධියේ දී විද්‍යා චක්‍රවර්තීන් විසින් ලියැවුණු බුත්සරණෙන් උපුටා ගත්තකි. අප ජීවත් වන 21 වන සියවසේ දී පවා ආසාවෙන් අපි එය කියවමු. රස විඳිමු.

සාහිත්‍ය නිර්මාණයේ දී සාහිත්‍යකරුවා පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කොට ඇද්දැ'යි විචාරකයා විමසිලිමත් විය යුතු ය.

1. නිර්මාණකරුවාගේ අරමුණ කුමක් වී ද?
2. ඒ අරමුණ සාර්ථක කර ගැනීම සඳහා ඔහු අනුගමනය කළ උපක්‍රම කවරේද? (භාෂාව, උපමා, රූපක, දීපකාදී අලංකාර ඉඟි වැකි, රූඩී . . . .)
3. ඒ උපක්‍රම කොතෙක් දුරට සාර්ථක වී ඇත්ද?

ඉහත දක්වූ නිර්ණායක අනුව සාහිත්‍යය රස විඳීමට උත්සුක විය යුතු ය.

සාහිත්‍යයේ ප්‍රභේද තුනක් වෙයි.

1. ගද්‍ය සාහිත්‍යය
2. පද්‍ය සාහිත්‍යය
3. චම්පූ සාහිත්‍යය (ගද්‍ය හා පද්‍ය මිශ්‍ර කාව්‍ය විශේෂය)

ගද්‍ය සාහිත්‍ය රචනය අතිශය දුෂ්කර වූත් බැරෑරුම් වූත්, කාර්යයක් ලෙස සාහිත්‍ය විචාරවාදීන් විසින් හඳුන්වා ඇත. එහෙයින් පද්‍ය කෘති හා සසඳා බැලීමේ දී ගද්‍ය කාව්‍ය කෘතීන්ගේ සංඛ්‍යාව අල්පය. මෙය කවර සාහිත්‍යයකට වුව ද පොදු ලක්ෂණයක් සේ සැලකිය හැකි ය. සිංහලයේ ක්‍රි:ව: 9 වන සියවසට අයත් යැ'යි සැලකෙන ධම්පියා අටුවා ගැටපදය, සිඛවළඳ හා සිඛවළඳ විනිස ගද්‍ය කාව්‍ය කෘති සේ හඳුනා ගත හැකි නමුදු එවැනි නිගමනයකට පැමිණිය හැක්කේ යම්කිසි, භාෂාවකින් ලියැවුණු සියල්ල ''සාහිත්‍ය'' යන පෘථුලාර්ථයෙන් ගතහොත් පමණි. එසේ නැතහොත් ඒවා ගද්‍ය කාව්‍ය කෘති යන ගණයට අන්තර්ග්‍රහණය කළ හැකි නොවේ.

ඉහත කී ග්‍රන්ථද්වයෙන් එකක් අර්ථ කථන ග්‍රන්ථයක් (ව්‍යාඛ්‍යාන) වන අතර අනෙක භික්ෂූන්ගේ විනය නීති රීති පද්ධතිය දක්වන්නකි. සියබස් ලකර මේ යුගයට අයත් කාව්‍ය විචාර ග්‍රන්ථයකි. එය I වන සේන රජු විසින් දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශය පදනම් කරගෙන ලියන ලද්දකි.

පොළොන්නරු යුගයේ දී, එනම් 12 වන සියවසේ දී ගුරුළුගෝමී, විද්‍යාචක්‍රවර්තී ආදී වියත් ලේඛක පරම්පරාවක් ජීවත් වූහ. ඔවුහු සිය අනන්‍යතාව සඳහා වෙනස් වෙනස් ගද්‍ය රීතීන් නිපදවා ගත්හ. ගුරුළුගෝමීන්ගේ අමාවතුර ප්‍රකට ගද්‍ය කාව්‍යයකි. විද්‍යාචක්‍රවර්තීන්ගේ බුත්සරණ ද එසේ ම ය.

එබඳු ගද්‍ය කාව්‍යවල අපට හමුවන චමත්කාරජනක අවස්ථා හා පුද්ගල වර්ණනා පශ්චාත් කාලීන සාහිත්‍ය කෘතීන්හි විද්‍යමාන වෙතොත් එය ඉතා අල්ප වශයෙනි. මෙයින් අනාවරණය වන්නේ පද්‍ය රචනයට වඩා ගද්‍ය රචනය අසීරු හා බැරෑරුම් කර්තව්‍යයක් වන බවයි.

පද්‍ය වූ කලී පද සතරකින් යුක්ත රිත්මයානුකූල පද සංයෝජනයකි.

''ඇසැ ඇසැ රස          අඳුන්
දකැ දකැ රැසිරු          මුනිඳුන්
මෙතැ සිත තුළ          නොඳුන්
අහෝ ! බල බලව දෙස්          පුහුදුන්''

''ගොඩ ගොඩ ඇට සැකි          ලි
තැන තැන තිබූ බලි බි          ලි
මඟ මඟ රෙදි වැර          ලි
එපුර හැමතැන බලන්          පිළිකුලි''

අපි පියවි ඇසින් දකින්නට අකමැති දේ පවා සාහිත්‍යය මගින් ඉදිරිපත් කෙරෙන විටෙක එය දකින්නට ආශා කරමු. එය සහානුභූතිය යනුවෙන් හැඳින්වේ. කවියා කාව්‍යමය දෘෂ්ටියකින් ඉදිරිපත් කෙරෙන කවර වර්ණනයක් වුවත් පාඨක ලෝකයේ ආස්වාදයට හේතු වේ. මේ නිසා කවියාගේ අත්දැකීමට සමාන අත්දැකීමක් කවියාගේ නිර්මාණයෙන් ලබා ගන්නා තැනැත්තා සහෘද හෙවත් කවියාට සමාන අදහස් හා අනුභූතීන් ලබන්නකු ලෙස සැලකේ.

පෙරදිග පහළ වූ පැරණි ම කාව්‍ය විචාරවාදියා භරතමුනි ය. භරතමුනි නාට්‍ය ශාස්ත්‍රය නම් ස්වකීය කෘතියේදී නව රසයක් පිළිබඳ සඳහන් කරයි. ඔහු සඳහන් කරන නව නාට්‍ය රසය පොදුවේ කවර සාහිත්‍ය අංශයකට වුවත් අදාළ වේ. එම නව නළු රස මෙසේ ය.

''ශෘංගාර හාස්‍ය කරුණා
රෞද්‍ර වීර භායානකඃ
බීභත්සොෳාත්භූත ශාන්තශ් ච
නව නාට්‍ය රසාස්මෘතාඃ'' වශයෙනි.

මේ අනුව කවර ගණයේ කලා මාධ්‍යයක වුවත් මූලික අරමුණ රස නිෂ්පත්තිය බව පෙනේ. කවියා රස නිෂ්පත්තියට අදාළ ලෙස අලංකාර හා වෙනත් කාව්‍යෝපක්‍රම යොදා ගනී. එමගින් රස නිෂ්පත්තිය සිදුවේ යැ'යි අලංකාරවාදීහු පවසති. උපමා ආදී අලංකාර රස නිපදවීම සඳහා ම යොදනු ලැබේ යැ'යි දණ්ඩින් අවධාරණය කරයි. මෙම අලංකාර අතර වැඩි නියෝජනයක් උපමා - රූපක - දීපක ආදී අලංකාරයන්ගෙන් විශේෂයෙන් ම සිදු වේ.

## උපමා අලංකාරය

කිසියම් වස්තුවක් එහි ඇති විශේෂ ලක්ෂණ පිළිබඳ සලකා ඊට සමාන ලක්ෂණ සහිත තවත් වස්තුවකට සමාන කොට දක්වීම උපමා අලංකාරය ලෙස සැලකේ. මෙහි දී මෙන්, සේ, වැනි, වගේ ආදී උපමා සූචක පද භාවිතයට ගනී.

''වලඳින අදහසින් මෙන් සුරගඟ අඟන
නල බල සසල දළ රළ පෙළ නුබ නැගෙන''

''රැගත් සුරා පිරූ විතින්
සුරත් තඹුරු පෙති සෙ නෙතින්
පුවත් නොදන බමන ගතින්
නටත් අයෙක් සුරා මතින්''

## රූපක අලංකාරය

උපමා අලංකාරයේදී භාවිත කළ මෙන්, සේ වැනි වගේ යනා දී උපමා සූචක පද රහිතව ''එය එයමයි'' යන අරුත් ප්‍රකාශ කරනුයේ ''රූපක'' මගිනි. මෙහි දී උපමාලංකාරයේ දී මෙන් වස්තුවක් තවත් වස්තුවකට සමාන කිරීමක් සිදු නොවේ.

| | | |
|---|---|---|
| සඳ වැනි මුහුණ (වත) | = | උපමාවකි |
| සඳවත | = | රූපකයකි |
| නා දළු වැනි තොල් | = | උපමාවකි |
| නාදළු තොල් | = | රූපකයකි |

## දීපක අලංකාරය

කිසියම් පද්‍යයක මුල, මැද, අග යෙදී සියලු තැන එකම අරුතක් ප්‍රකාශ වේ නම්, අරුතකින් ආලෝකවත් කෙරේ නම් එය දීපකාලංකාරයයි.

''ඒ නුවර නිතොර හැසිරෙන වරඟනන් ඇත
ඒ වරඟනන් තුළ රූමත් බව ද ඇත
ඒ රූමත් බවෙහි හැඩහුරුකම් ද ඇත
ඒ හැඩහුරුකමෙහි මල්සර සර ද ඇත''

ඉහත දක්වූ උදහරණයන්ට අනුව අලංකාර යනු කාව්‍ය ශරීරය බබුළුවන්නා වූ ගුණ විශේෂයක් බව පෙනී යයි. 'වචන සංකලනයෙන් නැගෙන ශබ්ද රසය අවස්ථෝචිත රිද්මයක් නගන නමුදු ශබ්ද රසය පමණක් ම හෝ ආකෘතිය පමණක් ම සාර්ථක කාව්‍යයක ලක්‍ෂණ නොවේ. එය අවශ්‍යයෙන් ම අර්ථ රසයෙන් ද පරිපූර්ණ විය යුතු ය. මේ නිගමනය ම අනුව කාව්‍යයෙහි අවශ්‍යතම අංග කවරේදැයි හඳුනා ගැනීමට ඔබට හැකි වෙතැයි විශ්වාස කරමු.

''අංග මංගජ මංගලෙන් වැඩි බිංග මෙන් මුනිපා කමල්     වට
අංග තුංග මතංග ජන්දෙන ඉංගකින් කවි බන්දනන්     හට
අංග වංග කලිංග හිංගුල කොංගනෙන් පැවසූ යසින්     තුට
අංග සංග වළංග වෙන් සිරිසංගබෝ පැරකුම් රජුන්     හට''

(පැරකුම්බා සිරිත)

මෙම පද්‍යයේ ඇත්තේ ශබ්ද රසය පමණි. එය කාව්‍යමය නිබන්ධනයක් සේ පිළිගත නොහැකි ය. මෙහි ඇත්තේ හුදෙක් වචන සංකලනයෙන් නැගෙන රිද්මය පමණි.

''ඕනෑම දෙයක් කඩයේ වැරදුනෙ     නැති
පාලන මිලට කිසිවක් විකිණුවේ     නැති
කළු මුදලාලි මරු ගිලගති ගුණේ     නැති
රූපං ජීරති නාමං න     ජීරති''

පද්‍යයක ආකෘතික ලක්‍ෂණ තිබූ පමණින් එය කාව්‍යයක් නොවේ.

''පැහැ සරණිය මිණි පැමිණිය කොත්     අගට
බඳ කිකිණිය දද ගිහිණිය විමන්     වට
නොව පැරණිය වන රමණිය විටින්     විට
සැළලිහිණිය වදු කැලණිය     පුරවරට''

මෙය මතු පිටින් දෙන අර්ථයට වඩා ගැඹුරු අර්ථයක් කාව්‍ය අභ්‍යන්තරයෙන් ගෙන දෙන්නකි. ''ණිය යන්න නැවත නැවත යෙදීමට කවියා උත්සාහ ගෙන තිබේ. කැලණි පුරවරයේ සෞභාග්‍යය ඉතා සංයමයෙන් හා ව්‍යංග්‍යාර්ථයෙන් සූචනය කිරීමට ගත් ප්‍රයත්නය ප්‍රශංසනීය ය.

මේ අනුව කිසියම් පද්‍ය නිර්මාණයක ශබ්ද රසය ද (ශබ්ද මාධූර්යය) අර්ථ රසය ද (අර්ථ මාධූර්යය) මැනවින් සුසංකලනය විය යුතු බව අපට පෙනී යයි. කිසියම් කලා නිර්මාණයක් සාර්ථක වන්නේ එහි අපූර්වත්වය හෙවත් ප්‍රතිභාව ද ශබ්දාර්ථ රස සංයෝජනය ද මැනවින් එහි අන්තර්ගත වී තිබීමෙන් බව පෙනී යයි.

### ක්‍රියාකාරකම 14.1

පහත සඳහන් පද්‍ය ඛණ්ඩයන් හි එන උපමා, රූපක, පද වෙන වෙන ම තෝරා ලියන්න.

1. ''වඩිමින් සවස නල හැසිරෙන දිගතු වල
සොබමන් සුනිල් මිණි නිල් තුබතුර විපුල
පතසන් අවර ගිරි නැටියෙන් වැටෙන කල
විලිකුන් සුරත් පල වැනි වේ රිවි මඬල''

2. ''ඇදහෙන සිහිල් මඳ නල දිය දහර හෙත
විලඟන බියෙන් දිලි නිලුපුල් ඇස් වසත
අසුවන සළෙලුවන් මෙන් පරඟනන් වෙත
හැකිළෙන පියුම් තුළ බඹරුන් වැස බැඳෙත''

### ක්‍රියාකාරකම 14.2

පහත සඳහන් පද්‍ය කුමන අලංකාර ගණයට අයත් ද? ඒ සඳහා ඔබ දක්වන හේතු මොනවා ද?

1. ''කෙළිමින් තැන තැන ලන්දු
දෙන මෙන් තන අම බින්දු
කියමින් සොඳ ගී සින්දු
ඇසුවන් සිත දුක් බින්දු''

2. ''ලොව විහිද සුදු පැහැ සඳ රැසෙව් සැදී
දෙන නොමඳ සිරි සගමොක් සැප නිසැදී
ලද මුනිඳු දම් කඳ පහස මන බැඳී
වඳු දළඳා හිමි තෙමහල් පහය රැඳී''

**ක්‍රියාකාරකම 14.3**

පහත සඳහන් පද්‍ය පන්තිය ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

### වෙසක් මිහිර

මොනවද අම්මේ අකුරු ජාතියක්
මල් පෙතිවල කව්දෝ ලියලා
කවුරු ද අම්මේ මේව ලියන්නේ
පාට පාට ඉරි හැඩ ගහලා

පුතා දන්නෙ නෑ හඳ ඇති කාලෙට
වනන්තරේ හරි වැඩ කෙරෙති
බෝසත්වරු බණ කතා කියද්දී
වන දෙවඟනො මල්වල ලියති

මේ වගෙ ලස්සන පාට අපට නෑ
කොතනින් මේවා ගෙන එන්නේ
කොහොමද අම්මේ මේව කියන්නේ?
මට නැහැ මොකවත් තේරෙන්නේ

ඉර පායන කොට ඉර බැස යන කොට
පාට වලාකුළු ඇත අහ සේ
ඒවායින් මේ මල් පැහැ ගැන්වෙයි
ඒව කෙරෙන්නේ හොර රහ සේ

අම්මේ අම්මේ අර පුංචි කුරුල්ලෝ
කිචි බිචි ගා මොනවද කියති
උන් දන්නව ඇති මේ මල්වල ඇති
පුංචි අකුරු නිතරම බලතී

ඔව් මගේ සුකිරි පුංචි පුතේ ඔව්
කුරුලු ගීතවල රස මතු වේ
එක එක තාලෙට කියන කියන ගී
මල් කොළවල තව තව ලිය වේ

බිම බැලුවත් මල් උඩ බැලුවත් මල්
පුංචි කුරුල්ලන් ඉගිළෙන වා
සැමදාම ඇයි මෙහෙම ට නැත්තේ?
මල් ද කුරුල්ලන් කොහි යන වා

බුදු හාමුදුරුවෝ ඉපදුන කාලෙට
කවදත් ඔහොමයි පුතුනි මගේ
මිනිසුන් වාගෙම සත්තුන් වාගෙම
ගහ කොළවලටත් සතුට නැගේ

අම්මේ අර අප සාදු කියන කොට
බුදු හාමුදුරුවෝ මල් දැකලා
දුටුවද ටික ටික හිනැහෙන ලස්සන
ඉස්සර කිව් බණ මතක් වෙලා

(ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ)

1. ඉහත පද්‍ය පන්තියේ කාව්‍ය නායකයා හා නායිකාව කවුද?

2. ''උන් දන්නව ඇති මේ මල්වල ඇති
 පුංචි අකුරු නිතරම බලතී''
 යන්නෙන් අර්ථවත් කෙරෙන්නේ කුමක් ද?

3. මෙම පද්‍ය පන්තියේ කියවෙන ආකාරයට හඳ ඇති කාලෙට වනන්තරේ සිදු වන විශේෂත්වය කුමක් ද?

4. මෙම පද්‍ය පන්තිය පෙන්වා දෙන ආකාරයට මල් පාට ගැන්වෙන්නේ කෙසේ ද?

5. ඉහත පද්‍ය පන්තිය රසවින්දනය කරන්න.